ඉදිකිරීම් ආයතනයක වැඩ කිරීමට වැල්ඩින්කරුවන් සහ අත්උදව්කරුවන් අවශ්‍යයි. නැවතීමේ පහසුකම් දිනපතා/ වියදම් මුදල් (කොළඹ). 0778102657, 0776432768 L282069-4

ටයර් වැඩ කිරීමට අය අවශ්‍යයි. වැඩි වැටුප්. 0777743612. L289284-3

පුහුණු නුපුහුණු වෙල්ඩිං කාර්මිකයින් චන්ද්‍රා ඉංජිනියර්ස්, 13/C, පාගොඩ පාර, නුගේගොඩ. 0714848354. L289733-1

යකඩ වහලවල් සෑදීමට සඳහා උඩවැඩ කිරීමට දක්ෂ වෑල්ඩින් බාස්වරු ගෝලයන් අවශ්‍යව ඇත. වැඩ අනුව පඩියද තීරණය කෙරේ දවල් කෑම නොමිලේ. 0723129696. L289858-1

අලෙවිකරුවන්

බෙදා හැරීමේ ආයතනයට සේවකයින් අවශ්‍යයි. 30,000/- මාකොල අවට විශේෂයි. 0715837351, 0702589863 L284105-4

වතුවැඩ

කුකුළු ගොවිපළකට පවුල් අවශ්‍යයි. කුලියාපිටිය. 0778065800. L289138-3

පොල් ගස් සහ වල් කැපීමට දක්ෂ කෙනෙක් අවශ්‍යයි. නවාතැන් පහසුකම් ඇත. 0771618813 L289622-2

රැකියා අවස්ථා. පල්ලම අක්කර 50ක පොල් වත්තකට වයස අවුරුදු 50ට අඩු කම්කරුවන් (පිරිමි) අවශ්‍යව ඇත. මාසික වැටුප රුපියල් 35,000/- නවාතැන් පහසුකම් සපයනු ලැබේ. 0777632672 අමතන්න. L289681-1

ආරක්ෂක සේවා

00 ඒකල, කොටුගොඩ ගබඩා කාර්යාල සඳහා OIC - 1300, SSO - 1200, CSO - 1100 - 1200 (පැය 12 සේවා මුරයන් සඳහා පමණි) EPF + ETF ණය පහසුකම්, සුභසාධක, අතිකාල පැයකට රු. 150/- සිට රු. 175/- උප්පැන්න, ග්‍රාමසේවා, අධ්‍යාපන මුල් පිටපත් සමඟ පැමිණෙන්න. 0763035656, 0763075656. L287406-3

00 ජාඇල, කඳාන, පෑලියගොඩ, කැළණිය, හුණුපිටිය, සපුගස්කන්ද හෙයියන්තුඩුව, හෝමාගම, කඩුවෙල, මාලබේ යන ප්‍රදේශයන් සඳහා ආරක්ෂක නිලධාරීන් වහාම බඳවා ගැනේ. වැටුප SSO - 1000 සිට 1300 දක්වා LSO 1000 සිට 1200 දක්වා EPF, ETF, ණය සහන පහසුකම්, සුභසාධක, රක්ෂණ පහසුකම් සහ ආහාර නවාතැන් සහන මිලට. 0763035656, 0763055656. L286553-3

0717090055 ආරක්ෂක නිලධාරීන් නිලධාරිනීන් පුරප්පාඩු : 0717090048 කොළඹ, 0717002818 බියගම, කැලණිය, 0712615781 වත්තල, ඒකල කොටුගොඩ, මීගමුව. වැටුප රු. 75,000/-. L289566-2

VO - Marketing Manager OIC 1200 SSO JSO LSO වත්තල ජාඇල සීදුව ගම්පහ ඉහළම වැටුප්. 0776142760. L289546-2

ආරක්ෂක ඇබෑර්තු ගම්පහ, ඒකල, අනුරාධපුර, වවුනියා, දෙහිවල, මොරටුව, වරකාපොල, දඹුල්ල, තිස්සමහාරාම, බොරැල්ල, නාරාහේන්පිට විමසීම්. 0761353914. L289599-2

ආහාර අපනයන ආයතනයක් සඳහා දිවුලපිටිය, වේයන්ගොඩ, මිනුවන්ගොඩ අවටින් සියලු ආරක්ෂක නිළධාරීන් කඩිනමින් බඳවා ගැනේ. දීමනා සහිත ඉහල වැටුප්. නවාතැන් නොමිලේ. ආහාර නොමිලේ/ සහනදායී මිලට 0703505069, 0753227201, 0112245506. L289123-4

ඉංගිරිය පේරුවදණ්ඩ අවටින් පළපුරුදු ආරක්ෂක නිළධාරීන් වහාම අවශ්‍යයි. සේවා මුරයකට රු. 1000/- 0771100264, 0711935538 L289578-2

කොළඹ පිහිටි ප්‍රධාන පෙළේ ආරක්ෂක සේවා සමාගමකට රාජගිරිය, කළුතර, පාදුක්ක, කොළඹ වරාය, ගල්කිස්ස, බත්තරමුල්ල, ගම්පහ ප්‍රදේශයන් සඳහා දිවයිනේ සියළු ප්‍රදේශවලින් නිළධාරීන් බඳවා ගැනේ. සංචාරක නිළධාරී (VO), ස්ථාන භාර නිළධාරී (OIC), කණිෂ්ඨ ආරක්ෂක නිළධාරී (JSO), ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිළධාරී (SSO), කාන්තා ආරක්ෂක නිළධාරිණී (LSO). විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිළධාරීන් විශේෂයි. වැටුප රු. 45000ත් රු: 60,000ත අතර. EPF, ETF, ජීවිත රක්ෂණ, වෙනත් පහසුකම්. දු. ක. 0767415781, 0772555586. L285535-2

ගෞරවාන්විත/ විශ්වාසනීය රැකියා අවස්ථාවක් VO - 67,500/- (දීමනා සහිතව). පැය 12 සේවා මුරයකට OIC - 1,100/-, JSO/ LSO 1,000/- සිට ඉහළට හොරණ, වත්තල, සීදුව, බොරලැස්ගමුව, හෝමාගම, රත්මලාන, ගොඩගම, හලාවත, මාරවිල, වෙන්නප්පුව, ජාඇල (කුරණ), වැලිගම්පිටිය (කුරණ), පුහුණු/ නුපුහුණු ආරක්ෂක නිලධාරීන් බඳවා ගැනේ. නවාතැන්/ ආහාර සහනදායී මිලට. ග්‍රාමසේවා/ උප්පැන්න සහතිකය/ ජාතික හැඳුනුම්පත හා බැංකු පොතේ පිටපතක් සමඟ පැමිණෙන්න. EPF/ රක්ෂණාවරණ, මරණාධාර, අනෙකුත් සුභසාධන විමසීම් : 0715-340359, 0715-340358. L289550-2

නාත්තණ්ඩිය පිහිටි අපනයන කර්මාන්තශාලාවක් සඳහා OIC, SO කඩිනමින් බඳවා ගැනේ. ඉහල වැටුප්. ඊගල් ආරක්ෂක සේවය. 0703909090, 0773509778, 0112245506 L289524-3

පමුණුව මහරගම නගරයේ වෙළෙඳ ආයතනයක් සඳහා ආරක්ෂක නිලධාරීන් (SSO වරුන්) කඩිනමින් අවශ්‍යකර තිබේ. මහරගම, පන්නිපිටිය, පමුණුව අවටින් විශේෂයි. වැටුප (රු. 1100) නවාතැන් සමඟ. විමසීම්: 0777910637, 0778464725 L289815-1

රාජගිරියේ පිහිටි කාර්යාලයක් සඳහා ආරක්ෂක නිළධාරීන් කඩිනමින් බඳවා ගැනේ. ඉහළ වැටුප්. නවාතැන් නොමිලේ. ආහාර නොමිලේ/ සහනදායී මිලට. ඊගල් ආරක්ෂක සේවය. 0703909090, 0773509778, 0112245506 L289124-4

වත්තල පිහිටි රජයේ වැඩබිමක් සඳහා ආරක්ෂක නිළධාරීන් කඩිනමින් බඳවා ගැනේ. ඊගල් ආරක්ෂක සේවය 0703909090, 0773509778, 0112245506 L289521-3

වසා තිබෙන බංගලා ගබඩා එකම ස්ථානයක නැවතී ආහාර සපයාගත හැක. 46/50 අතර වැටුපක් වියදම් මුදල් සැපයේ. සහතිකපත් සමඟ ඉක්මනින් අවශ්‍යයි. 0774343989, 0772726870 L289763-1

විවිධ

0 0701210701 ටොෆි, චොකලට්, අත්මේස් හා වෙනත් සමාගමේ සඳහා බඳවා ගැනීම් 17/55 ගැ/පි ආහාර නවාතැන් සමග 45,000/- අවශ්‍යනම් දින සති වැටුප්. 0701220701 L289579-2

0703566887, 0703566222 පවිත්‍රතා පුරප්පාඩු: පෞද්ගලික ආයතන, රෝහල් සඳහා නුගේගොඩ, මොරටුව, හොරණ, පන්නිපිටිය, විජේරාම, හෝකන්දර, අතුරුගිරිය, රාජගිරිය, බම්බලපිටිය, කඳන, මහර, කිරිබත්ගොඩ. වැටුප රු. 25,000/- සිට ඉහළට. L289486-3

MELSTA රෝහල සඳහා සනීපාරක්ෂක සේවක සේවිකාවන් අවශ



පොහොර

සුව සහනය පතා කටයුතු කරන — තැන
බාධක වැට කඩුලු බොහොමයි පෙරට — එන
පසුබට නොවී ඉන් යොමුකර තියුණු — මන
විමසා බලමු ඇති ගැටලුව පොහොර — ගැන

හොණ්ඩර ගනන් හැකි අය සඟවන — වාලු
වැඩි මිල මුදල් වලටත් විකිනෙන — වාලු
මෙම දින වලදී එපුවත් මතු වෙන — වාලු
අසරණ වී ගොවිය සුසුමන් ලන — වාලු

නිල දැරුවනේ ඇති බුද්ධිය රැඳුන — හිස
වංචාවන් වෙතට හරවා ඔබගෙ — ඇස
එළියට රැගෙන සැඟ වූ සැම බෙදනු — මිස
වෙන පිළිතුරක් නැත නොකොළොත් නැගෙති — දෙස

ලොකු සම්පතකි ගොවියගෙ කුඹුරුද — හේන
මිණි කිරුළක්ය අස්වනු එතුළින් — ගේන
දීමෙන් ඔවුන්හට සියලුම වර — දන
නවතාලමු පොහොර රෝ බිය දුක — ගේන

බසිමින් වීදියට එක් වී හඬින් — හඬා
සිටියට පලක් වෙද ලැබෙනව පමණි — විඩා
වස විෂ යොදා ලාභය ලබනවට — වඩා
රැක ගත හොත් යෙහෙකි දරු මුනුපුරන් — කුඩා

කුණු රොඩු එකතු කර ඇති හැම ගෙවතු — වල
රඳවා තැබුව පසු සැකසූ බඳුන — තුළ
ගුණයෙන් වැඩි පොහොර එතුළින් ලැබෙන — කල
අපටම දැනෙනු ඇත වියදම් කරපු — මිල

මේ අයුරින් පිළිවෙළ වූ පොහොර — වෙත
බලනා විටදි යොමු කරමින් අපගෙ — සිත
වස විෂ නසා රෝ දුක දුරු කරන — සෙත
අත් කර ගත් ගොවි මහතුන් එමට — ඇත

රට තුළ කැළි කසළ කඳු ගොඩ — ගැසෙන්නට
ඉඩ කඩ නොතබමින් ඉන් පල — ලබන්නට
හුරුවන දිනක මේ අයුරින් — සිතන්නට
හැකි වෙයි දැයට සුව සම්පත — ගෙනෙන්නට

චන්ද්‍රසේන ජයකොඩි
දිද්ද, ගැටහැත්ත.

ඔබේ නිර්මාණ සබරගමුව කවි මඩුව "ලංකාදීප" කර්තෘ මණ්ඩලය, අංක 8, හුණුපිටිය හරස් පාර, කොළඹ 02. ලිපිනයට යොමු කරන්න.

අම්පාර පොහොර රැස්වීමේ කාබනික පොහොර කතාවක් එළියට

නිලධාරීන් මොන කතා කීවත් කාබනික පොහොර හදන්න මේ මිහිපිට කිසිම වැඩපිළිවෙළක් නෑ

(දීගාමඩුල්ල විශේෂ ඩී. ශ්‍රේණිසිරි හෙට්ටිආරච්චිගේ සහ හිඟුරාන නවරත්න සමරතුංග)

කාබනික පොහොර නිෂ්පාදනය සම්බන්ධයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ සමහර නිලධාරීන් කරන ප්‍රකාශ පිළිබඳව තමන් පෞද්ගලිකව සොයා බැලූ බවත් ඔවුන් ප්‍රකාශ කරන ආකාරයට පොහොර නිෂ්පාදනය කිරීමට වැඩ සටහනක් මේ මහ පොළොව තුළ මෙතෙක් නිර්මාණය වී නොමැති බවත් දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඩබ්ලිව්.ඩී. වීරසිංහ මහතා පැවසීය.

ඒ මහතා එසේ පැවසුවේ. නැගෙනහිර පළාත තුළ එළඹෙන මහ කන්නයේ දී කාබනික පොහොර යොදා වී වගා කටයුතු සිදුකිරීමට අවශ්‍ය කටයුතු සූදනම් කිරීම සඳහා රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉලක්කගත පොහොර නිෂ්පාදන ව්‍යාපෘති සම්බන්ධයෙන් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ පැවති සාකච්ඡාවකදී, මහවැලි කලාපය භාර සේවාසික ඉංජිනේරුවරයා සිදුකළ ප්‍රකාශයකට පිළිතුරු වශයෙනි.

පුළුවන් අය ලවා කරගන්නම්: බැරි අය ඉවත්වෙන්න

කෘෂි රාජ්‍ය ඇමැති

මන්ත්‍රී ඩබ්ලිව්.ඩී. වීරසිංහ

සාකච්ඡාවේ අවස්ථා. (ඡායාරූප: හිඟුරාන නවරත්න සමරතුංග)

වැඩිදුරටත් අදහස් දැක්වූ වීරසිංහ මහතා මෙසේද කීය. මහවැලි නිලධාරීන් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා කිසිදු සහායක් ලබා නොදෙන බවත්, සමහර නිලධාරීන් කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට උත්සාහ ගන්නා ගොවි මහතුන් අධෛර්ය කිරීමට කටයුතු කරන බවත් අවසානයේ සිදුවන්නේ කාබනික පොහොර භාවිතා කර මහ කන්නය සඳහා වී වගාව ආරම්භ කර රජය ගෙනයන වැඩපිළිවෙළ අසාර්ථකවීම සහ ඒ තුළින් දේශපාලන අධිකාරිය වශයෙන් තමන් ද අපහසුතාවට පත්වීම බවත්, එනිසා කාබනික පොහොර යොදා වගා කිරීම ආරම්භ කරන්නේ නම් ඒ සඳහා අවශ්‍ය වන කාබනික පොහොර ප්‍රමාණය වහාම ප්‍රදේශයේ ගබඩා කිරීමට පියවර ගන්නා ලෙසත් ඉල්ලා සිටියේය.

මෙහිදී නිලධාරීන් අමතමින් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා පැවසුවේ මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි නිලධාරීන් සිටී නම් ඔවුන්ට ඉවත්ව යා හැකි බවත් අවශ්‍ය සුදුසුකම් සහිත වෙනත් නිලධාරීන් යොදවා ඉදිරි කටයුතු කිරීමට හැකියාවක් පවතින බවත්ය.

මේ සාකච්ඡාව සඳහා දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී තිලක් රාජපක්ෂ, නැගෙනහිර ආණ්ඩුකාර අනුරාධා යහම්පත්, අම්පාර දිස්ත්‍රික් ලේකම් ඩී.එම්.එල්. බණ්ඩාරනායක යන මහත්ම මහත්මීන් සමග වාරිමාර්ග සහ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, මහවැලි සී කලාපයට අයත් නිලධාරීන්, පොහොර සංස්ථා නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීහු පිරිසක් සහභාගි වී සිටියහ.

බදුල්ලේ පාරිභෝගිකයෝ සීනි හිඟයට විසඳුම් ඉල්ලති

(බදුල්ල විශේෂ පියල් කිත්සිරි)

වෙළෙඳ පොළේ පවතින සීනි හිඟයට වහා විසඳුම් ලබා දීමට මැදිහත් වන්නැයි බදුල්ලේ පාරිභෝගිකයෝ අදළ වගකිවයුතු අංශවලින් ඉල්ලති.

දැනට දින තුනක පමණ සිට හදිසියේ මතුව ඇති සීනි හිඟය නිසා තමන් දැඩි දුෂ්කරතා තත්ත්වයට පත්ව ඇතැයි පෙන්වා දෙන පාරිභෝගිකයෝ බදුල්ල නගරයේ මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල වෙළෙඳසැල්වල සීනි මිලදී ගැනීමට නැතැයි චෝදනා කරති.

රුපියල් එකසිය හතළිහකට තිබූ දුඹුරු සීනි කිලෝවක් රුපියල් එකසිය හැටපහක් වැනි ඉහළ මිළකට ඇතැම් වෙළෙඳසැල්වල අලෙවි කරන අයුරු දක්නට ලැබෙන අතර සුදු සීනි කිලෝවක් රුපියල් අනූනමයක් වැනි මිලකට සතොස මගින් අලෙවි කළ නමුත් මේ වන විට එහි සීනි අලෙවියට නැතැයි පාරිභෝගිකයෝ ප්‍රකාශ කරති.

මේ පිළිබඳව කළ විමසීමේදී බදුල්ල නගරයේ වෙළෙඳුන් කිහිප දෙනකු ප්‍රකාශ කළේ තොග සැපයුම්කරුවන් සීනි බෙදා හැරීම නතර කිරීම මෙම හිඟයට හේතුවී ඇති බවයි.

ගහෙන් වැටී පිහියට ගෙල කැපී සයදරු පියා මරුට

(බිබිල විශේෂ කේෂර ගුණතිලක)

ගෙවත්තේ ගසක අතුකපමින් සිටි හැත්තෑ දෙහැවිරිදි පුද්ගලයෙකු ගසින් වැටී අතු කපමින් සිටි පිහියෙන් ගෙල කැපී ඉකුත් 14 වැනිද මියගොස් ඇතැයි මැදගම පොලීසිය පවසයි.

මෙලෙස මියගොස් ඇත්තේ බකිනිගහවෙල, රත්තනදෙනිය, අරාටුවත්ත පදිංචි ආර්.එම්. සිරිසේන නමැති සයදරු පියෙකි.

හෙතෙම ගෙවත්තේ කැටකෑරල ගසක අතු කපමින් සිටියදී බිමට වැටී ඇති අතර අතේ තිබූ පිහිය ගෙලේ වැදී තුවාල සිදුවී ඇත.

ඔහු මොනරාගල දිස්ත්‍රික් මහා රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත. මැදගම පොලීසියේ පොලිස් ස්ථානාධිපති ප්‍රභාත් දිසානායක මහතා සිද්ධිය පිළිබඳව පරීක්ෂණ පවත්වයි.

ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා ගුණ සමරුවේදී...

දිවංගත ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මහතාගේ 42 වැනි ගුණ සමරුව ඉකුත් 14 වැනිද රුවන්වැල්ල ඇන්.ඇම්. පෙරේරා අනුස්මරණ ශාලා පරිශ්‍රයේ පිහිටි ඇන්.එම්. පෙරේරා මහතාගේ පිළිරුව අභියසදී පැවැත්විණි.

එහිදී පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීම හිටපු කෘෂිකර්ම නියෝජ්‍ය ඇමැති වයි.ජී. පද්මසිරි මහතාගේ මූලිකත්වයෙන් සිදුවිය. අනතුරුව මොරාවත්ත වැඩිහිටි නිවාසයේ නේවාසිකයන්ට දිවා ආහාර පිරිනමා පෙරේරා මහතාට පින් පැමිණවීමද සිදුකරන ලදී.

තුන්කෝරල ඇන්.ඇම්. පෙරේරා අනුස්මරණ පදනම ගුණ සමරුව සංවිධානය කර තිබූ අතර ඊට සමසමාජ පක්ෂ ක්‍රියාකාරීන් ඇතුළු සම්භාවනීය පිරිසක්ද සහභාගි වූහ.

(රුවන්වැල්ල - විමලරත්න සමරක්කොඩි)

ඇල්ලේ පේෂකර්මය විවෘත කරයි

ඌව පළාත් කර්මාන්ත අමාත්‍යාංශය මගින් වැලිමඩ ඇල්ල ප්‍රදේශයේ ඉදිකරන ලද පේෂකර්ම නිෂ්පාදන හා පුහුණු ආයතනය පසුගියදා ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ.ජේ.එම්. මුසම්මිල් මහතාගේ විසින් විවෘත කරන ලදී.

මෙම ආයතනය මගින් ප්‍රදේශයේ තරුණියන්ට රෙදි විවීම පිළිබඳව පුහුණුවක් ලබාදී අවශ්‍ය මැෂින් නිවෙස්වලට ලබාදීමට කටයුතු කරන අතර ඔවුන්ගේ නිෂ්පාදන ඌව පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුව මගින් මිලදී ගැනීමට නියමිතය.

පේෂකර්ම නිෂ්පාදනය සහ පුහුණු කිරීමේ ආයතනය විවෘත කිරීමේ අවස්ථාවට අමාත්‍යාංශ ලේකම් නිහාල් ගුණරත්න මහතා ද සහභාගී විය.

(බිබිල විශේෂ කේෂර ගුණතිලක)

තණමල්විල පිරිවෙන් දෙකකට මූල්‍යාධාර

(බිබිල විශේෂ කේෂර ගුණතිලක)

තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි බෝදගම විද්‍යාලෝක මූලික පිරිවෙනට සහ හම්බේගමුව මූලමහා විහාර මූලික පිරිවෙනට පන්ති කාමර ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා දහම් පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් කටයුතු පිළිබඳව රාජ්‍ය අමාත්‍යාංශය මඟින් මූල්‍ය ආධාර ලබා දී ඇත.

ඒ අනුව බෝදගම විද්‍යාලෝක මූලික පිරිවෙනට රුපියල් දහතව ලක්ෂ අනූතුන්දහස් එකසියහැට එකක්ද හම්බේගමුව මූලමහා විහාර මූලික පිරිවෙනට රුපියල් දස ලක්ෂ අනූපන් දහසක් ද අධ්‍යාපන රාජ්‍ය ඇමති විජිත බේරුගොඩ මහතා විසින් පිරිනමන ලදී.

මීට අමතරව තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිරිවෙන්වල ඉගෙනුම ලබන භික්ෂූන්ට සහ ගිහි ශිෂ්‍යයන්ට පාවහන් පරිත්‍යාග කිරීම ද සිදු කෙරිණි.

මෙම අවස්ථාවට ඌව පළාත් සභාවේ හිටපු උප සභාපති විමල්ගලගම ආරච්චි මහතා ද සහභාගී විය.

කොටගම ගොවිජනයේ කාබනික පොහොර හදන්න කියාදෙයි

(බිබිල - ජිනපාල දිසානායක)

කාබනික පොහොර භාවිතයට ගොවීන් හුරු කිරීම මගින් බොහෝ වාසි ගොවියාට අත්වනවා. වස-විස නැති කෘෂි භෝග පරිභෝජනයට ගැනීම තුළින් පාරිභෝගිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් වෙනවා. එමෙන්ම කාබනික පොහොර කෘෂි කර්මාන්තයට යොදා ගැනීම තුළින් ගොවියන්ගේ වියදම අඩුවනවා. තම ගෙවත්තේ ඉවත ලන දෑ යොදා කාබනික පොහොර නිෂ්පාදනය කිරීම මගින් ගෙවත්ත පිරිසිදු වී, සෞඛ්‍ය ආරක්ෂිත පරිසරයක් නිර්මාණය වන අතරම ගොවියාගේ ආර්ථිකය ශක්තිමත් වනවා යැයි ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ අයේෂා ගුණවර්ධන මහත්මිය පැවැසුවාය.

කාබනික පොහොර නිෂ්පාදනය කරන අයුරු පිළිබඳ ගොවීන්ට ප්‍රායෝගිකව පුහුණුව ලබා දුන් අයුරු.

බිබිල-කොටගම-ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ප්‍රායෝගික වැඩමුළුවේ දී ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරිය එලෙස ප්‍රකාශ කළාය.

කෘෂිකර්ම අමාත්‍යවරයා සුපෝෂිත කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ඌව පළාතට රුපියල් මිලියන 100 ක් වෙන් කළ බවත්, අනාගතයේ දී කාබනික පොහොර භාවිතයට ගොවීන් යොමුකරන බවත්, කාබනික පොහොරවල නයිට්‍රජන් ප්‍රතිශතය 01% ක් පමණ වන බවත්, එම ප්‍රතිශතය 05% දක්වා ඉහළ දක්වා ඉහළ දැමීමට විදේශ රටවලින් ඇමයිනෝ අම්ල ගෙන්වා ගොවීන්ට කාබනික පොහොරවලට මිශ්‍ර කිරීමට ලබා දෙන බවත් අයේෂා ගුණවර්ධන මහත්මිය එහිදී ගොවීන් අමතා ප්‍රකාශ කළාය.

සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව 'හරිත රටක් - වස විෂ නැති හෙටක්' තේමාව යටතේ දීප ව්‍යාප්තව 'මෙම සුපෝෂිත කොම්පෝස්ට් නිෂ්පාදනය සිදුකරන බව ද ඇය සඳහන් කළාය.

මෙම අවස්ථාවට බිබිල සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ආර්.ටී.ඩබ්. ප්‍රසංගි, කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතාගේ සම්බන්ධීකරණ ලේකම් සුමේධ බණ්ඩාර කොටගම ගොවිජන සේවා නිලධාරී සුනිල් දෙඩම්පේ මහත්ම මහත්මීහු කෘෂිකර්ම උපදේශකවරු කෘෂි පර්යේෂණ නිලධාරීන්, බිබිල ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රියානන්ද මහතා, ගොවි සංවිධාන නිලධාරීන් හා කාබනික පොහොර නිෂ්පාදනයට බලාපොරොත්තු වන ගොවීහු ඇතුළු පිරිසක් සෞඛ්‍ය නීති පිළිපදිමින් සහභාගී වූහ.

තෙලුල්ලේ භික්ෂූන් තිස්නමකට වියළි ආහාර පිරිනමයි



දම් සවිය ජාත්‍යන්තර පදනම "බොදු උදන" ව්‍යාපෘතිය. මොනරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් සිරි තෙලුල්ල ජනපදය හුරත්ගමුව ශ්‍රී බෝධිරුක්ඛාරාම පිරිවෙනෙහි වැඩ වාසය කරන භික්ෂූන් වහන්සේලා තිස් නමක් වෙනුවෙන් වියළි සලාක සහ සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ, පරිවේණාධිපති, ඌව පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක සද්ධර්ම කීර්ති ශ්‍රී දෙනගම ඥානරතනනිධාන ඇතිලිවැව නිම රතන නායක ස්ථවිරයන්වහන්සේ හට දම් සවිය ජාත්‍යන්තර පදනමේ ගරු සභාපති බී.ටී.එස්. ගුණතිලක මහතා විසින් පූජා කරන ලදී.

එම අවස්ථාව සඳහා දම් සවිය ජාත්‍යන්තර පදනමෙහි මොනරාගල දිස්ත්‍රික් සංවිධායිකා ස්වර්ණලතා මල්කාන්ති මෙනවිය ද සහභාගි වූවාය.

මදුරන්කුඩා කළපුවක කසිප්පු පොළක්

(ත්‍රිකුණාමලය - අමදෝරු අමරජීව)

කුච්චවේලි පොලිස් වසමට අයත් මධුරන්කුඩා කළපුවේ සිට පවත්වාගෙන ගිය නීතිවිරෝධී මත්පැන් පොළක් වටලා දෙදෙනෙකු අත්අඩංගුවට ගත් බව පොලිසිය කියයි.

කුච්චවේලි පොලිසියට ලද තොරතුරක් අනුව ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කේ.එච්. ලලිත් කුමාර මහතා ඇතුළු පොලිස් කණ්ඩායමක් එක්ව කළ මෙම වැටලීමේ දී ගෝඩා මිලි ලීටර් 171,000 ක් කසිප්පු මිලිලීටර් 11250 ක් සමග පෙරුම් උපකරණ හා බැරල් නවයක් මෙලෙස අත්අඩංගුවට ගනු ලැබීය. අත්අඩංගුවට ගත් සැකකරුවන් කුච්චවේලි අවට පදිංචිකරුවන් වන අතර මොවුන් කුච්චවේලි සංචාරක මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. කුච්චවේලි පොලිසිය මේ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ පවත්වා ගෙන යයි.

අත්අඩංගුවට ගත් කසිප්පු හා ගෝඩා බැරල්

ලයිසන් නැතිව ගිනි අවියක් තියාගෙන කොටු

(රත්නපුර අධිකරණ ව.පී. වික්‍රමසිංහ)

විදේශීය රටක නිෂ්පාදිත බෝර 12 ගිනි අවියක් බලපත්‍ර රහිතව සන්තකයේ තබාගෙන සිටි පුද්ගලයෙකු අත්අඩංගුවට ගත් බව රත්නපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශ පවසයි.

රත්නපුර ඇළපාත ප්‍රදේශයේ නිවසක පුද්ගලයෙකු බලපත්‍ර රහිතව තම සන්තකයේ තබාගෙන සිටි බෝර 12 ගිනි අවිය සමග අත්අඩංගුවට ගත් අතර සැකකරු රත්නපුර අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

රත්නපුර කොට්ඨාස පොලිස් අධිකාරි සේනක වීරසිංහ මහතාගේ නියෝග උපදෙස් මත කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ ස්ථානාධිපති ප්‍ර. පො.ප. විජේසේකර මහතාගේ මෙහෙයවීමෙන් උ.ප.පො. හේමන්ත ද සිල්වා, පො.සැ. කපිල (10782), පො. කො. කැලුම් (68050), පො. කො. අශෝක (82806) යන නිලධාරීහු සැකකරු අත්අඩංගුවට ගත්හ.

මේ ලංකාදීප තාරුණ්‍යයේ පිටුවයි

නවරැල්ලට ඔබේ නිර්මාණ විද්‍යුත් ලිපිනය හරහාද එවිය හැකිය.
විද්‍යුත් ලිපිනය - nawarallawnl@gmail.com



විදෙස් නාට්‍ය ආක්‍රමණය කළ අපේ සොඳුරු ටෙලි කතා



ශ්‍රී ලංකාවේ ටෙලිනාට්‍ය කලාවේ උපත දිමුතු මුතු නම් සොඳුරු වූ ටෙලි කතාවකින් සිදුවූ බව අපගේ මතකයේ අදටත් මිහිදන්ව ඇත. අපේ රටට, අපේ සංස්කෘතියට උචිත අපේ පවුල් ඒවලට වඩාත් ගැළපෙන තේමාවන්ගෙන් සපිරි ටෙලි කතා ඒ පසු පස්සේ බිහි විය. අදටත් ඒවායේ සොඳුරු මතක සැමගේ සිත් මත ඉතිරිව ඇතිවා සේම උසස් රසවින්දනයක් ලබා ගැනීමේ හැකියාව ද ප්‍රේක්ෂකයාට නිතැනින්ම හිමි විය.

එහෙත් වර්තමානයේ රූපවාහිනී නාලිකා බිහිවීමේ ප්‍රවණතාවයත්, ඊට සමගාමීව පෙන්වනු ලබන ටෙලිකතා ප්‍රමාණයත් දිනෙන් දිනම වැඩි විය. ඒ අතරතුර ආක්‍රමණශීලී වෙසින් පැමිණි විදෙස් ටෙලි නාට්‍ය අපගේ සෑම සියලු නාලිකාවක්ම ඉතා ඉක්මණින් තම ග්‍රහණයට හසු කරනු ලැබීය. අද විදෙස් ටෙලි නාට්‍යයක් විකාශනය නොවන නාලිකාවක් සොයා ගැනීමට පවා අපහසුය.

ලෝකය එකම පියස්සක් යටට ගෙනා ගෝලීයකරණය ටෙලිනාට්‍යය කලාවට ද එකසේ බලපෑවේය. විදෙස් ටෙලි නාට්‍ය බැලීමට පහසුකම් නොමැති ඒ සඳහා ප්‍රියතාවයක් දැක් වූ ප්‍රේක්ෂකයාට එය මහඟු අවස්ථාවක් විය. භාෂාවේ දැනුම අඩු ප්‍රේක්ෂකයාට පවා අපගේ මවු භාෂාවෙන් හඬ කවන එම ටෙලි නාට්‍ය බැලීමට අවස්ථාව එයින් උදා විණි.

එහෙත් අද පවතින්නේ ඉතාමත් ශෝචනීය තත්ත්වයකි. විදෙස් ටෙලිනාට්‍ය විකාශනය සඳහා තෝරා ගැනීමේ දී අප විසින් භාවිත කරන්නේ කුමන මිනුම් දඬු ද යන්න ගැටලුවකි. සමහර ටෙලිනාට්‍ය නැරඹීමේ දී එහි කොටස් ගණන අප ජීවත්ව සිටිය දී නරඹා අවසන් කළ හැකි ද යන්න පවා ගැටලුවකි. එසේම සමහර පවුල් ඒ සම්බන්ධයෙන් විකාශනය වන ටෙලි නාට්‍ය නැරඹීමේ දී මෙම සිදුවීම් මිහිපිට සිදුවිය හැකිද? යනුත පවා සිතාගත නොහැකිය. එකම පවුලේ අඹුදරුවන් මවුපියන් සහෝදර සහෝදරියන් නෑයන් අතර සිදුවන කුමන්ත්‍රණ වෛරකාරී සිතුවිලි අනෙකා පරයා නැගී සිටීමට දරන වෑයම ඉතා පිළිකුල් සහගතය. පෙම්වතුන් පෙම්වතියන් අතර සිදුවන්නේ කුමන්ත්‍රණය. ආදරයෙන් එක්වීමක් දැකගත නොහැකිය. සමහර ටෙලි නාට්‍ය අපේ රටට අපේ සංස්කෘතියට ගැළපෙන්නේ දැයි නැවත වරක් සිතා බැලිය යුතු තත්ත්වයක් උද්ගතව ඇත.

පොදුවේ ගත්කළ මේ ටෙලිනාට්‍ය අපේ මනස විකෘති කර දමනු ලබයි. ටෙලි නාට්‍යයක් නැරඹීමෙන් අප බලාපොරොත්තු වන්නෙ යම්කිසි මානසික වින්දනයකි. එහෙත් මේ නාට්‍ය තුළින් ප්‍රේක්ෂකයාට එවන් සන්තෝෂජනිතයක් ලැබෙනවාදැයි සොයා බැලිය යුතු කරුණකි. තවද උසස් රස වින්දනයක් ලබා ගැනීමට හැකි ටෙලිනාට්‍ය තෝරා ගැනීමට හැකියාව තිබියදීත් අප යන්නේ මංමුළා වූවන්සේය. ඒ තුළ උසස් නිර්මාණයක් රසවින්දනය කිරීමට ප්‍රේක්ෂකයාට තිබෙන අයිතිය මගහැරී ඇත.

ශ්‍රී ලාංකික බොහෝ ප්‍රේක්ෂකයන් මෙම ටෙලිනාට්‍ය නරඹන බව නොරහසක් නොවේ. අපේ රට තුළ පවුල් අතර සිදුවන අපරාධ වගේම සමාජීය වශයෙන් සිදුවන විවිධ අපරාධවලට මෙම කතා පාදක නොවනවා සේ සිතිය නොහැකිය. ඒ වගේම තරුණ පරපුර නරක ඇබ්බැහිවීම්වලට යොමුවීමට පවුල් ඉතිරීම්වලට, ළමා හිංසනයන්ට වැනි සමාජ පරිසරයක් තුළ නොසිඳු විය යුතු බොහෝ කරුණුවලට මෙම ටෙලිනාට්‍ය කතා මුල් නොවනවා සේ සිතීමට අපට කරුණු කාරණා නොවේ.

අපට පෞඪවත් ඉතිහාසයක් උරුමව තිබේ. හොඳ සංස්කෘතියකට උරුමකම් කියන අපිට පවුලේ බාල මහලු වැඩිහිටි සියලු දෙනා විසින් එකට නැරඹිය හැකි අපේ රටේ සොඳුරු ටෙලිනාට්‍ය කලාවක් ද දායාදව තිබේ. එහෙත අද, ඒ සොඳුරු ටෙලිනාට්‍යවලට සිදු වූයේ කුමක්ද? යන්න සිතෙන විටත් හද කම්පා කරයි. ඔබට මට අමතක කරන්න බැරි අපේ රටේ සොඳුරු ටෙලිනාට්‍ය වූ යශෝරාවය, ගම්පෙරළිය, දූ දරුවෝ අසලවාසියෝ දඬුබස්නාමානය වැනි ටෙලිනාට්‍ය අදටත් අපේ සිත් තුළ මහා දාවැන්තයන් ලෙස අරක් ගෙන සිටී. එහෙත් අද, එවන් උසස් නිර්මාණ රසවිඳීමට ප්‍රේක්ෂකයාට තිබෙන අයිතිය කුමක්දෝ බලවේගයකින් අහිමිවී ඇත.

අද එවන් සොඳුරු උසස් රසවින්දනයක් සහිත කතා විකාශය වීමේ අඩුවක් දක්නට ලැබේ. සමහර ටෙලිනාට්‍ය විදෙස් ආභාෂය ලබා ඇත. අපේ සංස්කෘතියට ගැළපෙන නිර්මාණ බිහිවීමේ අඩුවක් දක්නට ඇත. උසස් රසවින්දනයක් ලැබීමට නම් උසස් ගුණාත්මක බවින් යුත් නිර්මාණ බිහිවිය යුතුය. අද වළපල්ලට යමින් පවතින්නේ අපේ මේ උසස් නිර්මාණයන්ය. එබැවින් එය රැක ගැනීමටත් මතු පරපුර වෙනුවෙන් ආරක්ෂා කරදීමේ වගකීම අප සතුය.

ධවල පත්‍රිකාව...
ශ්‍රීමානි ප්‍රියංගිකා,
විහාරගොඩ, බදුල්ල

මල් කැකුළු පිපෙන්නට ඉඩ දෙන්න

යම් රටක දරුවන් හද වඩා ගන්නා ආකාරයත් අධ්‍යාපනය පෝෂණය, සෞඛ්‍යය සහ රැකවරණය ලබා දෙන ආකාරයත් එරට අනාගත පැවැත්ම තීරණය වේ. වර්තමානයේ කුඩා දරුවා අනාගතයේ රට පිළිබඳව වගකීම් දරන්නෙකි. 'ළමයා වනාහි ඉදිරි කාලයේ බිහි වන මිනිසාය' යනුවෙන් ඇරිස්ටෝටල් පඬිතුමා ළමයාව අර්ථවත් කළේ එබැවිනි. රටේ කොඳුනාරටිය තරුණ පරපුර නම් රටේ ජීවනාලිය ළමා පරපුරයි. රටේ ජීවය බඳු දරුපරපුර විවිධ උවදුරුවලින් ආරක්ෂා කිරීම වර්තමානයේ මවුපියන් සතු අභියෝගයකි.

සමාජය යනු විචාරවූත් අවිචාරවූත් සංකලනයකි. සමාජයේ වෙසෙන මිනිසුන් සුදු කළු යනුවෙන් ඉරි ගසා වෙන්කළ නොහැකිය. සෑම සමාජයකම දක්නට ලැබෙන්නෙ අළු පැහැති චරිත ගත් මිනිස්සුය. යහපත අබිබවා අයහපත ග්‍රහණය කරන සමාජයක ළමයා යනු නොමේරූ තැනැත්තෙකි. ළමයා කිසි විටෙක කුඩා මිනිසෙකු නොවන අතර ඔහු හෝ අය කායිකව හා මානසිකව යැපෙන්නෙකි. එනම් සම්පූර්ණයෙන් අනුන් මත ජීවත් වන රැකවරණය හා සෞඛ්‍යය විවිධ පීඩාවන්ට ගොදුරු විය හැකි තැනැත්තෙකි. එවැනි ළමයි මල් කැකුළු වැනිය. අවුරුදු 18 ට අඩු සෑම අයෙකම 'ළමයා' නම් වන බව ළමා ප්‍රඥප්තියේ සඳහන් වේ. යැපෙන මානසික තත්ත්වයේ සිට ස්වාධීන මානසිකත්වයට යාමට ගතවන කාලය 'ළමාවිය' නම් වේ. මිනිසාගේ ළමාවිය සෙවණැල්ලක් මෙන් ජීවිතය පුරා ක්‍රියාත්මක වෙයි. එහි ඇතැම් සිදුවීම් මිනිස මනසට තදින් බලපෑම් කරයි. එහි ප්‍රතිඵලය වශයෙන් ඔහුගේ ජීවිතය යහපත් හෝ අයහපත් වීමට පසුකාලීනව බලපෑම් කරයි. 'අපයෝජනය' යනු වරදෙහි යෙදවීමයි. එනම් දරුවන් වෙනුවෙන් සිදු කළ යුතු දේ නොකිරීමත, නොකළයුතු දේ සිදු කිරීමත් අපයෝජනය නම් වේ. කායිකව, මානසිකව, ලිංගිකව යනාදී තුන් ආකාරයෙන්ම අපයෝජනයට ළමයා දෙදිනිකව ගොදුරු වන බැවින් විනාශ වන්නේ මෙරට අනාගත පරපුරයි. මෙයට හොඳම උදාහරණය වන්නේ මෑතකදී අන්තර්ජාලය ඔස්සේ අලෙවි කළ බලා වයස්කාර දැරියට ලිංගික අපයෝජනය සිදු කිරීමේ ආන්දෝලාත්මක සිදුවීමයි.

ළමා අධිකාරියට ලැබෙන පැමිණිලි අනුව බහුල වශයෙන්ම අපයෝජනයට ගොදුරු වන්නේ යොවුන් වියේ පසුවන දරු දැරියන්ය. යොවුන් විය යනු වයස අවුරුදු 11- 18 අතර කාල සීමාව වේ. එය දරුවා වැඩිහිටියෙකු බවට පත්වන සංක්‍රාන්තික කාල සීමාවක් ලෙස සැළකේ. මෙහිදී, ශාරීරික වෙනස්කම් සමඟ ඇතිවන මානසික තත්ත්වයන් හමුවේ බොහෝ දරුවෝ හුදකලා අරගලයක යෙදෙති. ඔවුහු කුතූහලය හා විරුද්ධ ලිංගික ආකර්ශනය මත අලුත් දෑ සොයා යාමත්, විවිධාකාර අත්දැකීම් සමාජය තුළින් ලබා ගැනීමටත් වෙහෙසෙති. තමා වැඩිහිටියෙකු ලෙස සිතීමට පෙළඹීම නිසා විවිධාකාර රැවටීම්වලට ගොදුරු වෙති. බොහෝ ළමා අපචාර සිදු වී ඇත්තේ සමීප පුද්ගලයනගෙන් වීම විශේෂත්වයකි. එනම් දරුවාගේ විශ්වාසය දිනාගත් තාත්තා, මීයා, බාප්පා, සුළුප්පියා, මාමා, මස්සිනා, සහෝදරයා යනාදී ඥාතීත්වයක් ඇති අයගෙන් මෙන්ම ඇසුරු කරන පුද්ගලයන් වන අසල්වැසියා, යහළුවා, ගුරුවරයා, විදුහල්පතිවරයා හා ප්‍රජා පක්ෂය අතින්ද අපයෝජනයටත්, දූෂණයටත් ලක්වේ. එසේම යොවුන් දැරියන් ප්‍රේම සබඳතා පැවැත්වීම හේතුවෙන් තම පෙම්වතා අතින් දූෂණයට ලක් වේ. බොහෝ විට ළමයින් අපයෝජනයට ලක් කර ඇත්තේ රැවටීමෙන හෝ බිය ගැන්වීමෙනි. වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකුගේ කැමැත්ත ඇතිව හෝ නැතිව කායිකව එක් වීම 'ස්ත්‍රී දූෂණයක්' ලෙස අර්ථ දැක්වෙයි. ස්ත්‍රී දූෂණයක් නොවෙන වෙනත් ආකාරයේ ලිංගික අතවර ලිංගික අපයෝජන නම් වේ.

කුමුදු සංජීවනී පෙරේරා
සිංහල ඩිප්ලෝමාධාරී, කොළඹ විශ්වවිද්‍යාලය

මෙම වැරදිවලට බරපතළ වැඩ ඇතිව අවුරුදු 20 දක්වා සිරගත කළ හැකිය. ලජ්ජාව, බිය සහ ගෞරවය හේතුවෙන් ඇතැම් ළමා අපචාර නීතිය ඉදිරියට නොගොස් නිහඬව විඳ දරා ගැනීම කිසිසේතම යහපත් තත්ත්වයක් නොවේ. එය අපයෝජකයාට තව තවත් අපරාධ කිරීමට රුකුලක් වනු ඇත.

යම් අවාසනාවකට තම දරුවා අපයෝජනයට ගොදුරු වී ඇති බව මවුපියන්ට අවබෝධ කර ගත හැක්කේ දරුවාගේ අමුතු හැසිරීම් මතය. එනම් දරුවා එකවර නිහඬවීම, කල්පනා බරිත වීම, නිවසේ සමාජිකයන් ඇසුරු කිරීමට අකමැති වීම, යමක් ප්‍රකාශ කිරීමට උත්සාහ කිරීම, හුදකලාවීම යනාදී චරයා ඉඟි තුළින් අවබෝධ කොටගත හැකිය. මෙහිදී ඔබ ඉතාමත් බුද්ධිමත් අයුරින් ප්‍රතිචාර දැක්විය යුතුය. කිසිවිටෙක නීතිය ඔබ අතට ගැනීම සිදු නොකළ යුතුය. ළඟම පොලිස් ස්ථානයට හෝ ළමා ආරක්ෂක අධිකාරියට එම අපයෝජනය වාර්තා කරන්න. එසේම මනෝ වෛද්‍ය උපදේශනද ලබා ගන්න.

ළමාවියේ පටන් තම දරුවා බෙහෙවින් ආරක්ෂා කිරීම මවුපියන් සතු යුතුකමක් හා වගකීමක් වන්නේය. බොහෝ වැරදි සිදුවන්නේ නොදැනුවත්කම හා නොසැලකිලිමත්කම හේතුවෙනි. තම 'ආසා දෙකමෙන්' දරුවා තමා සමීපයේ රඳවා ගනිමින් කල්පනාකාරීව රැක බලා ගත යුතුය. යොවුන් වියේ වෙසෙන දරුවා නුවණින් කල්පනා නොකර හැඟීම්වලට වශඟ වී ක්‍රියා කරන බැවින් එම දරුවන් කෙරෙහි පූර්ණ විශ්වාසයක් තොතබා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. එසේම තම දරුවාට අධ්‍යාපනය පමණක් නොව සමාජ අවබෝධයක්ද මවුපියන් විසින් දරුවාට කියා දිය යුතුය. අනවශ්‍ය සංවේදී පුද්ගලයෙකු ලෙස දරුවා හැඟි නොගැස්වීම, දරුවා මුහුණ පෑමට සිදුවන හිංසනවලට එරෙහිව සටන් කිරීමට හුරුකිරීම, දරුවා ඇසුරු කරන පුද්ගලයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම, දරුවා සමඟ එදිනෙදා තොරතුරු හුවමාරු කර ගැනීම, නවීන තාක්ෂණය පිළිබඳ නිසි අවබෝධයකින් පසුවීම, කිසිවිටෙක අන්‍යයන් ඉදිරියේ දරුවා තනි නොකිරීම යනාදී ආරක්ෂිත පියවර ගැනීමෙන් තම දරුවාට අපයෝජනයෙන් තොර සොඳුරු ළමා වියක් උරුම කර දීමට හැකි වනු ඇත. තම දරුවන්ට වඩාත් සුන්දර ළමාවියක් නිර්මාණය කරමින් ඔබ ලබන සතුට මෙලොව උත්තරීතරම සතුටයි.

හැඩ තිබුණට වැඩක් නැතේ

නූතනයෙහි මහමග ගමන් කරන විට වාහනවලින් පිටවෙන ගොරහඬි අධික නළා ශබ්ද දෙකන්වලට, මනසට විඳදරා ගත නොහැකි අයුරින් නිකුත් කෙරේ. මෙය මහමග ගමන් කරන උදව්යට මහත් හිසරදයකි. ඇතැම් වාහනවලින් නිකුත් වෙන ශබ්දය ඊට නොදෙවෙනිය. වාහනයක් ආනයනය කිරීමේදී එයට ගැළපෙන සරලන නළාවක් මෙන්ම වාහනයට උචිත ශබ්දයක් නිකුත් වනසේ නිෂ්පාදනය කර තිබීම නොරහසකි.

තම සිතැඟි පරිදි එය වෙනස් කළ හැකිද? 'විසිල් තිබුණට බලලි හැතුව වැඩක් නැත' යනුවෙන් සමාජයේ කියමනක් තිබේ. මාර්ග නීති පිළිනොපැද අධික ශබ්ද නිකුත් කිරීමෙන් පලක්වේද? මසක් තුළවූ රිය අනතුරුවලින් හැත්තෑවකට වැඩි පිරිසක් මිය ගිය බව අනාවරණය විය.

මහමඟ ධාවනය වන වාහනවල ගුවන් ගියර් පද්ධතියක් නැත. එනිසා ගුවනින් පියාසර කිරීමට නොහැක. අදාළ මාර්ගයෙහි ධාවනය කළ යුතු වේග සීමාවක් පනවා ඇත. මාර්ග නීති අනුගමනය කර රිය පදවන්නේ නම් බොහෝදුරට අකාලයේ රිය අනතුරුවලින් මෙලොව හැර යෑමට සිදු නොවේ.

අකාලයේ මෙලොව හැර යෑම ගැන අනාවරණය වන දැවලින් රිය අනතුරුවලට ප්‍රධාන තැනක් හිමි වේ. ප්‍රථම මාරක රිය අනතුරක් ලෙස එකල රෝද, දෙකේ අශ්වකරත්තයකින් ගමන් කරමින් සිටි එළාර රජුගේ පුතු ධාවනය කළ රථයට වසුපැටවෙකු හසුවී මිය යෑම මෙන්ම 1797 ජූලි මස කොළඹ හමුදාව බාරව කටයුතු කළ කර්නල් බොනාවො මහතාගේ රථය පෙරළීම නිසා ඔහු මිය ගිය බව පොතපතෙහි සඳහන්වේ. 1806 දී ප්‍රථම ගැසට් නිවේදනය නිකුත් කරමින් සියලුම වාහන මාර්ගයෙහි වම්පැත්තෙන් ගමන් කළ යුතු බවට නියෝග පැනවීය. සොබාදහමෙ සුන්දරත්වයන් ඔප්නංවමින් පරිසරයට උරුමකම් කියන අතැම් සත්ත්ව සමූහයන්ගේ නාදයන් සුමිහිරි නාදරටා මවමින් නෙතට සුන්දරත්වයක් මෙන්ම කනට මිහිරක් ලබා දෙමින් මවන නාදයන් කෙතරම් මිහිරියි ද එයට අකමැති අයෙක් ලොව නැති තරමිය.

වෘක්ෂලතා ආදිය එකිනෙකට ඇතිල්ලෙන මැදෙන ශබ්දය කනට කෙතරම් ප්‍රිය උපදවයිද ශබ්දෙ රාවලින් මිනිස් මොළයේ අභ්‍යන්තරයේ ඇතිවෙන බීටා නීටා ඊටා ඇල්ෆා යන

එන්.කේ. අබේවර්ධන
කුරුණෑගල

තරංගවලින් මිනිසාට යහපත් වූ සුවදායක තරංගය ලෙස ඇල්ෆා තරංගයට ප්‍රධාන තැනක් හිමිවේ. මෙම සොඳා දාමේ අසිරිය ඔප්නංවන ශබ්දරාවන් මිනිස්මොළයට දැනෙන්නේ ඇල්ෆා තරංග අයුරිනි. ඇල්ෆා තරංගවලින් මිනිස් මොළයේ මනෝභාවයන් නිරවුල් වන බව පොත පතෙහි සඳහන්වේ. අප බෙහෙත් හෙත් යනුවෙන් හඳුන්වන වැකියෙහි හේත් යනු වෙන් සඳහන් වන්නේ සාංකාව, මානසික පීඩාවන් දුරුකර ගැනීම සඳහා ශ්‍රවණය කරන සංගීතයයි. උදාහරණ ලෙස පන්සලෙ බෝධි ප්‍රජාවෙන් නිකුත්වෙන හඬ බෝධීන් වහන්සේගේ බොපත් සෙලවෙන හඬ මෙන්ම සරල සංගීතය මගින් ඇල්ෆා තරංග ඔස්සේ මානසික සුවතාවය මෙන්ම මානසික ප්‍රබෝධය ආධ්‍යාත්මික ගුණවගාව වැඩිදියුණු වන බව ඇතැම් දැවල විස්තර වේ.

මිනිස් සිතේ සිතිවිලි ඉතාමත් නිදහස් නිවහල් සංඥා සිතිවිලි බවටත් පරිවර්තනය කරනනා වූ සංසිද්ධි පද්ධතියකි. මෙතැන් සිට ඇත්තෙ ජනප්‍රවාදයේ එන කතාවකි. පොල්කිච්චකු තල්ගසක අත්තක සිට අප්‍රමාණ සැප ගන්ඩ ගන්ඩ ඉහළ සිටින සැමටත් පහළ සිටින සැමටත් මටත් මගෙ දරුවන්ටත් බුදුසරණයි දෙවිපිහිටයි හුයියො හුයියො යනුවෙන් ඉතා මිහිරිව ගීතයක් ගයන්නාක් මෙන් හඬ නැගුවේය. එය ශ්‍රවණය කරමින් සිටි අයෙකු තල්අත්තට බොරලු පසවලින් දමා ගැසුවේය. පොල්කිච්චාට මදක් කේන්ති විත් අයියො පීවං අයියො පීවං යනුවෙන් නාදකරමින් ඉගිලී ගියේය.



චිත්‍රය

ඔහු හබරළ කොළය යට
මම කෙසෙල් අතු කුඩය යට
තෙත බරියං වූ සරම හා ගවුම
රබර් පට්ටය හිරවුණු පොත් මිටිය
මඩ මිරිකුණු ඇඟිලි කරු
සමඟ ගියෙ පාසලට
දෙකට නැමුණු ගෝනියක් ඉහේ දැගෙන
ආවේය මුල්ගුරු වේවැල ද අතැතිව
ඇස් කරකවා බලා සිටි කොත
බාගයක්වත් නෑ ළමයි අද
අඳින්න චිත්‍රයක් වැසි දිනක
දිය සායම් පෙට්ටි
අල්ලා වැහි වතුරට
වැතුරුණා පංතියේ බිම කෙළවර
අණ්ඩ දැමූ පොල්ලතු වහලයට
වැටුණි අඹ අත්තකුත්
වතුර බේරෙන තැනට
තියමු මැටි වළඳක්
'කෝ බලන්න ළමයි ඇඳි සිතුවම්'
එසවුණා ඉහළටම
නැගුණි අත්පොළසන් නාදයක්
දිය සායම් තැවරුණු ගවුම
බලා හිඳියි නියපොත්ත විකමින්
හබරල කොළ ද කෙසෙල් අතු ද
වැටී ඇත කොට බිත්තියෙන් පහළට
මේසයට බර දී මුණුපුරා
අඳියි සිතුවමක් වැසි දිනක
ඔන්ලයින් පාඩමට
පිට රැඳි පොත් බෑගය ද සමඟින්
සිත තබා වැහි කබා
දෙපතුළට පොරෝගෙන
දේදුනු පාවැති කුඩයට ද මුවාවී
පාසලට යන කලට
කාපට් පාර මත වැටුණු වැහි වතුර
ගලා යයි කාණුවට සීරුවට
තැනින් තැන පාරටම ඇලුණු කොළ
කැබැලි
තිරයෙන් එබී හිනැහුණා ගුරුතුමිය
ඔසවා ඇඟිල්ල මහපට
එක්සලන්ට් වෙල්ඩන්

ඩබ්ලිව්.එම්.කේ. මැණිකේ,
හෙට්ටිපොළ.

තනි කවිය

බකමූණෙකු හැඬුවා හිඳ අඹ අත්තේ
මයිනා නැතිව මයිනිය තනියම වත්තේ
පාලුව මකන රූසිගෙ හඬ නැත්තේ
අමවකදත් කළ එළියයි පිළ පැත්තේ

පී. ඉනෝකා සංජීවනී,
පුත්තලම.

දුබලයා

තමා
තමා දෙස
නොබලා
අනෙකා දෙස
බලමින්
සිනාසීම

කරුණාරත්න අත්තනායක,
ගල්ගමුව.

හිර ගෙදර

අත රැඳුන ආයුදය
එල්ලකර සතුරාට
යළිත් එය බිම දැමුවෙ
සිහිවෙලා සිපිරිගේ
සිත් රැහැන් බිඳදමා
නෙත් සලා බැලුසඳ
මා හිටියෙ පෙර සේම
සිපිරිගෙයි සිටි තැනම

ලිල් චන්ද්‍රසිරි,
නැගම්පහ.

අදත් තනියම ඈ තමයි

ඇඩක් පිර වූ මදු බඳුන්
එකට ඔසවා පුරා සවිදිය
තොලගාමින් කී රස කතා
පණ උනත් දෙන යාළුවෝ
තාවකාලික විරුවන්ගෙ ලෝකේ
සමාජ ආර්ථික දේශපාලන
ඕන දේකට ක්ෂණික විසඳුම්
නිකරුණේ දැල්වෙනා දුම්වැටි
අළු බඳුන් ඔහෙ පිරී යද්දී
ගෙවූ කාලය හෝරා ගණනින්
සිතුණි මෙයමයි ජීවිතේ
දියව ගිය ජව බලය
ඇට සැකිලි ශරීරය
හොවා සයනය මතට
බට ගසා මුව දෙර වසා
වේදනාවේ දුබල කෙඳිරිය
පහන්සිල වැනි තෙල් නිමා වූ
එද සිටි හිතවතුන් අද නැත
සුසුම් හෙලනා දයාබර ඈ
ඇත එදා මෙන්
අදත් තිනියට...



තිලක් අතපත්තු,
වාරියපොළ.

තේ කඩේ නංගි

දුවු දුවු සැමට ඔබේ
සුන්දර
සිනහ නැගේ
විටකදී පෙනෙනවා
කඩිසර
හෙට ගැන හිතා වැඩ
කරනා
අයුරු අගේ
ඔට හරි දුකයි තේ
කඩයේ
වීටි නගේ



සිරිල් මදුරප්පෙරුම,
කුලියාපිටිය පාර,
මූණමල්දෙනිය.

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 අගෝස්තු මස 18 වැනිදා බදාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.

වනජීවී කාර්යාලයෙන් මෙලෝ වැඩක් නෑ:

බලධාරීන් නින්දේ:

වල් අලි 70 ක් කන්දෙගෙදර හොල්ලති

(නිකවැරටිය ප්‍රියාණි මංගලිකා)

නිකවැරටිය කන්දේගෙදර ප්‍රදේශයට ඉකුත් 15 වැනිද රාත්‍රියේ කඩා වැදුන 70ක පමණ වල් අලි රංචුව ගම දෙවනත් කරමින්, පොල්වතු, කෙසෙල් වතු, වගාබිම්, ගහ කොළ බිමට සමතලා කර ඇතැයි ගම්මු හැඬූ කඳුළින් කියති.

එල දැරීමට ආසන්න අක්කර පහක පමණ පොල් වත්තක් සම්පූර්ණයෙන්ම වනසා ගම්මානයේ සෙසු වතුවල පොල් වගා හා සෙසු ගහ කොළ හා දේපළද වල් අලි රංචුව මෙලෙස වනසා ජනතාව මහ මගට ඇද දමා ඇතැයිද ජනතාව පවසති.

ආසන්නයේ ඇති අක්කර 50ක පමණ වූ, වැවක්ද සහිත කොටුඅත්තාවල කුරුටු උයන සමග ඇති රක්ෂිත කැලෑව හේතුවෙන් මෙම වල් අලි තර්ජන උග්‍ර අතට හැරී ඇති බවද ගම්මු කියා සිටිති.

මෙම කැලෑව තුළ රැඳී සිටින විශාල වල් අලි රංචු විදුලිය වැටවල්ද විනාශ කර දමා මෙලෙස ගම් වදින බවද, මේ හේතුවෙන් තමන්ට යන එන මං නැතිව ගොස් ඇති බවද බලධාරීන් මේ සම්බන්ධයෙන් කටයුතු නොකිරීම හේතුවෙන් තත්ත්වය ඔඩු දුවමින් තමන් අසරණ කර ඇති බවද ජනතාව කියා සිටිති.

මේ පිළිබඳව අදහස් දැක් වූ කන්දේගෙදර ඩබ්.එම්. ආයුපාල (70) මහතා මෙසේ කීය.

මගේ ඉඩමේ පීදෙන්න ආසන්නව තිබුණ පොල් ගස් 60 ක් පමණ වල් අලි රංචුව විනාශ කළා. වල් අලි 70 ක් විතර විශාල රංචුවක් කඩා වැදුනම මට එලවා ගන්න බෑ. මම තනියම ඉන්නේ. පුතා හමුදාවේ. මට කරපු විනාශයේ පාඩුව නම් මිල කරන්න බෑ. පොල් ගස් ටික ඔය තරමට ලොකු කරන්න අනන්ත අප්‍රමාණ දුක් කරදර වින්ද, බලධාරීන්ට මේවා පේන්නේ නෑ. අහිංසක මිනිස්සු මේ විඳින දුක.

අපි මේ වගා කරලා තියෙන්නේ සින්නකර ඉඩම්වල. මේ වැව සහිත කොටුඅත්තාවල කුරුලු උයන සහිත කැලෑ ප්‍රදේශය අලි වැටක් ගහගෙන අධි ආරක්ෂිත කලාපයක් කරගෙන වනජීවී කාර්යාලයකුත් පිහිටුවා ගෙන තියනවා. මෙතන වැවක් මිස රක්ෂිත කැලයක් නැහැ. මේකට වනජීවියෙන් අලි ගෙනත් දානවා, උන් අලි වැටවල් විනාශ කරගෙන ගම් වදිනවා. අපේ ජීවිතත් අනතුරේ.

බලධාරීන් අපේ දුක ගනන් ගන්නෑ. අපි කාලෙන් කාලෙට අරයා හොඳයි, මෙයා හොඳයි කියලා දේශපාලකයන් පත් කරගත්තට වැඩක් නෑ. දැන් අලි ගහනය වැඩියි. මේ අලි රටෙන් පිට කරන්න ඕනෑ. නැත්නම් අල්ලලා වැඩක් ගන්න ඕනෑ. මෙතෙන්ට වනජීවී කාර්යාලයක් අවශ්‍ය නෑ. අපි මේවා දුක් මහන්සියෙන් වගා කරන්නේ අපිට මැරෙනකොට ගෙනියන්න නෙමෙයි. අනාගත දරුවන්ගේ පෝෂණය සඳහායි. දැන්වත් බලධාරීන් අවදි වෙලා වහා මේ වල්අලි ප්‍රශ්නයට විසඳුමක් දෙන්න "

කන්දේගෙදර කොට්ඨාසයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. දිසානායක (පො.ජ.පෙ) මහතා මෙසේ කීය.

"ගමේ ජනතාවට මේ කරලා තියන හානිය නම් දරාගන්න බෑ හිතක් පපුවක් තියාගෙන. ජනතාව වහ බොන තරමට පීඩාවට ලක් වෙලයි ඉන්නේ. මේ විශාල පොල් ඉඩම් තව අවුරුද්දෙන් පීදිලා පල දරනවා. ඒ ගොවි මහතාට දරා ගන්න බෑ.

මේ වන අලි ගැටලුවට මූලික හේතුව මේ වනජීවී කාර්යාලයයි. මේක මෙතෙන්ට අවශ්‍ය නෑ. කොටුඅත්තාවල කුරුලු අභය භූමිය සමග වැවක් සහිත අක්කර 54 ක් මෙනි තියනවා. මේකට අලි ගෙනත් ගාල් කරනවා. උන් විදුලිය වැට පෙරලාගෙන ගම් වදිනවා කන්න නැති නිසා. අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීන් නිසා ජනතාව අපිටත් දෙස් කියනවා. ඒ නිසා මේ ගැටලුව ඉතා ඉක්මනින් විසඳන්න අවශ්‍යයි." යැයි හෙතෙම කීය.

නිකවැරටිය වනජීවී කාර්යාලයේ ප්‍රධානී, අඩවි ආරක්ෂක එම්. රෝහිත මහතා මෙසේ කීය:

"කොටුඅත්තාවල කුරුලු උයන සහිත රක්ෂිතය තුළ වල් අලි 70 ක පමණ රංචුවක් කොටු වෙලා ඉන්නවා. ඒ අලි රංචු අපි ගෙනැවිත් දාලා නෙමෙයි. පසුගිය දිනවල ඒ අසල කුඹුරු යායවල අස්වනු නෙළමින් තිබූ නිසා මේ අලි රංචුව රැගෙන යාම අපහසු වුණා. ජනතාවට පීඩාකාරී මෙම අලි රංචුව මෙහෙයුමක් මගින් ඉතා ඉක්මනින් රැගෙන යාමට පියවර ගෙන තිබෙනවා. ජනතාවට සහන සැලසීමට පියවර ගන්නවා." යැයිද පැවසීය.

නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් රුවන් ජයසුන්දර මහතා මෙසේ කීය.

මේ දිනවල නිකවැරටිය මැතිවරණ කොට්ඨාසයේ වල්අලි තර්ජන පවතිනවා. ඒ සඳහා ගොවීන්ට අලි වෙඩි ලබා දී තියනවා. වල්අලින් සිදු කරන ජීවිත, දේපළ, වගා හානි සඳහා වන්දි ලබා දීමට පියවර ගෙන තිබෙනවා. එසේම මෙම වල් අලි රංචු මෙහෙයුමක් මගින් රැගෙන යාම සඳහා අදළ නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය පියවර ගෙන තිබෙනවා " යැයිද කීය.

ජනතාව කියා සිටියේ කොරෝනාවෙන් විපතට පත්ව සිටින තමන්ට මෙම වල් අලි තර්ජන හේතුවෙන් කබළෙන් ළිපට වැටීමට සිදුව ඇති බවය. බලධාරීන් වහා මේ පිළිබඳ කඩිනම් පියවර ගෙන තමන්ට සහන සලසන ලෙස බලධාරීන් ගෙන් ඉල්ලා සිටින බවය.

කවිමඩුව

මා දැන් මහලු වියේ

අත් පා වේලිච්චි දර ගොඩකට	සමය
නෙත් යුග කඳුළු, හරා මතුවෙන	උමය
දත් නැති කටේ සිද්දිය දන්නේ	මමය
බත් ඇටයක් හපා ගන්නට බැරි	කමය
උප තේ සිටම අරගෙන ජීවිත	අඟුල
අපතේ නොහැර තරණය කෙරුවෙමි	ගඟුල
ළිප ළඟ වකටු වී අටවාගෙන	උඟුල
විපරම් කරමි එනතුරු මරණයෙ	මඟුල
දහදිය හෙල හෙලා ඉල ඇට බිඳෙන	තුරු
ගහකොළ වවා ගොඩ මඩ දෙක කළෙමි	සරු
ඉහමොළ පාදලා බබළන ලෙසට	තරු
යහපත් රට වැසියො කෙරුවෙමි පිරිස	දරු
ලොකු බත් ගලාවල පහසුව ඇතුව	ඉඩ
අද - උන් දිව් ගෙවති පාඩුවේ නගර	බඩ
ගෙද රින් පිට වෙන්ට විදියක් නොමැති	ජඩ
මම දැන් මහල්ලෙකි! ළතවෙන ගෙපිල	උඩ
උණ හිසරදය ඇඟපත වේ	දනාව
කන බොන දෙයක් ගැන නෑ උව	මනාව
බණ පොත මගේ ලොකු දියණිය	ගෙනාව
යන එන අයට පෙන්නන කොට	හිනාව
දරු දැරියන්ට කරදරයක් නොවෙන්	නට
අරු මෝසම් නැතුව මළගම කෙරෙන්	නට
මරු වෝ උඹේ යුතුකම ඉටු කරන්	නට
හිරු පායන්ට පෙර රහසේ වරෙන්	ගෙට

කලා භූෂණ
යූ.බී. පන්වැව, බළල්ල.

ඔබේ නිර්මාණ රජරට කවි මඩුව "ලංකාදීප" කර්තෘ මණ්ඩලය, අංක 8, හුණුපිටිය හරස් පාර, කොළඹ 02. ලිපිනයට යොමු කරන්න.

පුත්තලම කළපුවට සුද්දයක්

ජාත්‍යන්තර යොවුන් දිනයට සමගාමීව පුත්තලම කළපු තීරය පිරිසිදු කිරීම ඉකුත් 14 වැනිද උදෑසන සිදු කළේය.

පුත්තලම ප්‍රදේශයේ තරුණ පිරිසකගේ සහභාගිත්වයෙන් සෞඛ්‍ය ආරක්ෂිත ලෙස සිදු කළ මෙම සත් ක්‍රියාවට විශාල තරුණ පිරිසක් සහාගි වූ අතර කළපුව අසල සිරිනැරඹීමට පැමිණි පිරිස් විසින් අපවිත්‍ර කළ කළපුවේ තිබූ ප්ලාස්ටික් බෝතල්, ඉටිකොළ විශාල ලෙස එකතු කිරීමට මෙම පිරිසට හැකි විය.

ජාත්‍යන්තර යොවුන් දිනයට සමගාමීව පුත්තලම ග්‍රාම සංවර්ධන සමුපකාර සංවර්ධන බැංකුව මෙම වැඩසටහන සංවිධානය කළේය.

(පුත්තලම එච්. චන්දන)

හරිහැටි ප්‍රතිකාර නෑ:

සිරිපුර ගෙවල්වල නිරෝධායන රෝගීන්ගෙන් චෝදනා

(මනම්පිටිය - නිමල් ජයරත්න)

කොවිඩ් 19 ආසාදිතව දින ගණනාවක සිට ගෘහස්ථ නිරෝධායනය වන තමන්ට අවශ්‍ය ඖෂධ සහ ප්‍රතිකාර නිසිලෙස සෞඛ්‍ය අංශ මගින් නොලැබීමෙන් දැඩි අසීරුතාවයට පත්ව සිටින බව දිඹුලාගල - සිරිපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කොට්ඨාසවල රෝගීහු පවසති.

කොරෝනා වයිරසය ස්වභාවය මත තමන්ට වෙළෙඳ සැලකට ගොස් ඖෂධ ලබාගැනීමට තබා තම මුදල් ද ඇල්ලීමට ප්‍රතික්ෂේප කරන මොහොතක තමන්ට සෞඛ්‍ය අංශ මගින් අදළ ප්‍රතිකාර නොලැබීමෙන් මහත් භීතියට පත්ව සිටින බවද කොවිඩ් 19 රෝගයට ගොදුරුව නිවෙස්වල නිරෝධායනය වන පුද්ගලයින් රැසක්ම පැවසූහ.

රජය මගින් ලබා දෙන රුපියල් 10,000ක් වටිනා වියළි ආහාර පාර්සලයද දින 16ක් ගත වන තුරුම ලබා නොදුන් බව ඇතැම් පවුල්වල ගෘහස්ථ නිරෝධායනය වන පුද්ගලයෝ චෝදනා කරති.

කොවිඩ් 19 රෝගීන් නගන චෝදනාව පිළිබඳව අප දිඹුලාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලයේ දුරකතනයෙන් කළ විමසීමකදී එහි නිලධාරිනියක් පැවසුවේ අදළ බෙහෙත් පෙති වර්ග පොලොන්නරුව කාර්යාලයෙන් ලැබුණ විගස ලබාදීමට කටයුතු කරන බවයි.

එම කාලය තුළ එකී රෝගීන්ට දිනකට එක් වරක් හෝ වෛද්‍යවරයෙකු දුරකතනයෙන් කතා කර රෝගී තත්ත්වය විමසන බවත්, ඔවුන්ගේ අවශ්‍යතාවය අනුව ඕනෑම වේලාවක සෞඛ්‍ය අංශ මැදිහත්වීමට සූදානමින් සිටින බවද සෞඛ්‍ය සේවා කාර්යාලයේ එම නිලධාරිනිය වැඩිදුරටත් ප්‍රකාශ කළාය.

දැදුරුඔය වේල්ල උඩ අනතුරෙන් සිවුදරු පියා මරුට

(ගල්ගමුව - නිහාල් ජයවීර)

දැදුරුඔය ජලාශයේ වේල්ල උඩදී සිදු වූ රිය අනතුරකින් පනස් එක් හැවිරිදි සිවු දරු පියෙකු මියගොස් ඇතැයි මහව පොලිසිය කියයි.

යතුරුපැදියක් සහ අත්ට්‍රැක්ටරයක වේලරය ගැටීමෙන් මෙම අනතුර සිදුව ඇති බව පොලිසිය කියයි.

අනතුරෙන් මියගොස් ඇත්තේ මිනුවන්ගැටේ, වේරහැරයාගම පදිංචිව සිටි එල්.පී. සුගත් පියසිරි නමැති අය බව පරීක්ෂණවලදී හඳුනාගත් බව පොලිසිය කියයි.

මෙම සිව් දරු පියා යතුරුපැදියෙන් රාත්‍රී අටට පමණ සිය ගමට යමින් සිටියදී ඉදිරියෙන් පැමිණි අත්ට්‍රැක්ටරයේ වේලරයේ යතුරුපැදිය ගැටී බරපතළ තුවාල ලබා ඒ ස්ථානයේම මියගොස් ඇතැයි පොලිසිය කියයි.

යතුරුපැදියේ මෙන්ම අත්ට්‍රැක්ටරයේද පහන් දල්වාගෙන පැමිණ ඇති බවත් එහෙත් ඉදිරියෙන් පැමිණෙන්නේ අත්ට්‍රැක්ටරය බව යතුරුපැදිකරුට හඳුනා ගැනීමට නොහැකි වීමෙන් මෙම අනතුර සිදුවන්නට ඇතැයි පොලිසිය විශ්වාස කරයි. යතුරුපැදිය අත්ට්‍රැක්ටරයේ වේලරයේ ඇන්දක ගැටී පැදිකරු බිම වැටී අනතුර සිදුව ඇතැයිද පොලිසිය කියයි.

ගල්ගමුව 45 නැගෙනහිර කෝරළයේ දකුණ හදිසි මරණ පරීක්ෂක ඩබ්ලිව්.එම්. රත්නායක මහතා මෙහි හදිසි මරණ පරීක්ෂණය මහව දිසා රෝහලේදී පැවැත්වීය.

මහව පොලිසියේ පොලිස් කොස්තාපල් අරවින්ද මහතා (88652) මෙහි සාක්ෂි මෙහෙයවීය.

රාජාංගණයේ කොවිඩ් රෝගීන් 100ක් ගෙවල්වල

(මකුලෑව ලේකම්ගේ අනුර)

රාජාංගණය සෞඛ්‍ය සේවා බලප්‍රදේශයේ ශීඝ්‍රයෙන් කොවිඩ් ව්‍යාප්ත වෙමින් පවතින බවත් මේ වන විට රෝහල්වල සහ නිරෝධායන මධ්‍යස්ථානවල ඇති තදබදය නිසා තම සෞඛ්‍ය බල ප්‍රදේශයේ පමණක් නිරෝධායන වන පවුල්වලට අමතරව කොවිඩ් රෝගය වැලඳුණු රෝගීන් 100ක් තවම නිවාස තුළ නිරෝධායනය වන බවත් රාජාංගණය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෛද්‍ය අනුෂ්ක අනුරාධ පැවසීය.

සෞඛ්‍ය නිලධාරිවරයා මේ පිළිබඳ පවසා සිටියේ ඉකුත් 14වැනිද රාජාංගණය ප්‍රදේශයේ කොවිඩ් ව්‍යාප්තිය සම්බන්ධව වෛද්‍යවරයාගෙන් කළ විමසීමකදීය.

එම අවස්ථාවේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වැඩිදුරටත් මෙසේද කීය

මේ විදිහට කොවිඩ් රෝගය වැලඳුන රෝගීන් මෙතරම් ප්‍රමාණයක් නිවාස තුළ රැඳී සිටින බව ප්‍රදේශයේ බොහෝ පිරිසක් දන්නෙ නෑ.

ඒ විතරක් නෙවෙයි, මේ වන විට අපි කොවිඩ් රෝගය වැලඳී සිටින පුද්ගලයින්ගේ නිවාස සම්බන්ධයෙන් සහ නිරෝධායනය වන පවුල් සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් කටයුතු කළත් ඇතැම් පිරිස් ඔවුන්ට රෝගය වැළඳුණු බවක් හෝ ඔවුන් කොවිඩ් රෝගියකුගේ ආශ්‍රිතයෙකු වී නිරෝධායනය වන බවක් විවිධ හේතුන් නිසා සමාජයට වසන් කිරීමක්ද සුලභව දක්නට ලැබෙනවා. මේ තත්ත්වය ඉතා කනගාටුදායක කරුණක් නිසා ප්‍රදේශයේ සෑම අයෙකුම, නිතරම තමන් අසල සැරිසරන්නේ කොවිඩ් ආශ්‍රිතයෙකු බවට වන උපකල්පනයක් ඇතිකරගෙන ඒ සඳහා නිසි සෞඛ්‍ය ක්‍රමවේද අනුගමනය කරන්න යැයිද පැවසීය.

මිහින්තලේට පොල්පැළ

(අතුල බණ්ඩාර)

පොල් පැළ ලක්ෂ 40 ක් දිවයින පුරා සිටුවීමේ " දෙරින් දෙරට කප්රුක " ජාතික වැඩසටහන යටතේ මිහින්තලය ගොවිජන සේවා කාර්යාලයේදී පොල් පැළ බෙදා දීම රාජ්‍ය අමාත්‍ය දුමින්ද දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

"දෙරින් දෙරට කප්රුක " ජාතික වැඩසටහන මගින් ගෙඩි මිලියන 2800 ක් පමණ වන වාර්ෂික පොල් අස්වැන්න ගෙඩි මිලියන 3600 ක් දක්වා වර්ධනය කර ගැනීම ඉලක්කයයි,

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මිහින්තලය ආසන සංවිධායක, හිටපු පළාත් සභා අමාත්‍ය සරත් ඉලංගසිංහ, තිරප්පනය ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුර මෙන්ඩිස් හා චින්තන රුක්මන් යන මහත්වරුන් ඇතුළු ප්‍රාදේශීය දේශපාලඥයන් හා රාජ්‍ය නිලධාරීන්, ලංකා පොස්පේට් රාජ්‍ය සමාගමේ හිටපු සභාපති උපාලි අනුරාධ දිසානායක මහතා ඇතුළු ප්‍රදේශවාසීහු සහභාගී වූහ.

බාලවියේ කුඩු ගසා පුනරුත්ථාපනයත් වෙලා

මුහුණට මිරිස් කුඩු ගසා කතුන්ගේ මාල කැඩුවැයි සැකකරු මාට්ටු

(කුරුණෑගල විශේෂ අතුල පී. බණ්ඩාරනායක)

යතුරුපැදියෙන් ගොස් මහමග ගමන්ගත් කාන්තාවන් දෙදෙනකුගේ මුහුණට මිරිස්කුඩු ගසා රුපියල් 267000 පමණ වටිනා කරබැඳි රන් දම්වැල් 02ක් කොල්ලකෑ සැකකරුවෙකු පිහිඹුව ප්‍රදේශයේදී ඉකුත් 7 වැනිදා අත්අඩංගුවට ගත් බව රිදීගම පොලිසිය පවසයි.

සැකකරු යතුරුපැදියෙන් ගොස් පිහිඹුව හා වෑගම ප්‍රදේශයන්හි මහමග ගමන්ගත් කාන්තාවන් දෙදෙනාට මිරිස් කුඩු ගසා කොල්ලකෑ රන්දම්වැල් දෙක රුපියල් 150000 ක් හා 117000 ක් පමණ වටිනා බවත් කොල්ලකෑ රන්දම්වැල් දෙක සැකකරු විකුණා තිබියදී සොයා ගත් බව පොලිසිය කියයි.

අත්අඩංගුවට ගත් සැකකරු රිදීගම මහායාය ප්‍රදේශයේ පදිංචි 23 හැවිරිදි තරුණයකු බවත් මොහු පාසල් යන වියේදී හෙරොයින් පානයට ඇබ්බැහි වී සිටි අයකු බවත් රන් දම්වැල් දෙක කොල්ලකා හෙරොයින් මිලදී ගෙන ඇති බව පරීක්ෂණවලදී හෙළි වී ඇතැයි පොලිසිය පවසයි.

සැකකරු පාසල් වියේදී තදබල ලෙස හෙරොයින් පානයට ඇබ්බැහිවීම නිසා අධිකරණය මගින් පොලොන්නරුව කන්දකාඩුව පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ වසරක් පුනරුත්ථාපනය කළ සැකකරුවෙකු බව අනාවරණය වී ඇතැයි පොලිසිය කියයි.

භාණ්ඩ සමග අත්අඩංගුවට ගත් සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට පියවර ගන්නා බව පොලිසිය පවසයි.

කුරුණෑගල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ක්‍රිෂාන්ත ජයවර්ධන, සහකාර පොලිස් අධිකාරි (1) එස්.බී. දියකෙළිනාවල මහත්වරුන්ගේ උපදෙස් පිට රිදීගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක හේමන්ත සුභසිංහ මහතාගේ මෙහෙයවීමෙන් අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආර්.එම්. දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් උප පොලිස් පරීක්ෂක වයි. ජී.එස්.ඩී. යටවර, පොලිස් සැරයන්වරුන් වන කරුණාතිලක (30048), රූපසිංහ (13746), සූරසිංහ (49125) හා කුමාරතිලක (30235) යන නිලධාරීහු වැටලීමට එක්වූහ.

කලාඔයේ මී පැළ සිටුවයි

(පුත්තලම / එච්. චන්දන)

ශ්‍රී ලංකාවේ හමුවන පරිසර හිතකාමී ශාකයක් වන මී පැළ 200ක් පමණ වනාතවිල්ලුව කලා ඔය ද්‍රෝණිය ආශ්‍රිතව පාරිසරික සංවේදී කලාපයේ රෝපණය කිරීම ඉකුත්ද වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදු කළේය.

වනාතවිල්ලුව ප්‍රදේශීය ලේකම් මිලංග ප්‍රභාත් නන්දසේන මහතාගේ මූලිකත්වයෙන් මෙම සුවිශේෂී කාර්යය සිදු කෙරිණි.

දැනට ලෝකයේ පවතින මී විශේෂ හතෙන් හතරක්ම ශ්‍රී ලංකාවට ආවේණික අතර දිනය පුරාම ඔක්සිජන් සැපයීම මී ගසේ ඇති සුවිශේෂී ලක්ෂණයකි.

මෙම මී පැළ රෝපණ වැඩසටහන සඳහා වනාතවිල්ලුව ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ගයාන් රත්නමලල මහතා ඇතුළු කාර්ය මණ්ඩලය හා බහුකාර්ය ශ්‍රම බළකා පිරිස එක්වූහ.

සුබසෙතගම ගොවීන්ට කාබනික පොහොර පුහුණුව

කොබෙයිගනේ සුබසෙතගම ගම්මානයේ ගොවීන්ට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳව පුහුණුවක් ලබා දීමේ අරමුණින් කොබෙයිගනේ ප්‍රාදේශීය ගොවිජන සේවා මධ්‍යස්ථානය සංවිධානය කරන ලද ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් ඉකුත්ද සුබසෙතගම ප්‍රජා ශාලා භූමියේ දී පැවැත්විණි.

කොබෙයිගනේ ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරී ආර්.කේ.එස්.එස්. රාජපක්ෂ මහතාගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ කොබෙයිගනේ කොට්ඨාසය භාර කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරිනී ආර්.ඒ. සුමනාවතී මහත්මිය ඇතුළු ගොවිජන සේවා මධ්‍යස්ථාන නිලධාරීන් පිරිසක් විසින් මෙම ප්‍රායෝගික පුහුණු වැඩ සටහන මෙහෙයවන ලදී.

කොබෙයිගනේ නිමල් ප්‍රේමචන්ද්‍ර

මේ ලංකාදීප තාරුණ්‍යයේ පිටුවයි

නවරැල්ලට ඔබේ නිර්මාණ විද්‍යුත් ලිපිනය හරහාද එවිය හැකිය.
විද්‍යුත් ලිපිනය - nawarallawnl@gmail.com



විදෙස් නාට්‍ය ආක්‍රමණය කළ අපේ සොඳුරු ටෙලි කතා



ශ්‍රී ලංකාවේ ටෙලිනාට්‍ය කලාවේ උපත දිමුතු මුතු නම් සොඳුරු වූ ටෙලි කතාවකින් සිදුවූ බව අපගේ මතකයේ අදටත් මිහිදන්ව ඇත. අපේ රටට, අපේ සංස්කෘතියට උචිත අපේ පවුල් ඒවලට වඩාත් ගැළපෙන තේමාවන්ගෙන් සපිරි ටෙලි කතා ඒ පසු පස්සේ බිහි විය. අදටත් ඒවායේ සොඳුරු මතක සැමගේ සිත් මත ඉතිරිව ඇතිවා සේම උසස් රසවින්දනයක් ලබා ගැනීමේ හැකියාව ද ප්‍රේක්ෂකයාට නිතැනින්ම හිමි විය.

එහෙත් වර්තමානයේ රූපවාහිනී නාලිකා බිහිවීමේ ප්‍රවණතාවයත්, ඊට සමගාමීව පෙන්වනු ලබන ටෙලිකතා ප්‍රමාණයත් දිනෙන් දිනම වැඩි විය. ඒ අතරතුර ආක්‍රමණශීලී වෙසින් පැමිණි විදෙස් ටෙලි නාට්‍ය අපගේ සෑම සියලු නාලිකාවක්ම ඉතා ඉක්මණින් තම ග්‍රහණයට හසු කරනු ලැබීය. අද විදෙස් ටෙලි නාට්‍යයක් විකාශනය නොවන නාලිකාවක් සොයා ගැනීමට පවා අපහසුය.

ලෝකය එකම පියස්සක් යටට ගෙනා ගෝලීයකරණය ටෙලිනාට්‍යය කලාවට ද එකසේ බලපෑවේය. විදෙස් ටෙලි නාට්‍ය බැලීමට පහසුකම් නොමැති ඒ සඳහා ප්‍රියතාවයක් දැක් වූ ප්‍රේක්ෂකයාට එය මහඟු අවස්ථාවක් විය. භාෂාවේ දැනුම අඩු ප්‍රේක්ෂකයාට පවා අපගේ මවු භාෂාවෙන් හඬ කවන එම ටෙලි නාට්‍ය බැලීමට අවස්ථාව එයින් උදා විණි.

එහෙත් අද පවතින්නේ ඉතාමත් ශෝචනීය තත්ත්වයකි. විදෙස් ටෙලිනාට්‍ය විකාශනය සඳහා තෝරා ගැනීමේ දී අප විසින් භාවිත කරන්නේ කුමන මිනුම් දඬු ද යන්න ගැටලුවකි. සමහර ටෙලිනාට්‍ය නැරඹීමේ දී එහි කොටස් ගණන අප ජීවත්ව සිටිය දී නරඹා අවසන් කළ හැකි ද යන්න පවා ගැටලුවකි. එසේම සමහර පවුල් ඒ සම්බන්ධයෙන් විකාශනය වන ටෙලි නාට්‍ය නැරඹීමේ දී මෙම සිදුවීම් මිහිපිට සිදුවිය හැකිද? යනුත පවා සිතාගත නොහැකිය. එකම පවුලේ අඹුදරුවන් මවුපියන් සහෝදර සහෝදරියන් නෑයන් අතර සිදුවන කුමන්ත්‍රණ වෛරකාරී සිතුවිලි අනෙකා පරයා නැගී සිටීමට දරන වෑයම ඉතා පිළිකුල් සහගතය. පෙම්වතුන් පෙම්වතියන් අතර සිදුවන්නේ කුමන්ත්‍රණය. ආදරයෙන් එක්වීමක් දැකගත නොහැකිය. සමහර ටෙලි නාට්‍ය අපේ රටට අපේ සංස්කෘතියට ගැළපෙන්නේ දැයි නැවත වරක් සිතා බැලිය යුතු තත්ත්වයක් උද්ගතව ඇත.

පොදුවේ ගත්කළ මේ ටෙලිනාට්‍ය අපේ මනස විකෘති කර දමනු ලබයි. ටෙලි නාට්‍යයක් නැරඹීමෙන් අප බලාපොරොත්තු වන්නෙ යම්කිසි මානසික වින්දනයකි. එහෙත් මේ නාට්‍ය තුළින් ප්‍රේක්ෂකයාට එවන් සන්තෝෂජනිතයක් ලැබෙනවාදැයි සොයා බැලිය යුතු කරුණකි. තවද උසස් රස වින්දනයක් ලබා ගැනීමට හැකි ටෙලිනාට්‍ය තෝරා ගැනීමට හැකියාව තිබියදීත් අප යන්නේ මංමුළා වූවන්සේය. ඒ තුළ උසස් නිර්මාණයක් රසවින්දනය කිරීමට ප්‍රේක්ෂකයාට තිබෙන අයිතිය මගහැරී ඇත.

ශ්‍රී ලාංකික බොහෝ ප්‍රේක්ෂකයන් මෙම ටෙලිනාට්‍ය නරඹන බව නොරහසක් නොවේ. අපේ රට තුළ පවුල් අතර සිදුවන අපරාධ වගේම සමාජීය වශයෙන් සිදුවන විවිධ අපරාධවලට මෙම කතා පාදක නොවනවා සේ සිතිය නොහැකිය. ඒ වගේම තරුණ පරපුර නරක ඇබ්බැහිවීම්වලට යොමුවීමට පවුල් ඉතිරීම්වලට, ළමා හිංසනයන්ට වැනි සමාජ පරිසරයක් තුළ නොසිඳු විය යුතු බොහෝ කරුණුවලට මෙම ටෙලිනාට්‍ය කතා මුල් නොවනවා සේ සිතීමට අපට කරුණු කාරණා නොවේ.

අපට පෞඪවත් ඉතිහාසයක් උරුමව තිබේ. හොඳ සංස්කෘතියකට උරුමකම් කියන අපිට පවුලේ බාල මහලු වැඩිහිටි සියලු දෙනා විසින් එකට නැරඹිය හැකි අපේ රටේ සොඳුරු ටෙලිනාට්‍ය කලාවක් ද දායාදව තිබේ. එහෙත අද, ඒ සොඳුරු ටෙලිනාට්‍යවලට සිදු වූයේ කුමක්ද? යන්න සිතෙන විටත් හද කම්පා කරයි. ඔබට මට අමතක කරන්න බැරි අපේ රටේ සොඳුරු ටෙලිනාට්‍ය වූ යශෝරාවය, ගම්පෙරළිය, දූ දරුවෝ අසලවාසියෝ දඬුබස්නාමානය වැනි ටෙලිනාට්‍ය අදටත් අපේ සිත් තුළ මහා දාවැන්තයන් ලෙස අරක් ගෙන සිටී. එහෙත් අද, එවන් උසස් නිර්මාණ රසවිඳීමට ප්‍රේක්ෂකයාට තිබෙන අයිතිය කුමක්දෝ බලවේගයකින් අහිමිවී ඇත.

අද එවන් සොඳුරු උසස් රසවින්දනයක් සහිත කතා විකාශය වීමේ අඩුවක් දක්නට ලැබේ. සමහර ටෙලිනාට්‍ය විදෙස් ආභාෂය ලබා ඇත. අපේ සංස්කෘතියට ගැළපෙන නිර්මාණ බිහිවීමේ අඩුවක් දක්නට ඇත. උසස් රසවින්දනයක් ලැබීමට නම් උසස් ගුණාත්මක බවින් යුත් නිර්මාණ බිහිවිය යුතුය. අද වළපල්ලට යමින් පවතින්නේ අපේ මේ උසස් නිර්මාණයන්ය. එබැවින් එය රැක ගැනීමටත් මතු පරපුර වෙනුවෙන් ආරක්ෂා කරදීමේ වගකීම අප සතුය.

ධවල පත්‍රිකාව...
ශ්‍රීමානි ප්‍රියංගිකා,
විහාරගොඩ, බදුල්ල

මල් කැකුළු පිපෙන්නට ඉඩ දෙන්න

යම් රටක දරුවන් හද වඩා ගන්නා ආකාරයත් අධ්‍යාපනය පෝෂණය, සෞඛ්‍යය සහ රැකවරණය ලබා දෙන ආකාරයත් එරට අනාගත පැවැත්ම තීරණය වේ. වර්තමානයේ කුඩා දරුවා අනාගතයේ රට පිළිබඳව වගකීම් දරන්නෙකි. 'ළමයා වනාහි ඉදිරි කාලයේ බිහි වන මිනිසාය' යනුවෙන් ඇරිස්ටෝටල් පඬිතුමා ළමයාව අර්ථවත් කළේ එබැවිනි. රටේ කොඳුනාරටිය තරුණ පරපුර නම් රටේ ජීවනාලිය ළමා පරපුරයි. රටේ ජීවය බඳු දරුපරපුර විවිධ උවදුරුවලින් ආරක්ෂා කිරීම වර්තමානයේ මවුපියන් සතු අභියෝගයකි.

සමාජය යනු විචාරවූත් අවිචාරවූත් සංකලනයකි. සමාජයේ වෙසෙන මිනිසුන් සුදු කළු යනුවෙන් ඉරි ගසා වෙන්කළ නොහැකිය. සෑම සමාජයකම දක්නට ලැබෙන්නෙ අළු පැහැති චරිත ගත් මිනිස්සුය. යහපත අබිබවා අයහපත ග්‍රහණය කරන සමාජයක ළමයා යනු නොමේරූ තැනැත්තෙකි. ළමයා කිසි විටෙක කුඩා මිනිසෙකු නොවන අතර ඔහු හෝ අය කායිකව හා මානසිකව යැපෙන්නෙකි. එනම් සම්පූර්ණයෙන් අනුන් මත ජීවත් වන රැකවරණය හා සෞඛ්‍යය විවිධ පීඩාවන්ට ගොදුරු විය හැකි තැනැත්තෙකි. එවැනි ළමයි මල් කැකුළු වැනිය. අවුරුදු 18 ට අඩු සෑම අයෙකම 'ළමයා' නම් වන බව ළමා ප්‍රඥප්තියේ සඳහන් වේ. යැපෙන මානසික තත්ත්වයේ සිට ස්වාධීන මානසිකත්වයට යාමට ගතවන කාලය 'ළමාවිය' නම් වේ. මිනිසාගේ ළමාවිය සෙවණැල්ලක් මෙන් ජීවිතය පුරා ක්‍රියාත්මක වෙයි. එහි ඇතැම් සිදුවීම් මිනිස මනසට තදින් බලපෑම් කරයි. එහි ප්‍රතිඵලය වශයෙන් ඔහුගේ ජීවිතය යහපත් හෝ අයහපත් වීමට පසුකාලීනව බලපෑම් කරයි. 'අපයෝජනය' යනු වරදෙහි යෙදවීමයි. එනම් දරුවන් වෙනුවෙන් සිදු කළ යුතු දේ නොකිරීමත, නොකළයුතු දේ සිදු කිරීමත් අපයෝජනය නම් වේ. කායිකව, මානසිකව, ලිංගිකව යනාදී තුන් ආකාරයෙන්ම අපයෝජනයට ළමයා දෙදිනිකව ගොදුරු වන බැවින් විනාශ වන්නේ මෙරට අනාගත පරපුරයි. මෙයට හොඳම උදාහරණය වන්නේ මෑතකදී අන්තර්ජාලය ඔස්සේ අලෙවි කළ බලා වයස්කාර දැරියට ලිංගික අපයෝජනය සිදු කිරීමේ ආන්දෝලාත්මක සිදුවීමයි.

ළමා අධිකාරියට ලැබෙන පැමිණිලි අනුව බහුල වශයෙන්ම අපයෝජනයට ගොදුරු වන්නේ යොවුන් වියේ පසුවන දරු දැරියන්ය. යොවුන් විය යනු වයස අවුරුදු 11- 18 අතර කාල සීමාව වේ. එය දරුවා වැඩිහිටියෙකු බවට පත්වන සංක්‍රාන්තික කාල සීමාවක් ලෙස සැළකේ. මෙහිදී, ශාරීරික වෙනස්කම් සමඟ ඇතිවන මානසික තත්ත්වයන් හමුවේ බොහෝ දරුවෝ හුදකලා අරගලයක යෙදෙති. ඔවුහු කුතූහලය හා විරුද්ධ ලිංගික ආකර්ශනය මත අලුත් දෑ සොයා යාමත්, විවිධාකාර අත්දැකීම් සමාජය තුළින් ලබා ගැනීමටත් වෙහෙසෙති. තමා වැඩිහිටියෙකු ලෙස සිතීමට පෙළඹීම නිසා විවිධාකාර රැවටීම්වලට ගොදුරු වෙති. බොහෝ ළමා අපචාර සිදු වී ඇත්තේ සමීප පුද්ගලයනගෙන් වීම විශේෂත්වයකි. එනම් දරුවාගේ විශ්වාසය දිනාගත් තාත්තා, මීයා, බාප්පා, සුළුප්පියා, මාමා, මස්සිනා, සහෝදරයා යනාදී ඥාතීත්වයක් ඇති අයගෙන් මෙන්ම ඇසුරු කරන පුද්ගලයන් වන අසල්වැසියා, යහළුවා, ගුරුවරයා, විදුහල්පතිවරයා හා ප්‍රජා පක්ෂය අතින්ද අපයෝජනයටත්, දූෂණයටත් ලක්වේ. එසේම යොවුන් දැරියන් ප්‍රේම සබඳතා පැවැත්වීම හේතුවෙන් තම පෙම්වතා අතින් දූෂණයට ලක් වේ. බොහෝ විට ළමයින් අපයෝජනයට ලක් කර ඇත්තේ රැවටීමෙන හෝ බිය ගැන්වීමෙනි. වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකුගේ කැමැත්ත ඇතිව හෝ නැතිව කායිකව එක් වීම 'ස්ත්‍රී දූෂණයක්' ලෙස අර්ථ දැක්වෙයි. ස්ත්‍රී දූෂණයක් නොවෙන වෙනත් ආකාරයේ ලිංගික අතවර ලිංගික අපයෝජන නම් වේ.

කුමුදු සංජීවනී පෙරේරා
සිංහල ඩිප්ලෝමාධාරී, කොළඹ විශ්වවිද්‍යාලය

මෙම වැරදිවලට බරපතළ වැඩ ඇතිව අවුරුදු 20 දක්වා සිරගත කළ හැකිය. ලජ්ජාව, බිය සහ ගෞරවය හේතුවෙන් ඇතැම් ළමා අපචාර නීතිය ඉදිරියට නොගොස් නිහඬව විඳ දරා ගැනීම කිසිසේතම යහපත් තත්ත්වයක් නොවේ. එය අපයෝජකයාට තව තවත් අපරාධ කිරීමට රුකුලක් වනු ඇත.

යම් අවාසනාවකට තම දරුවා අපයෝජනයට ගොදුරු වී ඇති බව මවුපියන්ට අවබෝධ කර ගත හැක්කේ දරුවාගේ අමුතු හැසිරීම් මතය. එනම් දරුවා එකවර නිහඬවීම, කල්පනා බරිත වීම, නිවසේ සමාජිකයන් ඇසුරු කිරීමට අකමැති වීම, යමක් ප්‍රකාශ කිරීමට උත්සාහ කිරීම, හුදකලාවීම යනාදී චරයා ඉඟි තුළින් අවබෝධ කොටගත හැකිය. මෙහිදී ඔබ ඉතාමත් බුද්ධිමත් අයුරින් ප්‍රතිචාර දැක්විය යුතුය. කිසිවිටෙක නීතිය ඔබ අතට ගැනීම සිදු නොකළ යුතුය. ළඟම පොලිස් ස්ථානයට හෝ ළමා ආරක්ෂක අධිකාරියට එම අපයෝජනය වාර්තා කරන්න. එසේම මනෝ වෛද්‍ය උපදේශනද ලබා ගන්න.

ළමාවියේ පටන් තම දරුවා බෙහෙවින් ආරක්ෂා කිරීම මවුපියන් සතු යුතුකමක් හා වගකීමක් වන්නේය. බොහෝ වැරදි සිදුවන්නේ නොදැනුවත්කම හා නොසැලකිලිමත්කම හේතුවෙනි. තම 'ආසා දෙකමෙන්' දරුවා තමා සමීපයේ රඳවා ගනිමින් කල්පනාකාරීව රැක බලා ගත යුතුය. යොවුන් වියේ වෙසෙන දරුවා නුවණින් කල්පනා නොකර හැඟීම්වලට වශඟ වී ක්‍රියා කරන බැවින් එම දරුවන් කෙරෙහි පූර්ණ විශ්වාසයක් තොතබා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. එසේම තම දරුවාට අධ්‍යාපනය පමණක් නොව සමාජ අවබෝධයක්ද මවුපියන් විසින් දරුවාට කියා දිය යුතුය. අනවශ්‍ය සංවේදී පුද්ගලයෙකු ලෙස දරුවා හැඟි නොගැස්වීම, දරුවා මුහුණ පෑමට සිදුවන හිංසනවලට එරෙහිව සටන් කිරීමට හුරුකිරීම, දරුවා ඇසුරු කරන පුද්ගලයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම, දරුවා සමඟ එදිනෙදා තොරතුරු හුවමාරු කර ගැනීම, නවීන තාක්ෂණය පිළිබඳ නිසි අවබෝධයකින් පසුවීම, කිසිවිටෙක අන්‍යයන් ඉදිරියේ දරුවා තනි නොකිරීම යනාදී ආරක්ෂිත පියවර ගැනීමෙන් තම දරුවාට අපයෝජනයෙන් තොර සොඳුරු ළමා වියක් උරුම කර දීමට හැකි වනු ඇත. තම දරුවන්ට වඩාත් සුන්දර ළමාවියක් නිර්මාණය කරමින් ඔබ ලබන සතුට මෙලොව උත්තරීතරම සතුටයි.

හැඩ තිබුණට වැඩක් නැතේ

නූතනයෙහි මහමග ගමන් කරන විට වාහනවලින් පිටවෙන ගොරහඬි අධික නළා ශබ්ද දෙකන්වලට, මනසට විඳදරා ගත නොහැකි අයුරින් නිකුත් කෙරේ. මෙය මහමග ගමන් කරන උදව්යට මහත් හිසරදයකි. ඇතැම් වාහනවලින් නිකුත් වෙන ශබ්දය ඊට නොදෙවෙනිය. වාහනයක් ආනයනය කිරීමේදී එයට ගැළපෙන සරලන නළාවක් මෙන්ම වාහනයට උචිත ශබ්දයක් නිකුත් වනසේ නිෂ්පාදනය කර තිබීම නොරහසකි.

තම සිතැඟි පරිදි එය වෙනස් කළ හැකිද? 'විසිල් තිබුණට බලලි හැතුව වැඩක් නැත' යනුවෙන් සමාජයේ කියමනක් තිබේ. මාර්ග නීති පිළිනොපැද අධික ශබ්ද නිකුත් කිරීමෙන් පලක්වේද? මසක් තුළවූ රිය අනතුරුවලින් හැත්තෑවකට වැඩි පිරිසක් මිය ගිය බව අනාවරණය විය.

මහමඟ ධාවනය වන වාහනවල ගුවන් ගියර් පද්ධතියක් නැත. එනිසා ගුවනින් පියාසර කිරීමට නොහැක. අදාළ මාර්ගයෙහි ධාවනය කළ යුතු වේග සීමාවක් පනවා ඇත. මාර්ග නීති අනුගමනය කර රිය පදවන්නේ නම් බොහෝදුරට අකාලයේ රිය අනතුරුවලින් මෙලොව හැර යෑමට සිදු නොවේ.

අකාලයේ මෙලොව හැර යෑම ගැන අනාවරණය වන දැවලින් රිය අනතුරුවලට ප්‍රධාන තැනක් හිමි වේ. ප්‍රථම මාරක රිය අනතුරක් ලෙස එකල රෝද, දෙකේ අශ්වකරත්තයකින් ගමන් කරමින් සිටි එළාර රජුගේ පුතු ධාවනය කළ රථයට වසුපැටවෙකු හසුවී මිය යෑම මෙන්ම 1797 ජූලි මස කොළඹ හමුදාව බාරව කටයුතු කළ කර්නල් බොනාවො මහතාගේ රථය පෙරළීම නිසා ඔහු මිය ගිය බව පොතපතෙහි සඳහන්වේ. 1806 දී ප්‍රථම ගැසට් නිවේදනය නිකුත් කරමින් සියලුම වාහන මාර්ගයෙහි වම්පැත්තෙන් ගමන් කළ යුතු බවට නියෝග පැනවීය. සොබාදහමෙ සුන්දරත්වයන් ඔප්නංවමින් පරිසරයට උරුමකම් කියන අතැම් සත්ත්ව සමූහයන්ගේ නාදයන් සුමිහිරි නාදරටා මවමින් නෙතට සුන්දරත්වයක් මෙන්ම කනට මිහිරක් ලබා දෙමින් මවන නාදයන් කෙතරම් මිහිරියි ද එයට අකමැති අයෙක් ලොව නැති තරමිය.

වෘක්ෂලතා ආදිය එකිනෙකට ඇතිල්ලෙන මැදෙන ශබ්දය කනට කෙතරම් ප්‍රිය උපදවයිද ශබ්දෙ රාවලින් මිනිස් මොළයේ අභ්‍යන්තරයේ ඇතිවෙන බීටා නීටා ඊටා ඇල්ෆා යන

එන්.කේ. අබේවර්ධන
කුරුණෑගල

තරංගවලින් මිනිසාට යහපත් වූ සුවදායක තරංගය ලෙස ඇල්ෆා තරංගයට ප්‍රධාන තැනක් හිමිවේ. මෙම සොඳා දාමේ අසිරිය ඔප්නංවන ශබ්දරාවන් මිනිස්මොළයට දැනෙන්නේ ඇල්ෆා තරංග අයුරිනි. ඇල්ෆා තරංගවලින් මිනිස් මොළයේ මනෝභාවයන් නිරවුල් වන බව පොත පතෙහි සඳහන්වේ. අප බෙහෙත් හෙත් යනුවෙන් හඳුන්වන වැකියෙහි හේත් යනු වෙන් සඳහන් වන්නේ සාංකාව, මානසික පීඩාවන් දුරුකර ගැනීම සඳහා ශ්‍රවණය කරන සංගීතයයි. උදාහරණ ලෙස පන්සලෙ බෝධි ප්‍රජාවෙන් නිකුත්වෙන හඬ බෝධීන් වහන්සේගේ බොපත් සෙලවෙන හඬ මෙන්ම සරල සංගීතය මගින් ඇල්ෆා තරංග ඔස්සේ මානසික සුවතාවය මෙන්ම මානසික ප්‍රබෝධය ආධ්‍යාත්මික ගුණවගාව වැඩිදියුණු වන බව ඇතැම් දැවල විස්තර වේ.

මිනිස් සිතේ සිතිවිලි ඉතාමත් නිදහස් නිවහල් සංඥා සිතිවිලි බවටත් පරිවර්තනය කරනනා වූ සංසිද්ධි පද්ධතියකි. මෙතැන් සිට ඇත්තෙ ජනප්‍රවාදයේ එන කතාවකි. පොල්කිච්චකු තල්ගසක අත්තක සිට අප්‍රමාණ සැප ගන්ඩ ගන්ඩ ඉහළ සිටින සැමටත් පහළ සිටින සැමටත් මටත් මගෙ දරුවන්ටත් බුදුසරණයි දෙවිපිහිටයි හුයියො හුයියො යනුවෙන් ඉතා මිහිරිව ගීතයක් ගයන්නාක් මෙන් හඬ නැගුවේය. එය ශ්‍රවණය කරමින් සිටි අයෙකු තල්අත්තට බොරලු පසවලින් දමා ගැසුවේය. පොල්කිච්චාට මදක් කේන්ති විත් අයියො පීවං අයියො පීවං යනුවෙන් නාදකරමින් ඉගිලී ගියේය.



චිත්‍රය

ඔහු හබරළ කොළය යට
මම කෙසෙල් අතු කුඩය යට
තෙත බරියං වූ සරම හා ගවුම
රබර් පට්ටය හිරවුණු පොත් මිටිය
මඩ මිරිකුණු ඇඟිලි කරු
සමඟ ගියෙ පාසලට
දෙකට නැමුණු ගෝනියක් ඉහේ දැගෙන
ආවේය මුල්ගුරු වේවැල ද අතැතිව
ඇස් කරකවා බලා සිටි කොත
බාගයක්වත් නෑ ළමයි අද
අඳින්න චිත්‍රයක් වැසි දිනක
දිය සායම් පෙට්ටි
අල්ලා වැහි වතුරට
වැතුරුණා පංතියේ බිම කෙළවර
අණ්ඩ දැමූ පොල්ලතු වහලයට
වැටුණි අඹ අත්තකුත්
වතුර බේරෙන තැනට
තියමු මැටි වළඳක්
'කෝ බලන්න ළමයි ඇඳි සිතුවම්'
එසවුණා ඉහළටම
නැගුණි අත්පොළසන් නාදයක්
දිය සායම් තැවරුණු ගවුම
බලා හිඳියි නියපොත්ත විකමින්
හබරල කොළ ද කෙසෙල් අතු ද
වැටී ඇත කොට බිත්තියෙන් පහළට
මේසයට බර දී මුණුපුරා
අඳියි සිතුවමක් වැසි දිනක
ඔන්ලයින් පාඩමට
පිට රැඳි පොත් බෑගය ද සමඟින්
සිත තබා වැහි කබා
දෙපතුළට පොරෝගෙන
දේදුනු පාවැති කුඩයට ද මුවාවී
පාසලට යන කලට
කාපට් පාර මත වැටුණු වැහි වතුර
ගලා යයි කාණුවට සීරුවට
තැනින් තැන පාරටම ඇලුණු කොළ
කැබැලි
තිරයෙන් එබී හිනැහුණා ගුරුතුමිය
ඔසවා ඇඟිල්ල මහපට
එක්සලන්ට් වෙල්ඩන්

ඩබ්ලිව්.එම්.කේ. මැණිකේ,
හෙට්ටිපොළ.

තනි කවිය

බකමූණෙකු හැඬුවා හිඳ අඹ අත්තේ
මයිනා නැතිව මයිනිය තනියම වත්තේ
පාලුව මකන රූසිගෙ හඬ නැත්තේ
අමවකදත් කළ එළියයි පිළ පැත්තේ

පී. ඉනෝකා සංජීවනී,
පුත්තලම.

දුබලයා

තමා
තමා දෙස
නොබලා
අනෙකා දෙස
බලමින්
සිනාසීම

කරුණාරත්න අත්තනායක,
ගල්ගමුව.

හිර ගෙදර

අත රැඳුන ආයුදය
එල්ලකර සතුරාට
යළිත් එය බිම දැමුවෙ
සිහිවෙලා සිපිරිගේ
සිත් රැහැන් බිඳදමා
නෙත් සලා බැලුසඳ
මා හිටියෙ පෙර සේම
සිපිරිගෙයි සිටි තැනම

ලිල් චන්ද්‍රසිරි,
නැගම්පහ.

අදත් තනියම ඈ තමයි

ඇඩක් පිර වූ මදු බඳුන්
එකට ඔසවා පුරා සවිදිය
තොලගාමින් කී රස කතා
පණ උනත් දෙන යාළුවෝ
තාවකාලික විරුවන්ගෙ ලෝකේ
සමාජ ආර්ථික දේශපාලන
ඕන දේකට ක්ෂණික විසඳුම්
නිකරුණේ දැල්වෙනා දුම්වැටි
අළු බඳුන් ඔහෙ පිරී යද්දී
ගෙවූ කාලය හෝරා ගණනින්
සිතුණි මෙයමයි ජීවිතේ
දියව ගිය ජව බලය
ඇට සැකිලි ශරීරය
හොවා සයනය මතට
බට ගසා මුව දෙර වසා
වේදනාවේ දුබල කෙඳිරිය
පහන්සිල වැනි තෙල් නිමා වූ
එද සිටි හිතවතුන් අද නැත
සුසුම් හෙලනා දයාබර ඈ
ඇත එදා මෙන්
අදත් තිනියට...



තිලක් අතපත්තු,
වාරියපොළ.

තේ කඩේ නංගි

දුවු දුවු සැමට ඔබේ
සුන්දර
සිනහ නැගේ
විටකදී පෙනෙනවා
කඩිසර
හෙට ගැන හිතා වැඩ
කරනා
අයුරු අගේ
ඔට හරි දුකයි තේ
කඩයේ
වීටි නගේ



සිරිල් මදුරප්පෙරුම,
කුලියාපිටිය පාර,
මූණමල්දෙනිය.

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 අගෝස්තු මස 18 වැනිදා බදාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.

තලවකැලේ බස්පොළ ගොඩනැගිල්ලේ තට්ටු දෙකක් සභාපති හිතුමතේ වහලා

බස්පොළ වේලා සටහන්කරුවන්ගෙන් චෝදනා

(නෝර්වුඩ් රංජිත් රාජපක්ෂ)

තලවකැලේ නගර මධ්‍යයේ පිහිටි බස් නැවතුම්පොළ ගොඩනැගිල්ලේ දෙවැනි සහ තෙවැනි මහල තලවකැලේ ලිඳුල නගර සභාවේ සභාපතිවරයා විසින් කිසිදු හේතුවක් නොමැතිව වසා දැමීම හේතුවෙන් තමන් ගැටලු රැසකට මැදිවී ඇති බව එම බස් නැවතුම්පොළේ රාජකාරි කටයුතු සිදු කරන ලංගම සහ පෞද්ගලික බස් රථවල වේලා සටහන්කරුවෝ චෝදනා කරති.

2015 වසරේ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ රුපියල් කෝටි හයක ප්‍රතිපාදන යටතේ එම අංගසම්පූර්ණ බස් නැවතුම්පොළ ඉදිකර තලවකැලේ ලිඳුල නගර සභාව වෙත භාර දී ඇත.

පළමු මහල මගීන් සඳහා වෙන් කර තිබුණද නගර සභාව විසින් පළමු මහලේ මගීන්ට අවතීර වන සේ වෙළෙඳසැල් ඉදි කර ඇති බවත්, දෙවැනි මහල වේලා සටහන්කරුවන්ගේ කාර්යාලය, රියැදුරන්ගේ විවේකාගාර සහ ආපන ශාලාවක් සඳහා වෙන් කර ඇත.

තුන්වැනි මහල නැරඹුම් මැදිරියක් ලෙස පවත්වාගෙන යාමට සැලසුම් කර ගොඩනැගිල්ල ඉදි කර ඇත.

පවත්නා තත්ත්වය මත තම කාර්යාල පවත්වාගෙන යාමට නොහැකි බවත්, බස් රථවල රියදුරන්ට විවේක ගැනීමට අවස්ථාව නොලැබී ඇති බවත්, එම බස් නැවතුම්පොළේ වේලා සටහන්කරුවෝ සහ රියැදුරෝ කියා සිටිති.

මේ සම්බන්ධයෙන් තලවකැලේ ලිඳුල නගර සභාවේ සභාපති එස්. භාරතිදසන් මහතාගෙන් කළ විමසුමකට ඔහු කියා සිටියේ බස් නැවතුම්පොළේ දෙවැනි සහ තෙවැනි මහලේ නීති විරෝධී ක්‍රියාවන් සිදු වන බවට තමන්ට පැමිණිලි කිහිපයක් ලැබී ඇති නිසා එම දෙවැනි සහ තෙවැනි මහල් තාවකාලිකව වසා දැමීමට පියවර ගත් බවයි.

බස් නැවතුම්පොළේ සවි කර ඇති ආරක්ෂිත කැමරා පද්ධතියද ක්‍රියා විරහිත වී ඇති බව තලවකැලේ ලිඳුල නගර සභාවේ සභාපතිවරයා වැඩි දුරටත් පැවසීය.

ජනපති දුන් උපදෙස් රාජ්‍ය නිලධාරීන් තුට්ටුවට දැලා

පුරන් කුඹුරක කෙසෙල් කොට එල්ලා පෝප්පිටියේ හේන් ගොවීහු විරෝධතාවේ

(කටුගස්තොට - ධම්මික ගුණවර්ධන)

"මීමුරේ" පැවිති "ගම සමග පිළිසරණක්" වැඩසටහනේදී හේන් ගොවිතැන සඳහා පවතින බාධක ඉවත් කරන ලෙස අදළ රාජ්‍ය නිලධාරීන්ට ජනාධිපතිවරයා දුන් උපදෙස් මෙතෙක් ඉටු නොකළ බවට චෝදනා කරමින් උඩුදුම්බර පෝප්පිටියේ හේන් ගොවීහු පසුගියද (15) පස්වරුවේ පෝප්පිටිය ගම්මානයේදී විරෝධතාවයක නිරත වූහ.

පවතින කොරෝනා ව්‍යසනය හමුවේ දැඩි සෞඛ්‍ය ආරක්ෂිත පිළිවෙත් අනුගමනය කළ පෝප්පිටිය හේන් ගොවීහු, තම විරෝධය වෙනුවෙන් දැනට පුරන්ව පවතින හේනක් ඉදිරිපිට කෙසෙල් කඳන් තබමින් එහි විරෝධතා පුවරු එල්ලා මෙම විරෝධතාව පළ කළහ.

එහිදී අදහස් පළකළ හේන් ගොවීන්, තම භුක්තිය හිමි පාරම්පරික හේන් ආශ්‍රිතව සිය වගාවන්ට වනජීවී දෙපාර්තමේන්තුව මගින් දැනට ඉඩකඩ ලබා නොදීම හමුවේ මෙම ගැටලුසහගත තත්ත්වය උදාවී ඇති බවත් එය නිරාකරණයට ජනාධිපතිවරයා දුන් උපදෙස් වහා ක්‍රියාත්මක කරවන ලෙසත් වැඩිදුරටත් ඔවුහු ඉල්ලා සිටියෝය.

උඩදුම්බර පෝප්පිටිය හේන් ගොවීන් කෙසෙල් කඳන් සිටුවා සිය වගාවන්ට ඇති බාධක වහා ඉවත් කරන ලෙසට උද්ඝෝෂණය මෙහෙය වූ අයුරු

හත්ලාහ බෝක්කුවේ හිරවූ ගල් ඉවත් කරයි

හත්ලාහ බෝක්කු පාලම යට ඇළේ අවහිර වූ ගල් යන්ත්‍රානුසාරයෙන් ඉවත් කරනු ලැබූ අයුරු

(ගිනිගත්හේන ජී. ගමආරච්චි)

තද වැසි හේතුවෙන් ඇළක් දිගේ ලොකු ගල් ගහගෙන විත් ගිනිගත්හේනේ රංජුරාව-හොරකඩ බස් මාර්ගයේ හත්ලාහ බෝක්කු පාලමක් අවහිරවී ජල කඳ ගලා යාමෙන් මාර්ගයටද අවහිරදයක වූ බැවින් අඹගමුව ප්‍රාදේශීය සභාව වහා ක්‍රියාත්මක වී එම ගල් ඉවත්කර එය යථා තත්ත්වයට පත් කරන ලදී.

එම බෝක්කු පාලම අවහිරවීම පිළිබඳව දැනගත් වහාම අඹගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති ජයසංඛ පෙරේරා හා එම සභා මන්ත්‍රී ඉන්දික දෙරකුඹුර මහත්වරුන් එම ස්ථානය පරීක්ෂාවට ලක්කර රංජුරාව - හොරකඩ මාර්ගයේ බෝක්කු පාලමට අවහිරව තිබූ ලොකු ගල් ඉවත්කර එම ස්ථානය යථාතත්ත්වයට පත් කරවීමට පියවර ගනු ලැබීය.

'මහවැලි' ගොවි සමාජයෙන් කාබනික පොහොර හදයි

කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබූ අයුරු.

අඹගමුව ප්‍රාදේශීය සභාවේ සහාය ඇතිව ගිනිගත්හේන ගොවිජන සේවා මධ්‍යස්ථානයේ මෙහෙයවීමෙන් සෙල්ලිපිගම මහවැලි ගොවි සමාජය මගින් කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් පසුගියද ආගරඔය ගම්මානයේදී ආරම්භ කරන ලදී.

එම අවස්ථාවට ගිනිගත්හේන ජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම පර්යේෂණ සහකාර සිරිමල් රත්නප්‍රිය මහතා ඇතුළු සෙල්ලිපිගම හා ආගරඔය යන ගම්මාන දෙකේ ගොවීන් පිරිසක් සහභාගි වූහ.

(ගිනිගත්හේන ජී. ගමආරච්චි)

අපිට යන්න තැනක් නෑ: මේ කන්දත් නාය යනකල් බලධාරීන් බලා ඉන්නවා

කන්දෙවත්ත නාය අවදානමෙන් පවුල් 30ක හීන බොදවෙලා

ගම්මානයේ භූමිය පුපුරා ඇති අයුරු

පස්වලින් නිවාස යට වී ඇති අයුරු

(ගම්පොළ - සුරංග රාජනායක)

වැලිගල්ල, වේගිරිය, කන්දේවත්ත ගම්මානය නාය යාමේ අවදනමකට ලක්වීම සමග පවුල් 30 ක් දැඩි බියට පත්ව ඇතැයි ඔවුහු පවසති.

මෙම ගම්මානයේ නිවාස 14 ක භූමිය ඉරි තැලීම් හා පස් කඩා වැටීම්වලට ලක්ව ඇති අතර ඇතැම් නිවාස පස්වලින් යටවී ඇත.

මෙවැනි දැඩි අවදනමක් ඇතත් මේ වනතුරුත් එම නිවැසියන්ට තම නිවාසවලම වී සිටීමට සිදුව ඇති බව ඔවුන් පවසන්නේ ආරක්ෂිත ස්ථානයකට යාමට නොමැති බව පවසමිනි.

මෙම ගම්වැසියන් පවසන්නේ වර්ෂාව පැවැති අවස්ථා තුනකදීම මෙම ගම්මානය නාය යාමේ අවදනමට පත්ව ඇති බවයි. ඒ 2006, 2016 හා 2021 වර්ෂාවන්ටයි.

ඒ සෑම අවස්ථාවකම බලධාරීන්ට ඔවුන්ට පදිංචියට සුදුසු ඉඩමක් හෝ නිවෙසක් ලබා නොදීම නිසා ඔවුන්ට යාමට තැනක් නොමැති බවද සඳහන් කරයි.

ගමට ඉහළින් ඇති කන්දේ ඉරිතලා ගස් ඇලවී ඇතත් තම ගමද සාමසාරකන්ද ලෙස නාය යනතුරු බලධාරීන් බලා ඉන්නා බවද මෙම ගම්වාසීහු චෝදනා කරති.

මේ පිළිබඳව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයා පැවසුවේ ගොඩනැගිලි පරේක්ෂණ ආයතනය හා භූවිද්‍යා අංශය පැමිණ පරීක්ෂණ සිදුකළ බවත් අවදනමට ලක්වූවන්ට නිවාසවලින් ඉවත්ව යන ලෙස දැන් වූ බවත්ය. ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් සිටින බවයි.

මේ අතර උඩුනුවර ආසන පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතාද මෙම නාය අවදනම පරීක්ෂාව සඳහා මෙම ගම්මානයට පැමිණි අතර මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමග සාකච්ඡා කොට විසඳුමක් ගන්නා බව

ගලබොඩ තරුණ තරුණියෝ කාබනික පොහොරින් අක්කර 100ක මිරිස් වවති

(තලවකැලේ- ශාන්ත චන්ද්‍රසිරි සහ නාවලපිටිය - සිසිර ලලිත් කුමාර)

වතු කම්කරු තරුණියන් පිරිසක් විසින් කාබනික පොහොර භාවිතා කරමින් නාවලපිටිය, ගලබොඩ වතුයායේ අක්කර 100 ක මිරිස් වගාවක් සාර්ථක ලෙස මේ වනවිට වගා කරමින් පවතී.

වතුකරයේ තරුණයන් වගාවට යොමු කරමින් රජයට අයත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් නාවලපිටිය, ගලබඩ වතුයායේ වගා නොකරන ලද ඉඩම්වල මෙසේ කාබනික මිරිස් වගාව සඳහා රජය මගින් වතු කම්කරු තරුණයන්ට ලබා දී තිබේ.

කෘෂිකර්ම අමාත්‍ය මහින්දනන්ද අලුත්ගමගේ මහතාගේ උපදෙස් අනුව වතුකරයේ රැකියා විරහිත තරුණයන් 200 ක් සඳහා එම වතුයායේ වගා නොකරන ලද ඉඩම් අක්කර භාගය බැගින් ලබා දී ඇති අතර කෘෂිකර්ම අමාත්‍යංශයේ උපදෙස් හා මග පෙන්වීම යටතේ මෙම කාබනික මිරිස් වගාව සාර්ථක ලෙස එම තරුණයන් විසින් සිදුකරගෙන යනු ලබයි.

වතු කම්කරු තරුණයන් විසින් මිරිස් වගා කොට ඇති අයුරු



විවාහ වූ පුතුට

සසරේ පැතුම් දහසක් හඳවතට	බැඳී
කළ හොඳ නරක පලදී ඉදිරියට	ඇදී
ශේදෙර අලුත් වී නෑඹුල් සුවඳ	දිදී
අපෙ ලෝකයට ඔබ පියවර නගන	ලදී
නෑකම් කියන විට පොළොවට හඳ	පාන
සෙනෙහස ලබා දී සිසිලස අඩු	නූන
මවගේ දෙනෙත තොල් දෙක ලස්සන	මූණ
පිළිඹිබු වුණා ඔබගෙන් ලෝකෙට	ගේන
ලැබදී හිතට මෙතුවක් නොලැබුණ	සහනේ
රජවෙන වෙලේ අපෙ හඳවත් රජ	දහනේ
ඔබගෙන් මිසක් දැල්වී රඟදෙන	පහනේ
ආලෝකයක් මට දැක ගන්නට	බැහැනේ
දැන හොඳ නරක ලෝකය තුළ නොමග	නොයා
සහකාරියක් එක්කර දෛවයට	ලියා
තැන්පත් වෙලා යුග දිවියක සතුට	හොයා
අපෙ හඳවතත් සැනසීමත් රැගෙන	ගියා
ගිනි ගෙන දැවෙන සිතිවිලි වැල් සමග	හිතේ
නොරිදෙන රිදෙන තැන් කඳුළැලිවලට	එතේ
රෑ දහවල් දෙකේ විසිරෙන හතර	අතේ
ඔබගේ සුවඳ දුර සිට විඳ ගනිමි	පුතේ
මා එනතුරු ඔබෙ මව ගෙයි පඩිය	උඩ
ඉඳගෙන බලා හිටියා මෙන් නොකර	කඩ
පුත ඔබ ගෙදර එනතුරු යළි කඳුල්	මැඩ
ඉන්නෙමි බලාගෙන දී කාලයට	ඉඩ

සේන ලියනගේ
ගිනිගත්හේන

ඔබේ නිර්මාණ කඳුරට කවි මඩුව "ලංකාදීප" කර්තෘ මණ්ඩලය, අංක 8, හුණුපිටිය හරස් පාර, කොළඹ 02. ලිපිනයට යොමු කරන්න.

මස්කෙළියට කාබනික පොහොර අලෙවිසලක්

(මස්කෙළිය ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක)

ගොවි ජනතාවට කාබනික පොහොර ලබා දීමේ රජයේ වැඩසටහනට සමගාමීව මස්කෙළිය ප්‍රාදේශීය සභාවෙන් කාබනික පොහොර නිෂ්පාදනය කර සහන මිලකට අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් ඉකුත් (13) ද මස්කෙළිය නගරයේදී විවෘත්ත කෙරිණි.

මස්කෙළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක් රැස්වන දිරා පත්වන කැලි කසළ උපයෝගී කර ගනිමින් රිකාටන් ප්‍රදේශයේ පිහිටි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේදී නිෂ්පාදනය කරන කාබනික පොහොර ගොවි ජනතාවට අලෙවි කිරීම මස්කෙළිය නව අලෙවි සලෙන් සිදු කරනු ලබයි.

මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ පක්ෂ, විපක්ෂ මහජන නියෝජිතයන්ගේද සහභාගීත්වයෙන් මෙම කාබනික පොහොර අලෙවිසල විවෘත කිරීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ සභාපති ගෝවින්දන් සෙම්බගවල්ලි මහත්මිය කියා සිටියේ, ශ්‍රීපාද වන්දනා සමයේදී නල්ලතන්නිය නගරයේ හා අනෙකුත් කාලවල

මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ සභාපති ජී. සෙම්බගවල්ලි

පරිසර නිලධාරිනී සමරණායක

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේදී කාබනික පොහොර නිෂ්පාදනය කරන අයුරු

බල ප්‍රදේශයේ පිහිටි මස්කෙළිය, සාමිමලේ, ලකඹේ යන නගරවල දෛනිකව එක් රැස්වන දිරණ කසල තොග රිකාටන් ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ගෙනැවිත් විද්‍යාත්මක ක්‍රම අනුගමනය කර ඉතා ගුණාත්මක ලෙස කාබනික පොහොර නිෂ්පාදනය කරන බවයි.

මෙම අවස්ථාවට මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ පරිසර නිලධාරිනී රසිකා ලක්මාලි සමරණායක, කර්මාන්ත ක්ෂේත්‍ර පරිපාලක ඒ.ඩබ්. හේමන්ත යන මහත්ම මහත්මීහු හා ප්‍රාදේශීය සභාවේ පක්ෂ, විපක්ෂ සභිකයෝ සහභාගී වූහ.

මේ ලංකාදීප තාරුණ්‍යයේ පිටුවයි

නවරැල්ලට ඔබේ නිර්මාණ විද්‍යුත් ලිපිනය හරහාද එවිය හැකිය.
විද්‍යුත් ලිපිනය - nawarallawnl@gmail.com



විදෙස් නාට්‍ය ආක්‍රමණය කළ අපේ සොඳුරු ටෙලි කතා



ශ්‍රී ලංකාවේ ටෙලිනාට්‍ය කලාවේ උපත දිමුතු මුතු නම් සොඳුරු වූ ටෙලි කතාවකින් සිදුවූ බව අපගේ මතකයේ අදටත් මිහිදන්ව ඇත. අපේ රටට, අපේ සංස්කෘතියට උචිත අපේ පවුල් ඒවලට වඩාත් ගැළපෙන තේමාවන්ගෙන් සපිරි ටෙලි කතා ඒ පසු පස්සේ බිහි විය. අදටත් ඒවායේ සොඳුරු මතක සැමගේ සිත් මත ඉතිරිව ඇතිවා සේම උසස් රසවින්දනයක් ලබා ගැනීමේ හැකියාව ද ප්‍රේක්ෂකයාට නිතැනින්ම හිමි විය.

එහෙත් වර්තමානයේ රූපවාහිනී නාලිකා බිහිවීමේ ප්‍රවණතාවයත්, ඊට සමගාමීව පෙන්වනු ලබන ටෙලිකතා ප්‍රමාණයත් දිනෙන් දිනම වැඩි විය. ඒ අතරතුර ආක්‍රමණශීලී වෙසින් පැමිණි විදෙස් ටෙලි නාට්‍ය අපගේ සෑම සියලු නාලිකාවක්ම ඉතා ඉක්මණින් තම ග්‍රහණයට හසු කරනු ලැබීය. අද විදෙස් ටෙලි නාට්‍යයක් විකාශනය නොවන නාලිකාවක් සොයා ගැනීමට පවා අපහසුය.

ලෝකය එකම පියස්සක් යටට ගෙනා ගෝලීයකරණය ටෙලිනාට්‍යය කලාවට ද එකසේ බලපෑවේය. විදෙස් ටෙලි නාට්‍ය බැලීමට පහසුකම් නොමැති ඒ සඳහා ප්‍රියතාවයක් දැක් වූ ප්‍රේක්ෂකයාට එය මහඟු අවස්ථාවක් විය. භාෂාවේ දැනුම අඩු ප්‍රේක්ෂකයාට පවා අපගේ මවු භාෂාවෙන් හඬ කවන එම ටෙලි නාට්‍ය බැලීමට අවස්ථාව එයින් උදා විණි.

එහෙත් අද පවතින්නේ ඉතාමත් ශෝචනීය තත්ත්වයකි. විදෙස් ටෙලිනාට්‍ය විකාශනය සඳහා තෝරා ගැනීමේ දී අප විසින් භාවිත කරන්නේ කුමන මිනුම් දඬු ද යන්න ගැටලුවකි. සමහර ටෙලිනාට්‍ය නැරඹීමේ දී එහි කොටස් ගණන අප ජීවත්ව සිටිය දී නරඹා අවසන් කළ හැකි ද යන්න පවා ගැටලුවකි. එසේම සමහර පවුල් ඒ සම්බන්ධයෙන් විකාශනය වන ටෙලි නාට්‍ය නැරඹීමේ දී මෙම සිදුවීම් මිහිපිට සිදුවිය හැකිද? යනුත පවා සිතාගත නොහැකිය. එකම පවුලේ අඹුදරුවන් මවුපියන් සහෝදර සහෝදරියන් නෑයන් අතර සිදුවන කුමන්ත්‍රණ වෛරකාරී සිතුවිලි අනෙකා පරයා නැගී සිටීමට දරන වෑයම ඉතා පිළිකුල් සහගතය. පෙම්වතුන් පෙම්වතියන් අතර සිදුවන්නේ කුමන්ත්‍රණය. ආදරයෙන් එක්වීමක් දැකගත නොහැකිය. සමහර ටෙලි නාට්‍ය අපේ රටට අපේ සංස්කෘතියට ගැළපෙන්නේ දැයි නැවත වරක් සිතා බැලිය යුතු තත්ත්වයක් උද්ගතව ඇත.

පොදුවේ ගත්කළ මේ ටෙලිනාට්‍ය අපේ මනස විකෘති කර දමනු ලබයි. ටෙලි නාට්‍යයක් නැරඹීමෙන් අප බලාපොරොත්තු වන්නෙ යම්කිසි මානසික වින්දනයකි. එහෙත් මේ නාට්‍ය තුළින් ප්‍රේක්ෂකයාට එවන් සන්තෝෂජනිතයක් ලැබෙනවාදැයි සොයා බැලිය යුතු කරුණකි. තවද උසස් රස වින්දනයක් ලබා ගැනීමට හැකි ටෙලිනාට්‍ය තෝරා ගැනීමට හැකියාව තිබියදීත් අප යන්නේ මංමුළා වූවන්සේය. ඒ තුළ උසස් නිර්මාණයක් රසවින්දනය කිරීමට ප්‍රේක්ෂකයාට තිබෙන අයිතිය මගහැරී ඇත.

ශ්‍රී ලාංකික බොහෝ ප්‍රේක්ෂකයන් මෙම ටෙලිනාට්‍ය නරඹන බව නොරහසක් නොවේ. අපේ රට තුළ පවුල් අතර සිදුවන අපරාධ වගේම සමාජීය වශයෙන් සිදුවන විවිධ අපරාධවලට මෙම කතා පාදක නොවනවා සේ සිතිය නොහැකිය. ඒ වගේම තරුණ පරපුර නරක ඇබ්බැහිවීම්වලට යොමුවීමට පවුල් ඉතිරීම්වලට, ළමා හිංසනයන්ට වැනි සමාජ පරිසරයක් තුළ නොසිඳු විය යුතු බොහෝ කරුණුවලට මෙම ටෙලිනාට්‍ය කතා මුල් නොවනවා සේ සිතීමට අපට කරුණු කාරණා නොවේ.

අපට පෞඪවත් ඉතිහාසයක් උරුමව තිබේ. හොඳ සංස්කෘතියකට උරුමකම් කියන අපිට පවුලේ බාල මහලු වැඩිහිටි සියලු දෙනා විසින් එකට නැරඹිය හැකි අපේ රටේ සොඳුරු ටෙලිනාට්‍ය කලාවක් ද දායාදව තිබේ. එහෙත අද, ඒ සොඳුරු ටෙලිනාට්‍යවලට සිදු වූයේ කුමක්ද? යන්න සිතෙන විටත් හද කම්පා කරයි. ඔබට මට අමතක කරන්න බැරි අපේ රටේ සොඳුරු ටෙලිනාට්‍ය වූ යශෝරාවය, ගම්පෙරළිය, දූ දරුවෝ අසලවාසියෝ දඬුබස්නාමානය වැනි ටෙලිනාට්‍ය අදටත් අපේ සිත් තුළ මහා දාවැන්තයන් ලෙස අරක් ගෙන සිටී. එහෙත් අද, එවන් උසස් නිර්මාණ රසවිඳීමට ප්‍රේක්ෂකයාට තිබෙන අයිතිය කුමක්දෝ බලවේගයකින් අහිමිවී ඇත.

අද එවන් සොඳුරු උසස් රසවින්දනයක් සහිත කතා විකාශය වීමේ අඩුවක් දක්නට ලැබේ. සමහර ටෙලිනාට්‍ය විදෙස් ආභාෂය ලබා ඇත. අපේ සංස්කෘතියට ගැළපෙන නිර්මාණ බිහිවීමේ අඩුවක් දක්නට ඇත. උසස් රසවින්දනයක් ලැබීමට නම් උසස් ගුණාත්මක බවින් යුත් නිර්මාණ බිහිවිය යුතුය. අද වළපල්ලට යමින් පවතින්නේ අපේ මේ උසස් නිර්මාණයන්ය. එබැවින් එය රැක ගැනීමටත් මතු පරපුර වෙනුවෙන් ආරක්ෂා කරදීමේ වගකීම අප සතුය.

ධවල පත්‍රිකාව...
ශ්‍රීමානි ප්‍රියංගිකා,
විහාරගොඩ, බදුල්ල

මල් කැකුළු පිපෙන්නට ඉඩ දෙන්න

යම් රටක දරුවන් හද වඩා ගන්නා ආකාරයත් අධ්‍යාපනය පෝෂණය, සෞඛ්‍යය සහ රැකවරණය ලබා දෙන ආකාරයත් එරට අනාගත පැවැත්ම තීරණය වේ. වර්තමානයේ කුඩා දරුවා අනාගතයේ රට පිළිබඳව වගකීම් දරන්නෙකි. 'ළමයා වනාහි ඉදිරි කාලයේ බිහි වන මිනිසාය' යනුවෙන් ඇරිස්ටෝටල් පඬිතුමා ළමයාව අර්ථවත් කළේ එබැවිනි. රටේ කොඳුනාරටිය තරුණ පරපුර නම් රටේ ජීවනාලිය ළමා පරපුරයි. රටේ ජීවය බඳු දරුපරපුර විවිධ උවදුරුවලින් ආරක්ෂා කිරීම වර්තමානයේ මවුපියන් සතු අභියෝගයකි.

සමාජය යනු විචාරවූත් අවිචාරවූත් සංකලනයකි. සමාජයේ වෙසෙන මිනිසුන් සුදු කළු යනුවෙන් ඉරි ගසා වෙන්කළ නොහැකිය. සෑම සමාජයකම දක්නට ලැබෙන්නෙ අළු පැහැති චරිත ගත් මිනිස්සුය. යහපත අබිබවා අයහපත ග්‍රහණය කරන සමාජයක ළමයා යනු නොමේරූ තැනැත්තෙකි. ළමයා කිසි විටෙක කුඩා මිනිසෙකු නොවන අතර ඔහු හෝ අය කායිකව හා මානසිකව යැපෙන්නෙකි. එනම් සම්පූර්ණයෙන් අනුන් මත ජීවත් වන රැකවරණය හා සෞඛ්‍යය විවිධ පීඩාවන්ට ගොදුරු විය හැකි තැනැත්තෙකි. එවැනි ළමයි මල් කැකුළු වැනිය. අවුරුදු 18 ට අඩු සෑම අයෙකම 'ළමයා' නම් වන බව ළමා ප්‍රඥප්තියේ සඳහන් වේ. යැපෙන මානසික තත්ත්වයේ සිට ස්වාධීන මානසිකත්වයට යාමට ගතවන කාලය 'ළමාවිය' නම් වේ. මිනිසාගේ ළමාවිය සෙවණැල්ලක් මෙන් ජීවිතය පුරා ක්‍රියාත්මක වෙයි. එහි ඇතැම් සිදුවීම් මිනිස මනසට තදින් බලපෑම් කරයි. එහි ප්‍රතිඵලය වශයෙන් ඔහුගේ ජීවිතය යහපත් හෝ අයහපත් වීමට පසුකාලීනව බලපෑම් කරයි. 'අපයෝජනය' යනු වරදෙහි යෙදවීමයි. එනම් දරුවන් වෙනුවෙන් සිදු කළ යුතු දේ නොකිරීමත, නොකළයුතු දේ සිදු කිරීමත් අපයෝජනය නම් වේ. කායිකව, මානසිකව, ලිංගිකව යනාදී තුන් ආකාරයෙන්ම අපයෝජනයට ළමයා දෙදිනිකව ගොදුරු වන බැවින් විනාශ වන්නේ මෙරට අනාගත පරපුරයි. මෙයට හොඳම උදාහරණය වන්නේ මෑතකදී අන්තර්ජාලය ඔස්සේ අලෙවි කළ බලා වයස්කාර දැරියට ලිංගික අපයෝජනය සිදු කිරීමේ ආන්දෝලාත්මක සිදුවීමයි.

ළමා අධිකාරියට ලැබෙන පැමිණිලි අනුව බහුල වශයෙන්ම අපයෝජනයට ගොදුරු වන්නේ යොවුන් වියේ පසුවන දරු දැරියන්ය. යොවුන් විය යනු වයස අවුරුදු 11- 18 අතර කාල සීමාව වේ. එය දරුවා වැඩිහිටියෙකු බවට පත්වන සංක්‍රාන්තික කාල සීමාවක් ලෙස සැළකේ. මෙහිදී, ශාරීරික වෙනස්කම් සමඟ ඇතිවන මානසික තත්ත්වයන් හමුවේ බොහෝ දරුවෝ හුදකලා අරගලයක යෙදෙති. ඔවුහු කුතූහලය හා විරුද්ධ ලිංගික ආකර්ශනය මත අලුත් දෑ සොයා යාමත්, විවිධාකාර අත්දැකීම් සමාජය තුළින් ලබා ගැනීමටත් වෙහෙසෙති. තමා වැඩිහිටියෙකු ලෙස සිතීමට පෙළඹීම නිසා විවිධාකාර රැවටීම්වලට ගොදුරු වෙති. බොහෝ ළමා අපචාර සිදු වී ඇත්තේ සමීප පුද්ගලයනගෙන් වීම විශේෂත්වයකි. එනම් දරුවාගේ විශ්වාසය දිනාගත් තාත්තා, මීයා, බාප්පා, සුළුප්පියා, මාමා, මස්සිනා, සහෝදරයා යනාදී ඥාතීත්වයක් ඇති අයගෙන් මෙන්ම ඇසුරු කරන පුද්ගලයන් වන අසල්වැසියා, යහළුවා, ගුරුවරයා, විදුහල්පතිවරයා හා ප්‍රජා පක්ෂය අතින්ද අපයෝජනයටත්, දූෂණයටත් ලක්වේ. එසේම යොවුන් දැරියන් ප්‍රේම සබඳතා පැවැත්වීම හේතුවෙන් තම පෙම්වතා අතින් දූෂණයට ලක් වේ. බොහෝ විට ළමයින් අපයෝජනයට ලක් කර ඇත්තේ රැවටීමෙන හෝ බිය ගැන්වීමෙනි. වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකුගේ කැමැත්ත ඇතිව හෝ නැතිව කායිකව එක් වීම 'ස්ත්‍රී දූෂණයක්' ලෙස අර්ථ දැක්වෙයි. ස්ත්‍රී දූෂණයක් නොවෙන වෙනත් ආකාරයේ ලිංගික අතවර ලිංගික අපයෝජන නම් වේ.

කුමුදු සංජීවනී පෙරේරා
සිංහල ඩිප්ලෝමාධාරී, කොළඹ විශ්වවිද්‍යාලය

මෙම වැරදිවලට බරපතළ වැඩ ඇතිව අවුරුදු 20 දක්වා සිරගත කළ හැකිය. ලජ්ජාව, බිය සහ ගෞරවය හේතුවෙන් ඇතැම් ළමා අපචාර නීතිය ඉදිරියට නොගොස් නිහඬව විඳ දරා ගැනීම කිසිසේතම යහපත් තත්ත්වයක් නොවේ. එය අපයෝජකයාට තව තවත් අපරාධ කිරීමට රුකුලක් වනු ඇත.

යම් අවාසනාවකට තම දරුවා අපයෝජනයට ගොදුරු වී ඇති බව මවුපියන්ට අවබෝධ කර ගත හැක්කේ දරුවාගේ අමුතු හැසිරීම් මතය. එනම් දරුවා එකවර නිහඬවීම, කල්පනා බරිත වීම, නිවසේ සමාජිකයන් ඇසුරු කිරීමට අකමැති වීම, යමක් ප්‍රකාශ කිරීමට උත්සාහ කිරීම, හුදකලාවීම යනාදී චරයා ඉඟි තුළින් අවබෝධ කොටගත හැකිය. මෙහිදී ඔබ ඉතාමත් බුද්ධිමත් අයුරින් ප්‍රතිචාර දැක්විය යුතුය. කිසිවිටෙක නීතිය ඔබ අතට ගැනීම සිදු නොකළ යුතුය. ළඟම පොලිස් ස්ථානයට හෝ ළමා ආරක්ෂක අධිකාරියට එම අපයෝජනය වාර්තා කරන්න. එසේම මනෝ වෛද්‍ය උපදේශනද ලබා ගන්න.

ළමාවියේ පටන් තම දරුවා බෙහෙවින් ආරක්ෂා කිරීම මවුපියන් සතු යුතුකමක් හා වගකීමක් වන්නේය. බොහෝ වැරදි සිදුවන්නේ නොදැනුවත්කම හා නොසැලකිලිමත්කම හේතුවෙනි. තම 'ආසා දෙකමෙන්' දරුවා තමා සමීපයේ රඳවා ගනිමින් කල්පනාකාරීව රැක බලා ගත යුතුය. යොවුන් වියේ වෙසෙන දරුවා නුවණින් කල්පනා නොකර හැඟීම්වලට වශඟ වී ක්‍රියා කරන බැවින් එම දරුවන් කෙරෙහි පූර්ණ විශ්වාසයක් තොතබා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. එසේම තම දරුවාට අධ්‍යාපනය පමණක් නොව සමාජ අවබෝධයක්ද මවුපියන් විසින් දරුවාට කියා දිය යුතුය. අනවශ්‍ය සංවේදී පුද්ගලයෙකු ලෙස දරුවා හැඟි නොගැස්වීම, දරුවා මුහුණ පෑමට සිදුවන හිංසනවලට එරෙහිව සටන් කිරීමට හුරුකිරීම, දරුවා ඇසුරු කරන පුද්ගලයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම, දරුවා සමඟ එදිනෙදා තොරතුරු හුවමාරු කර ගැනීම, නවීන තාක්ෂණය පිළිබඳ නිසි අවබෝධයකින් පසුවීම, කිසිවිටෙක අන්‍යයන් ඉදිරියේ දරුවා තනි නොකිරීම යනාදී ආරක්ෂිත පියවර ගැනීමෙන් තම දරුවාට අපයෝජනයෙන් තොර සොඳුරු ළමා වියක් උරුම කර දීමට හැකි වනු ඇත. තම දරුවන්ට වඩාත් සුන්දර ළමාවියක් නිර්මාණය කරමින් ඔබ ලබන සතුට මෙලොව උත්තරීතරම සතුටයි.

හැඩ තිබුණට වැඩක් නැතේ

නූතනයෙහි මහමග ගමන් කරන විට වාහනවලින් පිටවෙන ගොරහඬි අධික නළා ශබ්ද දෙකන්වලට, මනසට විඳදරා ගත නොහැකි අයුරින් නිකුත් කෙරේ. මෙය මහමග ගමන් කරන උදව්යට මහත් හිසරදයකි. ඇතැම් වාහනවලින් නිකුත් වෙන ශබ්දය ඊට නොදෙවෙනිය. වාහනයක් ආනයනය කිරීමේදී එයට ගැළපෙන සරලන නළාවක් මෙන්ම වාහනයට උචිත ශබ්දයක් නිකුත් වනසේ නිෂ්පාදනය කර තිබීම නොරහසකි.

තම සිතැඟි පරිදි එය වෙනස් කළ හැකිද? 'විසිල් තිබුණට බලලි හැතුව වැඩක් නැත' යනුවෙන් සමාජයේ කියමනක් තිබේ. මාර්ග නීති පිළිනොපැද අධික ශබ්ද නිකුත් කිරීමෙන් පලක්වේද? මසක් තුළවූ රිය අනතුරුවලින් හැත්තෑවකට වැඩි පිරිසක් මිය ගිය බව අනාවරණය විය.

මහමඟ ධාවනය වන වාහනවල ගුවන් ගියර් පද්ධතියක් නැත. එනිසා ගුවනින් පියාසර කිරීමට නොහැක. අදාළ මාර්ගයෙහි ධාවනය කළ යුතු වේග සීමාවක් පනවා ඇත. මාර්ග නීති අනුගමනය කර රිය පදවන්නේ නම් බොහෝදුරට අකාලයේ රිය අනතුරුවලින් මෙලොව හැර යෑමට සිදු නොවේ.

අකාලයේ මෙලොව හැර යෑම ගැන අනාවරණය වන දැවලින් රිය අනතුරුවලට ප්‍රධාන තැනක් හිමි වේ. ප්‍රථම මාරක රිය අනතුරක් ලෙස එකල රෝද, දෙකේ අශ්වකරත්තයකින් ගමන් කරමින් සිටි එළාර රජුගේ පුතු ධාවනය කළ රථයට වසුපැටවෙකු හසුවී මිය යෑම මෙන්ම 1797 ජූලි මස කොළඹ හමුදාව බාරව කටයුතු කළ කර්නල් බොනාවො මහතාගේ රථය පෙරළීම නිසා ඔහු මිය ගිය බව පොතපතෙහි සඳහන්වේ. 1806 දී ප්‍රථම ගැසට් නිවේදනය නිකුත් කරමින් සියලුම වාහන මාර්ගයෙහි වම්පැත්තෙන් ගමන් කළ යුතු බවට නියෝග පැනවීය. සොබාදහමෙ සුන්දරත්වයන් ඔප්නංවමින් පරිසරයට උරුමකම් කියන අතැම් සත්ත්ව සමූහයන්ගේ නාදයන් සුමිහිරි නාදරටා මවමින් නෙතට සුන්දරත්වයක් මෙන්ම කනට මිහිරක් ලබා දෙමින් මවන නාදයන් කෙතරම් මිහිරියි ද එයට අකමැති අයෙක් ලොව නැති තරමිය.

වෘක්ෂලතා ආදිය එකිනෙකට ඇතිල්ලෙන මැදෙන ශබ්දය කනට කෙතරම් ප්‍රිය උපදවයිද ශබ්දෙ රාවලින් මිනිස් මොළයේ අභ්‍යන්තරයේ ඇතිවෙන බීටා නීටා ඊටා ඇල්ෆා යන

එන්.කේ. අබේවර්ධන
කුරුණෑගල

තරංගවලින් මිනිසාට යහපත් වූ සුවදායක තරංගය ලෙස ඇල්ෆා තරංගයට ප්‍රධාන තැනක් හිමිවේ. මෙම සොඳා දාමේ අසිරිය ඔප්නංවන ශබ්දරාවන් මිනිස්මොළයට දැනෙන්නේ ඇල්ෆා තරංග අයුරිනි. ඇල්ෆා තරංගවලින් මිනිස් මොළයේ මනෝභාවයන් නිරවුල් වන බව පොත පතෙහි සඳහන්වේ. අප බෙහෙත් හෙත් යනුවෙන් හඳුන්වන වැකියෙහි හේත් යනු වෙන් සඳහන් වන්නේ සාංකාව, මානසික පීඩාවන් දුරුකර ගැනීම සඳහා ශ්‍රවණය කරන සංගීතයයි. උදාහරණ ලෙස පන්සලෙ බෝධි ප්‍රජාවෙන් නිකුත්වෙන හඬ බෝධීන් වහන්සේගේ බොපත් සෙලවෙන හඬ මෙන්ම සරල සංගීතය මගින් ඇල්ෆා තරංග ඔස්සේ මානසික සුවතාවය මෙන්ම මානසික ප්‍රබෝධය ආධ්‍යාත්මික ගුණවගාව වැඩිදියුණු වන බව ඇතැම් දැවල විස්තර වේ.

මිනිස් සිතේ සිතිවිලි ඉතාමත් නිදහස් නිවහල් සංඥා සිතිවිලි බවටත් පරිවර්තනය කරනනා වූ සංසිද්ධි පද්ධතියකි. මෙතැන් සිට ඇත්තෙ ජනප්‍රවාදයේ එන කතාවකි. පොල්කිච්චකු තල්ගසක අත්තක සිට අප්‍රමාණ සැප ගන්ඩ ගන්ඩ ඉහළ සිටින සැමටත් පහළ සිටින සැමටත් මටත් මගෙ දරුවන්ටත් බුදුසරණයි දෙවිපිහිටයි හුයියො හුයියො යනුවෙන් ඉතා මිහිරිව ගීතයක් ගයන්නාක් මෙන් හඬ නැගුවේය. එය ශ්‍රවණය කරමින් සිටි අයෙකු තල්අත්තට බොරලු පසවලින් දමා ගැසුවේය. පොල්කිච්චාට මදක් කේන්ති විත් අයියො පීවං අයියො පීවං යනුවෙන් නාදකරමින් ඉගිලී ගියේය.



චිත්‍රය

ඔහු හබරළ කොළය යට
මම කෙසෙල් අතු කුඩය යට
තෙත බරියං වූ සරම හා ගවුම
රබර් පට්ටය හිරවුණු පොත් මිටිය
මඩ මිරිකුණු ඇඟිලි කරු
සමඟ ගියෙ පාසලට
දෙකට නැමුණු ගෝනියක් ඉහේ දැගෙන
ආවේය මුල්ගුරු වේවැල ද අතැතිව
ඇස් කරකවා බලා සිටි කොත
බාගයක්වත් නෑ ළමයි අද
අඳින්න චිත්‍රයක් වැසි දිනක
දිය සායම් පෙට්ටි
අල්ලා වැහි වතුරට
වැතුරුණා පංතියේ බිම කෙළවර
අණ්ඩ දැමූ පොල්ලතු වහලයට
වැටුණි අඹ අත්තකුත්
වතුර බේරෙන තැනට
තියමු මැටි වළඳක්
'කෝ බලන්න ළමයි ඇඳි සිතුවම්'
එසවුණා ඉහළටම
නැගුණි අත්පොළසන් නාදයක්
දිය සායම් තැවරුණු ගවුම
බලා හිඳියි නියපොත්ත විකමින්
හබරල කොළ ද කෙසෙල් අතු ද
වැටී ඇත කොට බිත්තියෙන් පහළට
මේසයට බර දී මුණුපුරා
අඳියි සිතුවමක් වැසි දිනක
ඔන්ලයින් පාඩමට
පිට රැඳි පොත් බෑගය ද සමඟින්
සිත තබා වැහි කබා
දෙපතුළට පොරෝගෙන
දේදුනු පාවැති කුඩයට ද මුවාවී
පාසලට යන කලට
කාපට් පාර මත වැටුණු වැහි වතුර
ගලා යයි කාණුවට සීරුවට
තැනින් තැන පාරටම ඇලුණු කොළ
කැබැලි
තිරයෙන් එබී හිනැහුණා ගුරුතුමිය
ඔසවා ඇඟිල්ල මහපට
එක්සලන්ට් වෙල්ඩන්

ඩබ්ලිව්.එම්.කේ. මැණිකේ,
හෙට්ටිපොළ.

තනි කවිය

බකමූණෙකු හැඬුවා හිඳ අඹ අත්තේ
මයිනා නැතිව මයිනිය තනියම වත්තේ
පාලුව මකන රූසිගෙ හඬ නැත්තේ
අමවකදත් කළ එළියයි පිළ පැත්තේ

පී. ඉනෝකා සංජීවනී,
පුත්තලම.

දුබලයා

තමා
තමා දෙස
නොබලා
අනෙකා දෙස
බලමින්
සිනාසීම

කරුණාරත්න අත්තනායක,
ගල්ගමුව.

හිර ගෙදර

අත රැඳුන ආයුදය
එල්ලකර සතුරාට
යළිත් එය බිම දැමුවෙ
සිහිවෙලා සිපිරිගේ
සිත් රැහැන් බිඳදමා
නෙත් සලා බැලුසඳ
මා හිටියෙ පෙර සේම
සිපිරිගෙයි සිටි තැනම

ලිල් චන්ද්‍රසිරි,
නැගම්පහ.

අදත් තනියම ඈ තමයි

ඇඩක් පිර වූ මදු බඳුන්
එකට ඔසවා පුරා සවිදිය
තොලගාමින් කී රස කතා
පණ උනත් දෙන යාළුවෝ
තාවකාලික විරුවන්ගෙ ලෝකේ
සමාජ ආර්ථික දේශපාලන
ඕන දේකට ක්ෂණික විසඳුම්
නිකරුණේ දැල්වෙනා දුම්වැටි
අළු බඳුන් ඔහෙ පිරී යද්දී
ගෙවූ කාලය හෝරා ගණනින්
සිතුණි මෙයමයි ජීවිතේ
දියව ගිය ජව බලය
ඇට සැකිලි ශරීරය
හොවා සයනය මතට
බට ගසා මුව දෙර වසා
වේදනාවේ දුබල කෙඳිරිය
පහන්සිල වැනි තෙල් නිමා වූ
එද සිටි හිතවතුන් අද නැත
සුසුම් හෙලනා දයාබර ඈ
ඇත එදා මෙන්
අදත් තිනියට...



තිලක් අතපත්තු,
වාරියපොළ.

තේ කඩේ නංගි

දුවු දුවු සැමට ඔබේ
සුන්දර
සිනහ නැගේ
විටකදී පෙනෙනවා
කඩිසර
හෙට ගැන හිතා වැඩ
කරනා
අයුරු අගේ
ඔට හරි දුකයි තේ
කඩයේ
වීටි නගේ



සිරිල් මදුරප්පෙරුම,
කුලියාපිටිය පාර,
මූණමල්දෙනිය.

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 අගෝස්තු මස 18 වැනිදා බදාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.

මිරිස්ස පළවැනි පටුමගේ පැති කානු දැමීමේ ප්‍රශ්නයක්

සුසන්ත ජයලත් (පොජපෙ)

(වැලිගම සුනිල් ධර්මබන්දු ද සිල්වා)

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති සෞභාග්‍යයේ දැක්ම ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර තිබුණා. රසායනික පොහොර භාවිතය තහනම් කරන බවටත්, කාබනික පොහොර ලබා දෙන බවටත්. රසායනික පොහොර තහනම් කර, වස විසෙන් තොර රටක් ඇති කිරීම සඳහා එතුමා ගෙන ඇති එඩිතර තීරණයට මගේ ප්‍රණාමය පුද කරනවා. වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති පුෂ්පකුමාර බැට්ටගේ මහතා පැවසීය.

වැලිගම ප්‍රාදේශීය මාසික සභා රැස්වීම අමතමින්, බැට්ටගේ මහතා එසේ කීය.

වැලිගම ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ දී පැවැත්වීය.

සභාපතිවරයා,

ජනාධිපතිවරයාගේ ප්‍රයත්නයට සහයෝගයක් වශයෙන් කාබනික පොහොර ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙනවා. කඹුරුගමුව ප්‍රදේශයේ ආරම්භ කර ඇති එම කාබනික පොහොර ව්‍යාපෘතිය පුළුල් කිරීම සඳහා ඊට යාබදව පිහිටි බාලසූරියවත්ත නමැති ඉඩමේ අක්කර 2ක ප්‍රමාණයක් වැලිගම ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට මා යෝජනා කර සිටිනවා.

කඹුරුගමුව ප්‍රදේශයේ අප අරඹා ඇති කාබනික පොහොර ව්‍යාපෘතියෙන් ඉතාමත් කෙටි කාලයකින් ප්‍රමිතියෙන් යුක්ත කාබනික පොහොර වැලිගම ප්‍රදේශයේ ජනතාවට ලබා දීමේ වගකීම අප භාර ගන්නවා.

මෙරටට ආදරය කරන නායකයෙක් වශයෙන් රසායනික පොහොර භාවිතයෙන් ඉවත් කර කාබනික පොහොර භාවිතයට අවතීර්ණ වන මේ වෙලාවේ යම් යම් අඩුපාඩු වෙන්න පුළුවන්. එම අඩුපාඩු මග හරවා ගෙන අවශ්‍ය කාබනික පොහොර ටික ඉතා ඉක්මනින් ලබා දීමට අප කටයුතු කරනවා. ඒ සඳහා අප සභාවේ ඉන්න පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් පිරිසකගෙන් යුත් කමිටුවක් අප පත් කරනවා.

මීට ඉහතදී මහින්ද රාජපක්ෂ, මෛත්‍රීපාල ජනාධිපතිවරුන්ද කාබනික පොහොර භාවිතය සඳහා පියවර ගනු ලැබුවත් පරිසරවේදීන් යැයි කියන පිරිසක් එයට විරෝධය දැක්වීම නිසා එය අඩපණ වුණා. එම පරිසරවේදීන් දැන් කොහෙද කියලා දන්නෙ නෑ.

පිළිකා රෝගීන්, වකුගඩු රෝගීන් බහුල වෙලා තිබෙන්නෙ මෙම රසායනික පොහොර භාවිතය නිසා.

වකුගඩු රෝගීන් කොතරම් වැඩි වෙලාද කිව්වොත් මෛත්‍රීපාල ජනාධිපතිතුමා විසින් පොලොන්නරුවේ ඒ සඳහා රෝහලක්ද සාදා තියනවා. රෝහල් හැදුවා කියා මේ ප්‍රශ්නය විසඳෙන්නෙ නෑ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා හිතන විදියට රසායනික පොහොර නතර කොට කාබනික පොහොර භාවිතයයි කළ යුත්තේ. ඒ සඳහා අපේ රජය මගින් පොහොර අමාත්‍යාංශයක් පිහිටුවා තිබෙනවා. ශෂින්ද්‍ර රාජපක්ෂ ඇමතිතුමා යටතේ.

ආර්.ඒ. සිරිපාල මහතා (ජ.වි.පෙ) :

වැලිගම ප්‍රාදේශීය සභාව

කාබනික පොහොරවලට අපේ විරුද්ධත්වයක් නෑ. රසායනික පොහොර භාවිතා කළ ගොවීන්ට එක පාරටම රසායනික පොහොර නැවැත්වීම ප්‍රශ්න ඇති වෙනවා. ඔවුන් ඉල්ලන්නේ සුදුසු පොහොර වහාම ලබා දෙන ලෙසයි. මෙහිදී ඇති වන ගැටලුවක් තමයි කාබනික පොහොර භාවිතයෙන් කොතරම් අස්වැන්නක් ලබා ගත හැකිද යන්න සිතා බැලිය යුතුයි.

පිටරටින් හෝ කාබනික පොහොර ගෙන්වා ගොවීන්ට දෙන්න ඕනෑ

නලින් නිශාන්ත (එජාප)

සමන් ගමගේ මහතා (ශ්‍රී ලං.පො.පෙ):-

රසායනික පොහොර වෙළෙඳම පවා නොකළ යුතු බවට බුදුදහමේ පවා ඉගැන්වෙනවා. පසේ ඇති ජීවීන්ට වන විනාශය නිසයි ඒ.

ගොවියන් තමන්ගේ පවුලට භාවිතා කරන අස්වනු කොටස කාබනික පොහොර යොදා තමයි වගා කර ගන්නෙ. රසායනික පොහොර භාවිතා කර වවන එළවළු ආදි වගාවන් තමයි වෙළෙඳපොළට යවන්නෙ.

කොන්ද පණ තියෙන නායකයකු විදියට ජනාධිපති රසායනික පොහොර තහනම් කිරීමෙ තීන්දුව අරගෙන තිබෙනවා. අද අහිංසක ගොවීන් රැවටිලා උද්ඝෝෂණය කරනවා රසායනික පොහොර ඉල්ලලා. අද කාබනික පොහොර සෑදීමට ගන්නා කුණු සඳහා හොඳ මාකට් එකක් ලැබී තිබෙනවා.

ඒ වගේම එකක් කිව යුතුයි, ඔන්ලයින් අධ්‍යාපනය සිදු කිරීම ප්‍රශ්නයක් වී තිබුණා. අපේ සභාපතිතුමා ආරම්භ කරනු ලැබූ ඔන්ලයින් වැඩසටහන අද ඉතා සාර්ථකව සිදු වෙනවා.

ඉන්දික ජයසේකර මහතා (ශ්‍රී ල.පො.පෙ):-

ජනාධිපති ගනු ලැබූ හොඳම තීරණය තමයි රසායනික පොහොර තහනම් කර කාබනික පොහොර භාවිතා කළ යුතුයි කියනෙක. අද වෛද්‍යවරුන් පවා කියන්නෙ වගාව සඳහා හොඳම කාබනික පොහොර බව. පිළිකා, වකුගඩු රෝගවලට හේතුව ලෙස රසායනික පොහොර භාවිතය තමයි දකින්නෙ. එමනිසා ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු විපක්ෂයෙන් මම ඉල්ලා සිටිනවා, මෙම කාබනික පොහොර ව්‍යාපෘතියට සහයෝගය ලබාදෙන්න කියලා. අද කුඹුරුවල තිත්ත පැටවුන් වගේ මසුන් පේන්න නෑ. ඒ කුඹුරට යොදන රසායනික පොහොර නිසා.

වැලිගම ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කෙරෙන මෙම කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා අප සහයෝගය ලබා දිය යුතුයි. මාත් පෞද්ගලිකව ඒ සඳහා සහයෝගය ලබා දෙනවා.

ආර්. අජිත් ප්‍රියන්ත මහතා (ජ.වි.පෙ):-

ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ කාබනික පොහොර නරකයි කියා නොවේ. හැබැයි මේ සිදු වන පිළිවෙළ ගැන ප්‍රශ්න තිබෙනවා. උද්ඝෝෂණ පිටුපස අප නැහැ. අපි ඉන්නේ ඉස්සරහින්.

අද තේවලට පොහොර නැති නිසා තේ දලු කහ පාට වෙලා. වී ගොවිතැනටත් ඒ වගේම ප්‍රශ්න තිබෙනවා. කොම්පෝස්ට් කාබනික පොහොර භාවිත කළ යුත්තේ පරීක්ෂණ, නිරීක්ෂණ කරලා ඒ අනුව.

අපේ ගොවියන්ට අද උද්ඝෝෂණ කරන්න මොළේ අමාරුවක් නෑ, ජනතා විමුක්ති පෙරමුණ කිව්වම පාරට එන්න. අද පොළොවේ පස විස වෙලා තිබෙන්නේ රසායනික පොහොර නිසාම නෙවේ. පාවිච්චි කර විසි කරන බැටරි, නොයෙක් දේ නිසයි. ඒවයින් ආසනික්, බැර ලෝහ ආදිය පසට එකතු වෙනවා. සුදුසු පොහොරක් හද නොගෙන, වැඩපිළිවෙළක් නැතිව රසායනික පොහොර තහනම් කිරීම නොකළ යුතුයි.

ඒවගේම අපේ රටට ආනයනය කරන සහල්, පරිප්පු වගේ දේවල් හදලා තිබෙන්නේ රසායනික පොහොර වගේ විස දේවල්වලින්.

නලින් නිශාන්ත මහතා (එ.ජා.ප):-

ජනාධිපතිගේ යෝජනාව හොඳයි, නමුත් වෙලා තිබෙන්නේ එද කුඹුරු කළේ පරිභෝජනය සඳහා. අද අක්කර 3-4,10-15 වශයෙන් කුඹුරු කරන්නේ අස්වනු විකිණීම සඳහා. එය කාබනික පොහොරවලින් පමණක් කරන්න බැහැ. රසායනික පොහොරවලටත්, කෘමිනාශකවලටත් විශාල මුදලක් වැය වෙනවා. පිටරටින් හෝ හොඳ ප්‍රමිතියෙන් යුත් කාබනික පොහොර ගෙන්වා ගොවියන්ට ලබා දිය යුතුයි.

ලලිත් නානායක්කාර මහතා (ශ්‍රී ල.නි.ප)

අද ලංකාවේ අධ්‍යාපනය කසිකබල් වෙලා. ඒත් සභාපතිතුමා විසින් ඔන්ලයින් වැඩසටහනක් ආරම්භ කර තිබෙනවා. එය ඉතාම සාර්ථකයි. එම වැඩසටහන විශිෂ්ටයි. එය තවත් වැඩිදියුණු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

පුෂ්පකුමාර බැට්ටගේ මහතා (සභාපති - ශ්‍රී ල.පො.පෙ)

වැලිගම ප්‍රාදේශීය සභාව මගින් ආරම්භ කරන ලද මාර්ගගත (ඔන්ලයින්) වැඩසටහනට සිසුන් 13,000 ක් පමණ සහභාගි වෙනවා.

සුසන්ත ජයලත් මයා (උප සභාපති- ශ්‍රී ල.පො.පෙ)

කොරෝනා වැඩසටහනේ අපි කරන දේවල් ජනතාව අතරට යන්නෙ නැහැ. දකුණු ආසියාවේ වැඩිම එන්නත් ලැබී තිබෙන්නෙ අපේ රටට. අවුරුදු 60න් ඉහළ අය තමයි 80%ක් පමණ මැරිලා තියෙන්නේ. ඒ නිසා තමයි ජනාධිපතිතුමා 60න් ඉහළ අයට එන්නත් දීම ඇරඹුවෙ.

ඒ වගේම මිරිස්ස, සුනන්ද මාවතේ, පළවන පටුමගේ මේ වනවිට ඉන්ටර්ලොක් ගල් අල්ලලා තිබෙනවා. එහි පැති කානු දැමීමේ ප්‍රශ්නයක් තිබෙනවා. එනිසා ඒ සඳහා පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

ආර්. සුමිත්‍රා මහත්මිය (ශ්‍රී ල.පො.පෙ)

දැනට නිසි නමකින් භාවිතා නොකරන වැළිහිඳ, 'සඳමිණි උයන' අතුරු මාර්ගය 'පුෂ්පකුමාර බැට්ටගේ මාවත' නමින් නම් කිරීමට ගරු සභාවට යෝජනා කරනවා.

ඉන්දික ශ්‍රී මංගල මහතා (ශ්‍රී ල.නි.ප)

සභාපතිතුමාගේ නම ගැහුවට මගේ විරුද්ධත්වයක් නැහැ. නමුත් ප්‍රාදේශීය සභාව සතු පොදු ස්ථාන නම් කිරීමේ ක්‍රමවේදයක් තිබිය යුතුයි. එහෙම නැතුව නම් කළොත් එම බෝඩ් එක කවුරුන් විසින් හෝ ගලවා දැමුවොත් නම් සඳහන් අයට හිත් වේදනාවක් ඇති වෙනවා. එමනිසා විරෝධතා කැඳවා එය කළ යුතුයි.

පුෂ්පකුමාර බැට්ටගේ මහතා (සභාපති - ශ්‍රී ල.පො.පෙ)

එම යෝජනාවට මාත් එකඟයි. පනතට අනුකූලව විරෝධතා කැඳවීම සුදුසුයි යැයි මාත් කියනවා.

සභාවේ පොදු ස්ථාන නම් කිරීමේ ක්‍රමවේදයක් තියෙන්න ඕනෑ

ඉන්දික ශ්‍රී මංගල (ශ්‍රීලනිප)

ලයිසන්වලට පිටින් ට්‍රක්වලින් පස් ඇද්ද දෙදෙනෙක් කොටු

(තංගල්ල - ආරියදස කොඩිතුවක්කු)

බලපත්‍ර නීති උල්ලංඝනය කරමින් පස් ප්‍රවාහනය කරමින් තිබූ ට්‍රක් රථ දෙකක් 12 වැනි දින කතරගමදී රියැදුරන් ද සමග අත්අඩංගුවට ගත් බව තංගල්ල කොට්ඨාස දූෂණ මර්දන ඒකකය පවසයි.

අත්අඩංගුවටගත් පස් සහිත ට්‍රක් රථ සහ රියැදුරන් 12 වැනිද සවස කතරගම පෙලිසියට භාරදී ඇත.

තංගල්ල කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රවීන්ද්‍ර අඹේපිටිය, සහකාර පොලිස් අධිකාරී සනත් අමරසිංහ යන මහත්වරුන්ගේ උපදෙස් මත තංගල්ල කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කේ.කේ. නිශාන්ත ලාල්, සැරයන් (40753) හෙට්ටිආරච්චි, කොස්තාපල්වරුන් වන (71452) ඉන්දික, (72939) සංජය, (84229) ජයසමන්, (90579) පවන් හා (80445) ප්‍රියංග යන නිලධාරීහු වැටලීම කළහ.

මල් පෝච්චිවල කංසා වැවූ විදේශිකයාට දඩ

(උණවටුන ඩී.ජී. සුගතපාල)

හික්කඩුව මිල්ල ප්‍රදේශයේ නිවෙසක මල් පෝච්චිවල කංසා වැවීම සම්බන්ධයෙන් වරද පිළිගන්නා ලද විදේශිකයකුට ගාල්ල ප්‍රධාන මහේස්ත්‍රාත් හර්ෂණ කැකුණවෙල මහතා රුපියල් පන් දහසක දඩයක් (13) නියම කළේය.

මෙසේ දඩ නියම වූයේ තිමොති ජෝන් තෝමස් නමැති 35 හැවිරිදි එංගලන්ත ජාතිකයෙකුටය.

සැකකාර විදේශිකයා හික්කඩුව මිල්ල ප්‍රදේශයේ නිවසක් කුලියට ගෙන බිරිඳ සමග පදිංචිව සිට ඇති බවත් ඔහු නිවෙස තුළ කංසා වවන බවට බූස්ස යුද හමුද කඳවුරේ බුද්ධි නිලධාරීන්ට ලැබුණ තොරතුරක් අනුව නිවස පරීක්ෂා කිරීමේදී අඩි 3ක් උසට වවා තිබූ කංසා ගස් තුනක්ද කුෂ් නමැති කංසා පැළ දහයක්ද කංසා ග්‍රෑම් 1075ක්ද සොයාගත් බව පොලිසිය කියා සිටියේය.

සැකකරු වෙනුවෙන් නීතිඥවරයා කියා සිටියේ තම සේවාදායකයා මෙම නිවෙස කුලියට ගෙන සිටින අතර මේ සම්බන්ධයෙන් කිසිවක් නොදන්නා බවය. එහෙත් නඩුව ඉක්මනින් අවසන් කර ගැනීමට අවශ්‍ය නිසා වරද පිළිගන්නා බවද නීතිඥවරයා කියා සිටියේය.

හික්කඩුව පොලිසියේ උපපොලිස් පරීක්ෂක අමරතුංග මහතා පැමිණිල්ල මෙහෙයවන ලද අතර සැකකරු වෙනුවෙන් නීතිඥ තුෂාරද සිල්වා මහතා පෙනී සිටියේය.

මාතර දිසා වන සංරක්ෂණයෙන් ව්‍යාපෘති 13 ක්

(දෙවිනුවර දම්සිරි කරුණානායක)

මාතර දිස්ත්‍රික් වන සංරක්ෂණ කාර්යාලය මගින් 2021 වසර සඳහා දිස්ත්‍රික්කයේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි ප්‍රධාන වැඩසටහන් 13ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරගෙන යන බව මාතර දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී හෙළිවිය.

ඒ අනුව පැළ නිෂ්පාදනය, දැනුවත් කිරීම (පාසල් ප්‍රජාව, රාජ්‍ය ආයතන) පැළ සිටුවීමේ වැඩසටහන්, වෙනත් පාසල් වැඩසටහන්, ගස් කළමනාකරණ වැඩසටහන්, ගෙවතු සඳහා පැළ ලබාදීම, වන වගා නඩත්තු, ස්වභාවික පුනර්ජනනීය වන වගා නඩත්තු (පැරණි සහ යෝජිත), පයිනස් වන වගා පළල් පත්‍ර බවට පත් කිරීමේ වගා නඩත්තුව, පූර්ණ හෙළීම, මංපෙත් නඩත්තුව (ඔලියන් කැලය, සිංහරාජය, පිටදෙනිය) යන කටයුතු සිදු කෙරේ. මෙම වැඩසටහන් වාර්ෂික ඉලක්කයක් සහිතව කරනු ලබන අතර මාසිකව ප්‍රගතිය අදළ අංශවලට ඉදිරිපත් කෙරේ.

මාතර දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ දිස්ත්‍රික් ලේකම් ප්‍රදීප් රත්නායක, අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) එන්. කේ.ආර්. පතිරණ යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

ජරාවට තිබූ වීරවිල වැව් තාවුල්ලට සුද්දයක්

(කතරගම විශේෂ රුක්මන් රත්නායක)

වීරවිල වැව් තාවුල්ල අවට ප්‍රදේශය, කැළි කසළ හා විවිධ අපද්‍රව්‍ය දමා මහත් පාරිසරික හානියක් සිදුකර තිබුණු බිම් තීරය, හම්බන්තොට ඉන්දියානු කන්සියුලර් ජනරල් කාර්යාලයේ සංවිධාන දයකත්වයෙන් පිරිසුදු කර, වටිනා දැවමය ශාක සිටුවීමක් ඉකුත්ද සිදු කරන ලදී.

ශ්‍රමදානයේ අවස්ථාවන් හා පැළ සිටුවමින්

වීරවිල වැවේ දිය නැමට පැමිණෙන ඇතැම් අය විසින් මෙලෙස කැළි කසළ දමා වැව් රක්ෂිතය දැඩිලෙස අපිරිසිදු කර තිබේ. මෙම අවස්ථාවට හම්බන්තොට ඉන්දියානු කන්සියුලර් ජනරාල් කාර්යාලයේ සේවක නිලධාරීන් ඇතුළු, ශ්‍රී ලංකා යුද හමුදාව, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව යන ආයතනයන්හි නොමසුරු දයකත්වයද ලබාදී තිබුණි.

මෙම පාරිසරික වැසටහන සඳහා හම්බන්තොට ඉන්දියානු කන්සියුලර් ජනරල් පී.ආර්. දීපින් මහතාද සහභාගී වී සිටි අතර, ඔවුහු වීරවිල වැව් තාවුල්ලේ වටිනා දැව ශාක සිටුවීමේ අවස්ථාවටද සම්බන්ධ වූහ.

අනුන්ගේ ඉඩමකින් මාර කඳන් සොරා ගත්තාට අත්හිටවූ සිරදඬුවම්

(දෙයියන්දර ජයන්ත ජයවර්ධන)

වරදක් කිරීමේ අදහසින් ඉඩමකට අයුතු ලෙස ඇතුළු වී රුපියල් විසි දහසක් වටිනා නැඳුන් මාර කඳන් හතරක් සොරකම් කිරීම පිළිබඳව චෝදනා දෙකක් යටතේ විභාග වූ නඩුවකදී වරදකරු බවට පිළිගත් අයකුට මාතර ප්‍රධාන මහේස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු ඉසුරු නෙත්ති කුමාර මහතා; පළමුවන චෝදනාවට වසරක බරපතළ වැඩ ඇති සිර දඬුවමක් නියම කර එම දඬුවම වසර දහයකට අත්හිටුවා, දෙවැනි චෝදනාවටද වසර දෙකක සිර දඬුවමක් නියම කර එම දඬුවම වසර දහයකට අත්හිටවනු ලැබීය.

චෝදනා දෙකට රුපියල් තුන් දහසක දඩයක් ගෙවන ලෙසටද නොගෙවන්නේ නම් මාස දෙකක සිරදඬුවමක් හා පැමිණිලිකරුට රුපියල් තිස් දහසක මුදලක් වන්දියක් වශයෙන් ගෙවන ලෙසටද නොගෙවන්නේ නම් මාස හතරක සිරදඬුවමක් නියම කළේය.

දඬුවම් නියම වූයේ මාතර ක්‍රිෂාන්ත වන්නිආරච්චි නොහොත් කලු කුමාර යන අයටය.

පැමිණිල්ල වෙනුවෙන් මාතර පොලිසියේ උපපොලිස් පරීක්ෂක ලක්ෂමන් මහතා පෙනී සිටියේය.

ගුරු උපහාර

දහසක් "පැන" නැගී ඇති මේ දුගී — බවේ
සහසක් කම්කටොලු මැඩගත් අමාරු — වේ
මිනිසෙක් සිටී නම් සේවය සඳා — ලොවේ
දෙවියෙක් දෙවි ලොවින් වැඩි ලෙස සමාන — වේ

ගුරුවරු බෝඩ් ඔසවා ගෙන මහ — පාරේ
මැතිවරු සමහරක් සහයක් දෙන — වාරේ
ගුරු හොරු පඩි අරන් යනවිට ගුරු — පාරේ
දෙවිවරු සම අයත් සිටිනා බව — තේරේ

නොදියුණු පිටිසරක තම දිවි කැප — කරන
ගුරුදෙවි කෙනෙකු ගැන ඇසුවා පින් — පුරන
මේ වැනි මිනිසුන්ද වෙසෙනා මේ — දෙරණ
ආසිරි වාදයකි, සිසුනට රැකවර — ණ

නොතකා දිවා රෑ සිසුනට දැනුම — දෙමින්
සැතපුම් පහළොවක් ඈතට පැමිණ — ගමින්
මේ ගුරුතුමා කැපවේ සේවයට — පෙමින්
උපහාරයකි මේ මල් දම ඔබගෙ — නමින්

සිසු දරුවනට ශිෂ්‍යත්වය දිනී — මට
නිසි ලෙස දැනුම දෙන ජයමග උදා — කොට
සමහරු මතු කළත් කරුණක් සිනා — වට
අපි නම් සුබ පතමු සේවය අගේ — කොට

මිරිජ්ජල
සිරි දන්තනාරායන

ඔබේ නිර්මාණ දකුණ කවි මඩුව "ලංකාදීප" කර්තෘ මණ්ඩලය, අංක 8, හුණුපිටිය හරස් පාර, කොළඹ 02. ලිපිනයට යොමු කරන්න.

මහ රෑ ගෙවල් බින්ද දෙදෙනෙක් කොටු

(වලස්ගල - නිමල් ලන්දගේ)

රාත්‍රී කාලයේ කිසිවකු නැති ගෙවල් බිඳ භාණ්ඩ හා ස්වර්ණාභරණ සොරකම් කිරීම හා මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදුණු දෙදෙනෙකු, විකුණා තිබූ එම භාණ්ඩ හා හෙරොයින්ද සමග (12) සවස පුටුගහහේන ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බව දික්වැල්ල පොලිසිය පවසයි.

මොවුන් ජයනෙත්තිගම, පුටුගහහේන, එන්.ඒ.ආර්. ගම්මාන යන ප්‍රදේශවලදී කරනලද සොරකම්වලට අමතරව මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදෙන බවත් පාළු නිවෙසක සිට අත්අඩංගුවට ගත් මෙම දෙදෙනාගෙන් එක් සැකකරුවකු සන්තකයේ හෙරොයින් ග්‍රෑම් 3 යි මිලි ග්‍රෑම් 200 ක් තිබූ බවත් පොලිසිය වැඩිදුරටත් කියයි.

මොවුන් විසින් බිඳින ලද නිවාස සමහරක් කොළඹ වැනි ප්‍රදේශවලට ගොස් සංචරණ සීමා නිසා පැමිණීමට නොහැකි වූ පුද්ගලයින්ගේ නිවාස වන අතර අත්අඩංගුවට ගත් භාණ්ඩ අතර රූපවාහිනී යන්ත්‍රයක්, ස්ටැන්ඩ් විදුලි පංකාවක් හා ගෑස් ලිප්ද අයත්වේ.

අත්අඩංගුවට ගත් 32 හා 26 වයසේ සැකකරුවන් හා භාණ්ඩ (13) අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

දික්වැල්ල පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක පී.පී.ටී. ඉෂාන් මහතාගේ උපදෙස් පරිදි, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක එච්.එස්. මදුරංග මහතාගේ මෙහෙයවීමෙන්, උපපොලිස් පරීක්ෂක ශාන්ත කොඩිතුවක්කු, පොලිස් සැරයන් (16955) නිහාල්, (55850) සුමතිපාල, (62135) තිලකරත්න, (35577) අමරබන්දු, (42780) පීරිස්, පොලිස් කොස්තාපල් (40458) දිසානායක, (89309) කුමාර, (4051) ධම්මික යන නිලධාරීහු සැකකරුවන් අත්අඩංගුවට ගත්හ.

උස්සපු යතුරුපැදිවලින් ගිහින් මාල කඩලා

(හක්මන විශේෂ - දෙනගම යසන්ත ආරියසේන)

පැහැරගත් යතුරුපැදියකින් පැමිණි සැකකරුවන් දෙදෙනකු ඉකුත් දහතුන් වැනි දින සවස නරවැල්පිට උතුර ප්‍රදේශයේ එම යතුරුපැදිය දමා තවත් නවීන පන්නයේ යතුරුපැදියක් පැහැර ගෙන කාන්තාවකගේ රන්මාලයක් ද කොල්ලකා පලා ගොස් ඇතැයි හක්මන පෙලිසිය කියයි.

නරවැල්පිට උතුර ප්‍රදේශයේ තරුණයෙකු සිය යතුරුපැදියෙන් පැමිණ වෙළෙඳසැලක් අසල නතර කොට දුරකතන කාඩ් පතක් මිලදී ගැනීමට වෙළෙඳ සැල තුළට ගිය අවස්ථාවේදී සැකකරුවන් දෙදෙනා යතුරුපැදියකින් පැමිණ රුපියල් ලක්ෂ හතරකට වැඩි වටිනාකමක් ඇති යතුරුපැදිය මෙලෙස පැහැරගෙන ගොස් ඇති අතර සැකකරුවන් පැමිණි යතුරුපැදිය එම ස්ථානයේ දමාගොස් තිබියදී පොලීසියට හමුවී ඇත.

සැකකරුවන් පලා යමින් සිටියදී නරවැල්පිට නැගෙනහිර ප්‍රදේශයේ නිවසක් අසල සිටි කාන්තාවකගේ රූපියල් එක් ලක්ෂ පනස් දහසක් පමන වටිනා පෙන්ඩනය සහිත රත්තරන් මාලයක් කොල්ලකා පලා ගොස් ඇති බවත් සැකකරු දමා ගොස් තිබූ යතුරුපැදිය ඉකුත් දෙළොස් වැනිද සූරියවැව ප්‍රදේශයේදී පැහැරගත් එකක් බව පරීක්ෂණවලදී අනාවරණය වන බව පොලීසිය කියයි.

හක්මන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.ජී.ඒ. සනත් කුමාර මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් පරීක්ෂකවරුන් වන ආර්. ප්‍රේමතිලක, එස්. විජේසේකර, උපපොලිස් පරීක්ෂක ඒ.පී. ජයසේන, පොලිස් කොස්තාපල් (86387) රත්නප්‍රිය යන මහත්වරු වැඩිදුර පරීක්ෂණ සිදු කරති.

මේ ලංකාදීප තාරුණ්‍යයේ පිටුවයි

නවරැල්ලට ඔබේ නිර්මාණ විද්‍යුත් ලිපිනය හරහාද එවිය හැකිය.
විද්‍යුත් ලිපිනය -
nawarallawnl@gmail.com



විදෙස් නාට්‍ය ආක්‍රමණය කළ අපේ සොඳුරු ටෙලි කතා



ශ්‍රී ලංකාවේ ටෙලිනාට්‍ය කලාවේ උපත දිමුතු මුතු නම් සොඳුරු වූ ටෙලි කතාවකින් සිදුවූ බව අපගේ මතකයේ අදටත් මිහිදන්ව ඇත. අපේ රටට, අපේ සංස්කෘතියට උචිත අපේ පවුල් ඒවලට වඩාත් ගැළපෙන තේමාවන්ගෙන් සපිරි ටෙලි කතා ඒ පසු පස්සේ බිහි විය. අදටත් ඒවායේ සොඳුරු මතක සැමගේ සිත් මත ඉතිරිව ඇතිවා සේම උසස් රසවින්දනයක් ලබා ගැනීමේ හැකියාව ද ප්‍රේක්ෂකයාට නිතැනින්ම හිමි විය.

එහෙත් වර්තමානයේ රූපවාහිනී නාලිකා බිහිවීමේ ප්‍රවණතාවයත්, ඊට සමගාමීව පෙන්වනු ලබන ටෙලිකතා ප්‍රමාණයත් දිනෙන් දිනම වැඩි විය. ඒ අතරතුර ආක්‍රමණශීලි වෙසින් පැමිණි විදෙස් ටෙලි නාට්‍ය අපගේ සැම සියලු නාලිකාවක්ම ඉතා ඉක්මණින් තම ග්‍රහණයට හසු කරනු ලැබීය. අද විදෙස් ටෙලි නාට්‍යයක් විකාශනය නොවන නාලිකාවක් සොයා ගැනීමට පවා අපහසුය.

ලෝකය එකම පියස්සක් යටට ගෙනා ගෝලීයකරණය ටෙලිනාට්‍යය කලාවට ද එකසේ බලපෑවේය. විදෙස් ටෙලි නාට්‍ය බැලීමට පහසුකම් නොමැති ඒ සඳහා ප්‍රියතාවයක් දැක්ක වූ ප්‍රේක්ෂකයාට එය මහඟු අවස්ථාවක් විය. භාෂාවේ දැනුම අඩු ප්‍රේක්ෂකයාට පවා අපගේ මවු භාෂාවෙන් හඬ කවන එම ටෙලි නාට්‍ය බැලීමට අවස්ථාව එයින් උදා වීණි.

එහෙත් අද පවතින්නේ ඉතාමත් ශෝචනීය තත්ත්වයකි. විදෙස් ටෙලිනාට්‍ය විකාශනය සඳහා තෝරා ගැනීමේ දී අප විසින් භාවිත කරන්නෙ කුමන මිනුම් දඬු ද යන්න ගැටලුවකි. සමහර ටෙලිනාට්‍ය තැරඹීමේ දී එහි කොටස ගණන අප ජීවත්ව සිටිය දී නරඹා අවසන් කළ හැකි ද යන්න පවා ගැටලුවකි. එසේම සමහර පවුල් ඒ සම්බන්ධයෙන් විකාශනය වන ටෙලි නාට්‍ය තැරඹීමේ දී මෙම සිදුවීම් මිහිපිට සිදුවිය හැකිද? යන්න පවා සිතාගත නොහැකිය. එකම පවුලේ අඹුදරුවන් මවුපියන් සහෝදර සහෝදරියන් නෑයන් අතර සිදුවන කුමන්ත්‍රණ වෛරකාරී සිතුවිලි අනෙකා පරායා නැගී සිටීමට දරන වෑයම ඉතා පිළිකුල් සහගතය. පෙම්වතුන් පෙම්වතියන් අතර සිදුවන්නේ කුමන්ත්‍රණය. ආදරයෙන් එක්වීමක් දැකගත නොහැකිය. සමහර ටෙලි නාට්‍ය අපේ රටට අපේ සංස්කෘතියට ගැළපෙන්නේ දැයි හැඟෙන වරක් සිතා බැලිය යුතු තත්ත්වයක් උද්ගතව ඇත.

පොදුවේ ගත්කළ මේ ටෙලිනාට්‍ය අපේ මනස විකෘති කර දමනු ලබයි. ටෙලි නාට්‍යයක් නැරඹීමෙන් අප බලාපොරොත්තු වන්නේ යම්කිසි මානසික විත්දනයකි. එහෙත් මේ නාට්‍ය තුළින් ප්‍රේක්ෂකයාට එවන් සන්තෝෂජනිතයක් ලැබෙනවාදැයි සොයා බැලිය යුතු කරුණකි. තවද උසස් රස විත්දනයක් ලබා ගැනීමට හැකි ටෙලිනාට්‍ය තෝරා ගැනීමට හැකියාව තිබියදීත් අප යන්නේ මංමුළා වූවන්සේය. ඒ තුළ උසස් නිර්මාණයක් රසවින්දනය කිරීමට ප්‍රේක්ෂකයාට තිබෙන අයිතිය මගහැරී ඇත.

ශ්‍රී ලාංකික බොහෝ ප්‍රේක්ෂකයන් මෙම ටෙලිනාට්‍ය නරඹන බව නොරහසක් නොවේ. අපේ රට තුළ පවුල් අතර සිදුවන අපරාධ වගේම සමාජීය වශයෙන් සිදුවන විවිධ අපරාධවලට මෙම කතා පාදක නොවනවා සේ සිතිය නොහැකිය. ඒ වගේම තරුණ පරපුර නරක ඇබ්බැහිවීම්වලට යොමුවීමට පවුල් ඉහිරීම්වලට, ළමා හිංසනයන්ට වැනි සමාජ පරිසරයක් තුළ නොසිඳු විය යුතු බොහෝ කරුණුවලට මෙම ටෙලිනාට්‍ය කතා මුල් නොවනවා සේ සිතීමට අපට කරුණු කාරණා නොවේ.

අපට පෞඩවත් ඉතිහාසයක් උරුමව තිබේ. හොඳ සංස්කෘතියකට උරුමකම් කියන අපිට පවුලේ බාල මහලු වැඩිහිටි සියලු දෙනා විසින් එකට හැරඹිය හැකි අපේ රටේ සොඳුරු ටෙලිනාට්‍ය කලාවක් ද දායාදව තිබේ. එහෙත් අද ඒ සොඳුරු ටෙලිනාට්‍යවලට සිදු වූයේ කුමක්ද? යන්න සිතෙන විටත් හද කම්පා කරයි. ඔබට මට අමතක කරන්න බැරි අපේ රටේ සොඳුරු ටෙලිනාට්‍ය වූ යසෝරාවය, ගම්පෙරළිය. දූ දරුවෝ අසලවැසියෝ දඬුබස්නාමනය වැනි ටෙලිනාට්‍ය අදටත් අපේ සිත් තුළ මහා දැවැන්තයන් ලෙස අරක් ගෙන සිටී. එහෙත් අද එවන් උසස් නිර්මාණ රසවිඳුමට ප්‍රේක්ෂකයාට තිබෙන අයිතිය කුමක්දෝ බලවේගයකින් අහිමිවී ඇත.

අද එවන් සොඳුරු උසස් රසවින්දනයක් සහිත කතා විකාශය වීමේ අඩුවක් දක්නට ලැබේ. සමහර ටෙලිනාට්‍ය විදෙස් ආභාෂය ලබා ඇත. අපේ සංස්කෘතියට ගැළපෙන නිර්මාණ බිහිවීමේ අඩුවක් දක්නට ඇත. උසස් රසවින්දනයක් ලැබීමට නම් උසස් ගුණාත්මක බවින් යුත් නිර්මාණ බිහිවිය යුතුය. අද වළපලලට යමින පවතින්නේ අපේ මේ උසස් නිර්මාණයනය. එබැවින් එය රැක ගැනීමටත් මතු පරපුර වෙනුවෙන් ආරක්ෂා කරදීමේ වගකීම අප සතුය.

ධවල පත්‍රිකාව...
ශ්‍රීමානි ප්‍රියංගිකා,
විහාරගොඩ, බදුල්ල

මල් කැකුළු පිපෙන්නට ඉඩ දෙන්න

යම් රටක දරුවන් හද වඩා ගන්නා ආකාරයත් අධ්‍යාපනය පෝෂණය, සෞඛ්‍යය සහ රැකවරණය ලබා දෙන ආකාරයත් එරට අනාගත පැවැත්ම තීරණය වේ. වර්තමානයේ කුඩා දරුවා අනාගතයේ රට පිළිබඳව වගකීම් දරන්නෙකි. 'ළමයා වනාහි ඉදිරි කාලයේ බිහි වන මිනිසාය' යනුවෙන් ඇරිස්ටෝටල් පඬිතුමා ළමයාව අර්ථවත් කළේ එබැවිනි. රටේ කොඳුනාරටිය තරුණ පරපුර නම් රටේ ජීවනාලිය ළමා පරපුරයි. රටේ ජීවය බඳු දරුපරපුර විවිධ උවදුරුවලින් ආරක්ෂා කිරීම වර්තමානයේ මවුපියන් සතු අභියෝගයකි.

සමාජය යනු විචාරවූත් අවිචාරවූත් සංකලනයකි. සමාජයේ වෙසෙන මිනිසුන් සුදු කළු යනුවෙන් ඉර් ගසා වෙන්කළ නොහැකිය. සෑම සමාජයකම දක්නට ලැබෙන්නේ අළු පැහැති චරිත ගත් මිනිස්සුය. යහපත අඩිබිවා අයහපත ග්‍රහණය කරන සමාජයක ළමයා යනු නොමේරූ තැනැත්තෙකි. ළමයා කිසි විටෙක කුඩා මිනිසෙකු නොවන අතර ඔහු හෝ ඇය කායිකව හා මානසිකව යැපෙන්නෙකි. එනම් සම්පූර්ණයෙන් අනුන් මත ජීවත් වන රැකවරණය හා සෞඛ්‍යය විවිධ ජීඩාවන්ට ගොදුරු විය හැකි තැනැත්තෙකි. එවැනි ළමයි මල කැකුළු වැනිය. අවුරුදු 18 ට අඩු සෑම අයෙක්ම 'ළමයා' නම් වන බව ළමා ප්‍රඥප්තියේ සඳහන් වේ. යැයෙන මානසික තත්ත්වයේ සිට ස්වාධීන මානසිකත්වයට යාමට ගතවන කාලය 'ළමාවිය' නම් වේ. මිනිසාගේ ළමාවිය සෙවණැල්ලක් මෙන් ජීවිතය පුරා ක්‍රියාත්මක වෙයි. එහි ඇතැම් සිදුවීම් මිනිස් මනසට තදින් බලපෑම් කරයි. එහි ප්‍රතිඵලය වශයෙන් ඔහුගේ ජීවිතය යහපත් හෝ අයහපත් වීමට පසුකාලීනව බලපෑම් කරයි. 'අපයෝජනය' යනු වරදදැහි යෙදවීමයි. එනම් දරුවන් වෙනුවෙන් සිදු කළ යුතු දේ නොකිරීමත, නොකළයුතු දේ සිදු කිරීමත් අපයෝජනය නම් වේ. කායිකව, මානසිකව, ලිංගිකව යනාදී තුන් ආකාරයෙන්ම අපයෝජනයට ළමයා දෛනිකව ගොදුරු වන බැවින් විනාශ වන්නේ මෙරට අනාගත පරපුරයි. මෑයට හොඳම උදාහරණය වන්නේ මෑතකදී අන්තර්ජාලය ඔස්සේ අලෙවි කළ බලා වයස්කාර දැරියට ලිංගික අපයෝජනය සිදු කිරීමේ ආන්දෝලාත්මක සිදුවීමයි.

ළමා අධිකාරියට ලැබෙන පැමිණිලි අනුව බහුල වශයෙන්ම අපයෝජනයට ගොදුරු වන්නේ යොවුන් විය පසුවන දරු දැරියන්ය. යොවුන් විය යනු වයස අවුරුදු 11- 18 අතර කාල සීමාව වේ. එය දරුවා වැඩිහිටියෙකු බවට පත්වන සංක්‍රාන්තික කාල සීමාවක් ලෙස සැළකේ. මෙහිදී ශාරීරික වෙනස්කම් සමඟ ඇතිවන මානසික තත්ත්වයන් හමුවේ බොහෝ දරුවෝ හුදකලා අරගලයක යෙදෙති. ඔවුහු කුතූහලය හා විරුද්ධ ලිංගික ආකර්ශනය මත අලුත් දෑ සොයා යාමත්, විවිධාකාර අත්දැකීම් සමාජය තුළින් ලබා ගැනීමටත් වෙහෙසෙති. තමා වැඩිහිටියෙකු ලෙස සිතීමට පෙළඹීම නිසා විවිධාකාර රැවටීම්වලට ගොදුරු වෙති. බොහෝ ළමා අපචාර සිදු වී ඇත්තේ සමීප පුද්ගලයන්ගෙන් වීම විශේෂත්වයකි. එනම් දරුවාගේ විශ්වාසය දිනාගත් තාත්තා, සීයා, බාප්පා, සුළුපියා, මාමා, මස්සිනා, සහෝදරයා යනාදී ඥාතීත්වයක් ඇති අයගෙන් මෙන්ම ඇසුරු කරන පුද්ගලයන් වන අසල්වැසියා, යහළුවා, ගුරුවරයා, විදුහල්පතිවරයා හා ප්‍රජා පක්ෂය අතින්ද අපයෝජනයටත්, දූෂණයටත් ලක් වේ. එසේම යොවුන් දැරියන් ප්‍රේම සබඳතා පැවැත්වීම හේතුවෙන් තම පෙම්වතා අතින් දූෂණයට ලක් වේ. බොහෝ විට ළමයින් අපයෝජනයට ලක් කර ඇත්තේ රැවටීමෙන් හෝ බිය ගැන්වීමෙනි. වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකුගේ කැමැත්ත ඇතිව හෝ නැතිව කායිකව එක් වීම 'ස්ත්‍රී දූෂණයක්' ලෙස අර්ථ දක්වයි. ස්ත්‍රී දූෂණයක් නොවෙන වෙනත් ආකාරයේ ලිංගික අතවර ලිංගික අපයෝජන නම් වේ.

කුමුදු සංජීවනී පෙරේරා
සිංහල ඩිප්ලෝමාධාරී, කොළඹ විශ්වවිද්‍යාලය

මෙම වැරදිවලට බරපතළ වැඩ ඇතිව අවුරුදු 20 දක්වා සිරගත කළ හැකිය. ලැජ්ජාව, බිය සහ ගෞරවය හේතුවෙන් ඇතැම් ළමා අපචාර හීතිය ඉදිරියට නොගොස් නිහඬව විඳ දරා ගැනීම කිසිසේතම යහපත් තත්ත්වයක් නොවේ. එය අපයෝජකයාට තව තවත් අපරාධ කිරීමට රුකුලක් වනු ඇත.

යම් අවාසනාවකට තම දරුවා අපයෝජනයට ගොදුරු වී ඇති බව මවුපියනට අවබෝධ කර ගත හැක්කේ දරුවාගේ අමුතු හැසිරීම් මතය. එනම් දරුවා එකවර නිහඬවීම, කල්පනා බරිත වීම, නිවසේ සමාජිකයන් ඇසුරු කිරීමට ඇකමැති වීම, යමක් ප්‍රකාශ කිරීමට උත්සාහ කිරීම, හදිසියේ ඇතිවන වෙනස්කම් සමඟ ඇතිවන මානසික තත්ත්වයන් හමුවේ බොහෝ දරුවෝ හුදකලා අරගලයක යෙදෙති. ඔවුහු කුතූහලය හා විරුද්ධ ලිංගික ආකර්ශනය මත අලුත් දෑ සොයා යාමත්, විවිධාකාර අත්දැකීම් සමාජය තුළින් ලබා ගැනීමටත් වෙහෙසෙති. තමා වැඩිහිටියෙකු ලෙස සිතීමට ළමා අධිකාරියට ලැබෙන පැමිණිලි අනුව බහුල වශයෙන්ම අපයෝජනයට ගොදුරු වන්නේ යොවුන් විය පසුවන දරු දැරියන්ය. යොවුන් විය යනු වයස අවුරුදු 11- 18 අතර කාල සීමාව වේ. එය දරුවා වැඩිහිටියෙකු බවට පත්වන සංක්‍රාන්තික කාල සීමාවක් ලෙස සැළකේ. මෙහිදී ශාරීරික වෙනස්කම් සමඟ ඇතිවන මානසික තත්ත්වයන් හමුවේ බොහෝ දරුවෝ හුදකලා අරගලයක යෙදෙති. ඔවුහු කුතූහලය හා විරුද්ධ ලිංගික ආකර්ශනය මත අලුත් දෑ සොයා යාමත්, විවිධාකාර අත්දැකීම් සමාජය තුළින් ලබා ගැනීමටත් වෙහෙසෙති. තමා වැඩිහිටියෙකු ලෙස සිතීමට

අපි කතා කරන්නේ සිතට එකඟවද?

අපේ සමාජයේ සමහර දෙනෙක් සමාජයට කතා කරන්නේත් සමාජයට ප්‍රකාශ කරන්නේත් සිතට එකඟ අදහස් ද කියා විමසීම ඉතා අවශ්‍ය වේ. සමාජය පුරා දේශපාලන වශයෙන් ද සාමාජික වශයෙන් ද ආර්ථික වශයෙන් ද ප්‍රකාශ වන කතාවල ඇත්තේ ඔවුන්ගේ හදවත්වලට එකඟ අවංක අදහසදැයි අද වැනි යුගයක විමසා බැලීම ඉතා සිදුසු වේ.

දේශපාලන කතාවන්හි දී තම තමන්ගේ පක්ෂය ආරක්ෂා කර ගැනීම තමන්ගේ ප්‍රතිරූපය ගොඩනගා ගැනීම තම තමන්ගේ වාසිය තකා පිල්මාරු කිරීම ආදී බොහෝ කරුණුවල දී අපට පැහැදිලි වන්නේ බොහෝ කාලයක පටන් අපේ පාලකයන් සිදු කළේ ජනතාව මුලා කිරීම බවය. අද ද සිදුවන්නේ එයම නොවේදැයි කෙනෙකුට නොසිතෙන්නේද?

නිදහසින් පසුව වසර ගණනාවක් තිස්සෙම අප ගමන් කරනුයේ බොරුවෙන් සහ වංක භාවයෙන් අනූන වූ දේශපාලන ගමන් මඟක බව මෙහි දී පැහැදිලිවේ. පක්ෂ වශයෙන් සහ කණ්ඩායම් වශයෙන් එක් රොක් වන අපගේ බොහෝ දේශපාලන නායකයෝ සහ ඔවුන්ගේ අනුගාමිකයෝ ද අවසානය ප්‍රත්‍යක්ෂ සිදු කරන්නේ ජනතාව මුලා කිරීම බව පැහැදිලිවම දක්නට ලැබේ. අද ඇත්තේ ඉතා දියුණු මාධ්‍ය සංස්කෘතියකි. මාධ්‍ය හමුවන්නට පෙනී සිටින බොහෝ දෙනෙක් සඳහන් කරන්නේ තමන්ගේ පක්ෂය හෝ තමන් හෝ ජනප්‍රිය වීමේ ප්‍රකාශයන්ය. උදේ කියන ලද දෙය සවසට අමතකව යන බොහෝ දෙනා මාධ්‍යවල දී ප්‍රකාශ කරන්නේ පරස්පර විරෝධී ප්‍රකාශයන්ය. බොහෝ දෙනාගේ කතා අවසාන වන්නේ කිතුල් ගහට ගිය මිනිහාත් නිදහසට කරුණු කීවක් මෙන් ඇඟ බේරා ගැනීමේ ප්‍රකාශයන්ය.

දිනපතාම කෙළවරක් නැති සාකච්ඡා හදිසි රැස්වීම් විශේෂ ප්‍රකාශ ආදී ප්‍රස්තුතයන් ගෙන් අපේ සාමාන්‍ය ජනතාවට ඇත්තේ කුමන ප්‍රයෝජනයක්දැයි විමසීම ඉතා අවශ්‍යය. සමාන්‍ය ජනතාව පත්ව ඇත්තේ ජීවත්වීමේ ඉතා අපහසු අවස්ථාවකය. සාකච්ඡා රැස්වීම අවසානයේදී මාධ්‍යවේදීන්වත් හොරා පස්සා දොරෙන් පැන යන බොහෝ දෙනෙක් එසේ සැඟව යන්නේ මාධ්‍යවේදීන් අසන ප්‍රශ්නවලට සිතට එකඟව උත්තර දීය නොහැකි බැවිනි.

කේ. මහතුන් ගමගේ
වෙලතුඩුවවත්ත, ඇත්තිලිගොඩ, ගාල්ල

එදා පටන්ම අපගේ පාලකයන් බොහෝ දෙනෙක් ජනතාව බොරුවෙන් ඇත්ද වූ බව අමතක නොවේ. මේ ළඟක ද අපගේ එක් ඇමැතිවරයෙක් ප්‍රකාශ කළේ. ඇට නැති දිව ඕනෑම අතකට හරවා කතා කළ හැකි බවය. එසේ කීවේ රජයේ තවත් ඇමැතිවරයෙකුගේ ප්‍රකාශයකට පිළිතුරු ලෙසින්ය. අපේ සමහර දේශපාලනඥයන් මාධ්‍යවලට ප්‍රකාශ කරන්නේ සමහර කරුණු පිළිබඳව ඇඟ බේරා ගන්නා ප්‍රකාශයන්ය. එදා ඉන්දියාවේ සිටි සංජය ගෙල්ලට්ටි පුත්ත ප්‍රකාශ කළේද එවැනි අදහස්ය. ඇත්ත ඇති සැටියෙන් නොකියන අපේ සමහර දේශපාලනඥයන් මාධ්‍යවලදී සිනා සෙමින් මෙනවා හෝ ප්‍රකාශ කරන්නේ ඔවුන්ට වෙන් කළ හැකි දෙයක් නැති බැවිනි.

ලමි ළඟකදී ගාල්ල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයක රැස්වීමකදී සඳහන් කර තිබුණේ තමන්ට නිදහසේ කතා කිරීමට නිදහසක් නැති බවය. එයින් පැහැදිලි වන්නේ ඇත්ත ඇති සැටියෙන් කතා කිරීමට එතුමියට නිදහසක් නැති බවය. ආණ්ඩුවේ සිට ආණ්ඩුව විවේචනය කරමින් කතා කරන්නට නොහැකි නිසා නිදහසේ කතා කිරීම සඳහා එතුමිය දෙවියන්ගෙන් පිහිටක් ඉල්ලා සිටින බව එම කතාවේ සඳහන් විය. වැරදීම මිනිස් ගතියක් බවත් සමාව දීම දේවගතියක් බවත් කුඩා කාලයේ අසා ඇත්තෙමු. ඒ අනුව දෙවියන් ඇසට උදව් කරාවී දැයි අපි බලා සිටින්නෙමු.

ඇත්ත ඇති සැටියෙන් ප්‍රකාශ කරන්නට යාමෙන් දඬුවම් විඳීමට ද සිදුවිය හැකි බවද එයින් පැහැදිලි වේ. එනිසා අද බොහෝ විටම සිදු වන්නේ අතත්ත කතා නොකර සිතට විරුද්ධව බොරු කියා තමන්ගේ තැන රැක ගැනීම බව එයින් සමාජයට හෙළි වන්නේය. මුහුණ හදවත කියා පාන කැඩපතක් බව නුවණ ඇත්තෝ දනිති. ඒ අනුව අපේ සමහර දේශපාලනඥයන් මාධ්‍යයන්ට සිනහ මුහුණින් යුතුව කියන ප්‍රකාශයන්ගෙන් හෙළි වන්නේ ඔවුන්ගේ හදවත් එම ප්‍රකාශයන්ට එකඟ නැති බවය. එනිසා මේ පිළිබඳව අප විමසා බැලීම ඉතාම අවශ්‍ය බව කිව යුතුය.



මුළාව.....

තත්පරෙන් තත්පරය නික්මිලා
මිනිත්තුව හෝරාව
දිනය සති මාස ලෙස පැමිණිලා
වසර බෝ ගණනක් රැඳෙනවා
ජීවිතයෙ අපි මුලාවීලා
රැකියාවල යෙදිලා
හැඩ රුවට නිවෙස් ඉදිකරලා
අඹු දරුවො සමඟ සතුටින් රැඳිලා
තවත් බෝ දේ කරලා
ජීවිතය යයි නොදැකීම ගෙවිලා
දිවි මගෙහි සැඳෑ කල එළැඹිලා
අපට සසර බිය පෙන්වලා
ඒ මොහොත පැමිණි දින
බණ පොතක් කියවන්න -
නෙත් යුගල නොපෙනෙනා
බණ ටිකක් අසනු බැහැ -
සවන් පත් සිරවෙනා
විහාරයට යන්න බැහැ පා
යුගල පැටලෙනා
උපන්ද සිට වියපත් වනතෙක්
මුලාවේ රැඳී ඉඳලා
පැමිණි සසර මග පමා වූ බව
නොපෙන්වා
ආයුෂය නිම වෙයි ජීවිතය
මුලාකරලා

සුනිල් වික්‍රමසිංහ
තිබ්බොටුවාව, අකුරැස්ස.

කිතුල් මදින්නාගේ කවිය

ගස අඟ පිපි මල මසිත සිනාවේ
නුඹෙ හදවතෙ පැන් දුක නිවුනාවේ
සිහිනෙක තනි වී හිරුද උදවේ
නුඹ දැක ගන්නයි උදයෙම ආවේ....

සුම්තුර නුඹෙ පැන් වස විස නොකරමි
මුදලට හිඳු වී තණ්හා නොකරමි
දිව රස පිනවන මසමුල සපයමි
හැම හදකම නුඹ මතකයෙ රඳවමි

මගෙ පොඩි පැටවුන් නුඹ ගැන විමසති
ඉහළට මා යන විට උන් ගෙට යති
උන් ගැන සෙනෙහය මගෙ හද උණුවෙති
සැම දැණය ගැති නුඹ මට දෙවියකි

එච්.ජී. සුමිත්
පරගොඩ, ඉමදුව.

සසරේ පුරුදු රුවකට වහ වැටුණාදෝ

බට්ටච්චියක් ගොදුරුව කළු — කපුටෙකුට
අම්බරෙ ඇදී යනු දුටු හුරු — හදවතට
පෙර විඳි සුවඳ මෝදුව එයි — මතකයට
සේයා සිහින ජායා මිහිරකි — සිතට

නොසිතූ නොපැතූ මොහොතක ලද අනග — සුවේ
හදවත පුබුදු විය විඳිමින් මිහිරි — සුවේ
පෙරුම් දම් විලස හමුවී යළිදු — බවේ
සියුමැලි ගතෙහි පීනා විඳගනිමු — සුවේ

රනහංසිය රඟන නිල්දිය — කාමවිලේ
රෑ හදපානේ සිහිලැල් දිය — සලිතකළේ
රෑ කුසුමකින් වැගිරෙන මී බඳු — වදුලේ
භවයේන් භවය ලද උරුමය — පුබුදු කළේ

නැගෙනා කඳුළු සිර කරගෙන — ලයමඩලේ
මැකිලා රිදී ඉරි අඳුරුය — දිවිමඩලේ
සිසිලස විඳිමි උණුසුම් වන පෙම් — ගඟුලේ
මිහිරාවියයි රස උල්පත — මෝදුකළේ

තනිකර දමා දුකදී දුර යන්න — එපා
ඒ දුක වාවගනු බැරි හද තලනු — එපා
මල් යහනක හොවා සිපගම් සුබුදු — දෙපා
මතු භවයෙදීත් ඉගිලී තනිකරනු — එපා

පේ. කණ්ඩම්බි, දම්මුල්ල - බෙලිඅත්ත.

ගුරු මඬල මොහොතකට නැවතිලා රිදුම්ගෙන



සඳ මඬල දෙන සිසිල
කෙතරම්ද මිහි මතට
පතුරවන සොම් ගුණය
අගනේය මනරම්ය

පුරා රැය දිදුළවන
දිවාකල සැඟව යන
එසඳ මඬලෙහි සිරිය
ගෙන දේද අමාවක?

රිවි මඬල දෙන කිරණ
දිස්වේය ඔද තෙදින
සුවය දී එළිය දී
අරුත ගෙන නව දිනක

තුරු වදුලු පලවැලට
පණ පොවා සැනසුවට
හිඳිනු නැත රිවි කිරණ
රැය පුරා නොතනියට

අපරිමිත මෙහෙවරින්
මිහිමඬල පිබිද වූ
ගුරු මඬල මොහොතකට
නැවතිලා
රිදුම් ගෙන

හැකිවේද රිදවන්න
ගුරු මඬල කළඹන්න
දිවා රැය නොතනියට
ජීවිතෙන් දිරිදුන්න.

දුටුවාද ගුරුමඬල
දැනුනාද ගුරුමඬල
සිසු කැලට මග කියන
නැණ පහන් දිදුළවන

මදුමාලි වික්‍රසිංහ මුතුකුමාරණ.
කටුවන

ජීවන හුස්ම



ඔය සුසුම් පවන් සළනු නැහැ මට
අවුළුවමින් හිණි දැවෙයි
මා පපුව
ගැනීමට නොහැකිව හුස්ම
නුඹ මරු හා කරන සටන
දියණියට පුතුට ගොඩනඟන්නට
හෙට දින නුඹ පිම්බ ජීවන හුස්ම
සිහිව එයි මට නිතර
ගිනි ගනියි මගේ පපුව
පාලු ගිලන් ඇඳ මත
නුඹ, දිවි යදින යුරු
පියවි නෙතට නොපෙනුණත්
දැනෙයි මට ඒ දුක් සුසුම
බුදුහිමි සරණින්
සියලු දෙවි රැකවරණින්
සුවපත්ව යළි එන්න
ආයෙමත් පිඹින්නට
මගේ දිවියට ජීවන හුස්ම

අජිත් ගමගේ
ගාල්ල

පඩි කතා

ගුත්තිල ගුරාවේ
මූසිල මුලාවේ
ඇත්ත යටගියාවේ
අදත් පඩි කතාවේ

එදා දුන් පොරොන්දු
මටත් තාම සිහිවේ
මෙදා අපව ඇන්දූ
හෙටත් මේක සිදුවේ

එදා සක් දෙවිඳු මෙහෙයූ
ගමන කෙටි කලින් නිම වූ
මෙදා කොක් රජිඳු ඇට වූ
අපට මැටි වලක් ඉදිවූ

දයා පී. ගොඩකුඹුර
සියඹලාගොඩ බෙලිඅත්ත

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 අගෝස්තු මස 18 වැනිද බදාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.

බියගම ප්‍රාදේශීය සභාව

අඩු ආදායම්ලාභීන්ගේ කොවිඩ් මරණ ආදාහනය නොමිලයේ

සභාපති

(දෙල්ගොඩ - සුදත් පුබුදු කීර්ති)

බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පදිංචි අඩු ආදායම්ලාභීන්ගේ කොවිඩ් මරණ ආදාහනය කිරීම මුදල් අය කිරීමකින් තොරව සිදු කිරීමට කටයුතු කරනවා යැයි ද මේ වනවිට ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩිම කොවිඩ් රෝගීන් සංඛ්‍යාවක් බියගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් දිනපතා වාර්තා වන බවත් බියගම ප්‍රාදේශීය සභාවේ ශක්තිය උපරිමයෙන් සෞඛ්‍ය අංශ වෙත ලබාදී කොවිඩ් වසංගතය මැඩපැවැත්වීමට කටයුතු කරමු යැයි ද බියගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආනන්ද ගනේපොල මහතා පැවසීය.

බියගම ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීමේ මුලසුන හොබවමින් සභාපතිවරයා එසේ පැවසීය. මාවරමංඩිය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී අගෝස්තු මස 05 වැනිද මහා සභා රැස්වීම පැවැත්විණි. මෙම යෝජනාව ඉදිරිපත් කරමින් අදහස් දැක් වූ සභාපතිවරයා මෙසේ ද කීවේය.

රාගම රෝහලේ අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම පරිදි බියගම ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන සියඹලාපෙවත්ත ආදහනාගාරය, මාකොල නෙල්ලිගහ කනත්ත ආදහනාගරය හා පමුණුවිල ගල්ඒදණ්ඩ සේපාල කනත්ත ආදහනාගාරවල කොවිඩ් මළ සිරුරු ආදහනය කිරීමට පියවර ගන්නවා.

කොවිඩ් රෝගියකුගේ මරණයක දී නිකුත් කරනු ලබන මරණ සහතිකයේ අප බල සීමාවට අයත් ආදහනාගාරවල නම සඳහන් මරණ සහතිකවලට පමණක් මෙම ආදහනාගාරවල පහසුකම් ලබාදිය හැකි බැවින් මරණ සහතික නිකුත් කරවා ගැනීමේ දී මෙම ආදහනාගාර තුනෙන් එකක නම සඳහන් කරවා ගන්නා ලෙස එම ඥාතීන්ගෙන් ඉල්ලා සිටිනවා.

විපක්ෂ නායක ප්‍රසන්න සම්පත් මහතා (එ.ජා.ප.)

මාබිම ප්‍රදේශයේ පහත් බිමකට වීදි රේබා සහතිකයක් ලබා දීමට පුද්ගලයෙකුගෙන් රුපියල් ලක්ෂ 15 ක මුදලක් අල්ලස් ලබාගෙන තිබෙනවා. සභාපතිතුමාගේ අනුදැනුමකින් තොරව සිදු වී ඇති මේ සිද්ධිය පිළිබඳව පරීක්ෂණයක් සිදු කරන්න.

මාබිම ඉඩමකට වීදි රේබා සහතිකයක් ගන්න ලක්ෂ 15ක් අල්ලස් අරන්

විපක්ෂ නායක

බියගම කොවිඩ් වසංගතය හමුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු සමහර ආසාදිතයන් වාර්තා වූ තැන්වලට දින 4-5 කින් ඇවිත් නැහැ. 5000/- බඩු මල්ල ලැබී නැතැයි චෝදනා තිබෙනවා.

මාලි අල්ගම මහත්මිය (එ.ජා.ප): බියගම කොවිඩ් රෝගීන්ගේ වැඩිවීම නිසා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සේවය හරියාකාරව ඉටු කිරීමට නොහැකි වී තිබෙනවා . මේ සඳහා රජය විසඳුමක් දිය යුතුය.

කැළුම් තුෂාර විජයලත් මහතා (පො.ජ.පෙ.)

බියගම බල ප්‍රදේශයට මායිම්ව ගලා බසින කැලණි ගඟ ලංකාවේ දූෂිතම ගඟ ලෙස හඳුනාගෙන තිබෙනවා. බියගම මල්වානේ සිට ගෝනවල දක්වා ස්ථාන 64කින් ගඟට එකතුවන අපද්‍රව්‍ය නිසා ගඟ අතිශය දූෂණයට ලක්වෙලා. බියගම ආයෝජන මණ්ඩලයේ කර්මාන්ත ශාලා මේ අතර ප්‍රධාන වෙනවා. අපි බලන්න ගියාම කර්මාන්ත ශාලාවල අපජලය පිරිසිදු කරලා මාළු පීනන ජල පොකුණු හරහා පිරිසිදු ජලය ලෙස ගඟට මුදා හරින බව අපට පෙන්නුවත් රහසිගතව අපජලය ගඟට මුදා හරිනවා. මේ ගැන දැඩිව සොයා බලන්න.

ප්‍රභාත් ලියනගේ මහතා (පො.ජ.පෙ.):

ස්පිටිල් වත්තේ පොදු පහසුකම් ඉඩමේ දිවා රාත්‍රී අත්පන්දු ක්‍රීඩාපිටියක් ඉදි කිරීමට සභාවෙන් කටයුතු කළත් එම ප්‍රදේශවාසීන් ඊට විරුද්ධයි. පොදු පහසුකම් ඉඩම්වල ඉදිකිරීම් සඳහා බලය සභාවට තිබිය යුතුය.

නලින් දිසානායක මහතා (ශ්‍රී.ල.නි.ප.)

වෙන්දේසි ඉඩමේ අය හිතන්නෙ පොදු පහසුකම් කොටසේ අයිතිය ඔවුන්ට පමණක් බවයි. ගමේ අයටත් එහි ක්‍රීඩා කරන්න දුවන්න පනින්න පුළුවන්.

තිමල්කා පොත්තෙවෙල මහත්මිය (පො.ජ.පෙ.)

පමුණුවිල සරත්චන්ද්‍ර ඩයස් මාවත පළල් කර සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කර දෙන්න. මාර්ගය දැනට විශාල වශයෙන් කැඩී බිඳී තිබීම හේතුවෙන් ප්‍රදේශවාසීන් දැඩි අපහසුතාවට පත්වෙලා.



නැන්දගෙන් බෑනාට

ගේ දෙර ඉඩකඩම් මට හැම තැනම ඇත
දෑවැදි මිල මුදල් මට උවමනා නැත
ඔබෙ රූමත් දියණි මගෙ හිත දිනා ඇත
ඒදුව දුන්නොතින් මට හොඳටෝම ඇත

ගුණ හැණ බලය හා රූමත් බැව්නි
මගෙ වාසනාවට හමුවුණු බෑණා හෙයිනි
දෑවැදි කිසිත් නොම ඉල්ලන බැව්නි
මගෙ දුව දෙන්න ඔබහට තීරණ කෙරිනි

උපන් දා පටන් ඇය හුරතලයට හැදුනා
දුව ඉල්ලන හැම දෙයම ළඟටම ලැබුණා
මව්පිය දෙදෙනාගෙ ඔවදන් පිළි නොගෙනා
ඇය සිතූ මනාපෙට ජීවිත ගත කෙරුණා

ගේ දෙර සියලු වැඩ ටික මා නිති කෙරුණේ
රැකියාවකුත් කරමින් මා එය ඉටු කෙරුණේ
ඇගෙ පියතුමන් ගෙත් මේ වට සිත රිදුණේ
එකයි පුතේ ඔහු පිටරටකට ඇදුණේ

දීගෙක යන දිනේ මම දුන් අවවාද
යහපත් දිවි මගක් හැමවිට පැතුවාද
බෑනෝ නුඹට ඒ ටිකවත් ඇහුනාද
මේ හැම දෙයම ඔබ ඉවසන හින්දද

ගෙයි වැඩ නොකරන්නෙ අත් රළු වන හින්දයි
ගුලි වී හිඳියන්නෙ දැඩි සීතල හින්දයි
ඔබ ගැන නොසොයන්නෙ ඇගෙ මැලිකම හින්දයි
මේ ඔක්කොම වෙන්නෙ අපෙ කරුමය හින්දයි

සතුටයි සාමයයි මගෙ හිත තුළ රන්දු
ඇය දීගෙක ගියා සිත් මගෙ මන බන්දු
කොපමණ කළත් මේ ලෙස හිඳිව්ද මන්දු
මට සැකයක් ඇති වුණිය හද ඉකි බින්දු

ඔබ මා වෙත ගෙනෙන මේ චෝදනාවට
මගෙ හිත පත්වුණා හරි වේදනාවට
මගෙ දුව නිසා ඇතිවුණ මේ හිගාවට
මං පලිවේද ඔබ කරගත් කසාදෙට

සෝමා රාජපක්ෂ
වල්ගම, මල්වාන

ඔබේ නිර්මාණ සියනෑ කවි මඩුව "ලංකාදීප" කර්තෘ මණ්ඩලය, අංක 8, හුණුපිටිය හරස් පාර, කොළඹ 02. ලිපිනයට යොමු කරන්න.

නාඳුනන පිරිමි සිරුරක් කපුගොඩින් හමුවෙයි

(මල්වාන ඩබ්ලිව්.ඩී.එම්. විතානගේ)

රත්නපුර ප්‍රදේශයේ සිට දින කිහිපයක් කැලණි ගඟ දිගේ ගසා ගෙන ආ බවට සැක කරන නාඳුනන පිරිමි සිරුරක් කපුගොඩ ප්‍රදේශයේ තිබී හමු වී ඇතැයි දෙම්පේ පොලිසිය පවසයි.

වයස අවුරුදු 35ත් 40ත් අතර වයසැති උස අඩි පහක් පමණ වන මොහු අළුපාට කොට කලිසමක් හා සුදුපාට අත් කොට කමිසයක් ඇඳ සුදුපාට නිකල් ගාන්චුවක් සහිත බඳ පටියකින් සැරසී සිටි බවද පොලිසිය සඳහන් කරයි.

සිරුර හඳුනා ගැනීම සඳහා ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තබා තිබෙන අතර දෙම්පේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ආර්.පී.ඒ. ප්‍රියන්ත හා විවිධ පැමිණිලි විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක කේ.එම්.පී. රෝහිත යන නිලධාරීහු මේ පිළිබඳව පරීක්ෂණ මෙහෙයවති.

කාදිනල් කුරේ මාවතට කාපට් අතුරන්න යයි

(රාගම විමුක්ති එස්. රුදිගු)

රාගම නගරය මැදින් බටුවත්ත මාර්ගයට පිවිසීමට ඇති කාදිනල් කුරේ මාවතට කාපට් අතුරා එය පිළිසකර කිරීමට මාර්ග බලධාරීන් කටයුතු කර ඇත.

එම මාර්ගය දැඩි ලෙස අබලන්ව ඇති බවට මාධ්‍ය මගින් පළවූ පුවත පළ දරමින් එම මාර්ගය පිළිසකර කිරීමට බලධාරීන් කටයුතු කර ඇතැයි එම මාර්ගයේ ගමන් කරන රියැදුරෝ පවසති.

රාගම නගරයේ ඇති තදබදය මගහැර බටුවත්ත මාර්ගයට පිවිසීමට ඇති කෙටිම හා එකම මග මෙය බවත්, පිළිසකර කිරීම නිසා බාධාවකින් තොරව එම මාර්ගයේ ගමන් කළ හැකි බව ද අප සමග අදහස් දක්වමින් රියැදුරෙක් පැවැසීය.

කටුනායක අධිසංවේදී පීසීආර් පරීක්ෂණාගාරයේදී

(කටුනායක ටී.කේ.ජී. කපිල)

එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙත ගමන් ගන්නා ගුවන් මගින් හට පහසුකම් සැලසීම සඳහා අධිවේගී පී.සී.ආර්. පරීක්ෂණාගාරයක් පසුගියද (14) දහවල් කටුනායක ගුවන් තොටුපොළ තුළ විවෘත කිරීම සිවිල් ගුවන් සේවා සහ ආයෝජන කලාප පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ඩී.වී. චානක මහතා අතින් සිදු විය.

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පිහිටි ප්‍රාන්ත රාජ්‍ය 7 ක ගුවන් තොටුපළ වෙත පිවිසීමට පැය 04 ක කාල සීමාව තුළ ලබා ගත් අධිසංවේදී පී.සී.ආර්. පරීක්ෂණයකට සහභාගි වී එයින්ද සෘණාත්මක ප්‍රතිඵල ඇති ගුවන් මගීන්ට පමණක් එක්සත් අරාබි එමීර් රාජ්‍යයට ඇතුළු වීමට අවසරය ලබා දී තිබේ.

මෙවැනි වෛද්‍ය පරීක්ෂණාගාරයක් මෙතෙක් ශ්‍රී ලංකාවේ නොතිබුණි. ඩුබායි, අබුඩාබි, සාජා, උම්අල්, කයිවේන්, ෆුජාරියා, අජ්මාන්, රාස් අල් කයිමාන් යන ගුවන්තොටුපළ වෙත පිවිසීමට මෙම අවශ්‍යතාව අලුතෙන් ඇතිවී තිබේ.

මෙම වෛද්‍ය පරීක්ෂණාගාරය පිහිටුවීමට පියවර ගෙන ඇති අතර, මෙම අධි සංවේදී පී.සී.ආර්. පරීක්ෂණාගාරය ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති එකම සහ පළමු පරීක්ෂණාගාරය වීම විශේෂත්වයකි.

මෙම පරීක්ෂණාගාරය තුළ සිදු කෙරෙන එක් පරීක්ෂණයක් සඳහා රුපියල් 7,500ක මුදලක් අය කරන අතර ඒසඳහා පැයක පමණ කාලයක්ද ගත වේ. මෙහි සවි කර ඇති එක් යන්ත්‍රයකට පැයකට සිවු දෙනකුගේ නියැදියන් එකවර පරීක්ෂණය කිරීමට හැකිවන අතර එවැනි යන්ත්‍ර 6ක් මෙම පරීක්ෂණාගාරය තුළ ස්ථාපිත කර තිබේ.

එනිසා එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙත පිටත්ව යෑමට පැමිණෙන ගුවන් මගීන් තම ගුවන් යානය පිටත්වීමට පැය 4 කට පෙර ගුවන් තොටුපළ වෙත පැමිණිය යුතුය.

එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙත පිටත්ව යෑමට පැමිණෙන ගුවන් මගීන් තම විදේශ ගමන් බලපත්‍රය, ජාතික හැඳුනුම්පත සහ ගුවන් ප්‍රවේශ පත්‍රය අනිවාර්යයෙන්ම රැගෙන මෙම පරීක්ෂණාගාරය වෙත පිවිසීම සිදු කළ යුතුය.

මෙම අවස්ථාවට සිවිල්ගුවන් සේවා ආයෝජන ප්‍රවර්ධන කලාප සංවර්ධන කිරීම පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ඩී.වී. චානක සීමාසහිත ගුවන් තොටුපොල සහ ගුවන් සේවා සමාගමේ අධ්‍යක්ෂ ෂෙහාන් සුමනසේකර සහ එම සමාගමේ සභාපති විශ්‍රාමික මේජර් ජෙනරාල් ජී.ඒ. චන්ද්‍රසිරි, එමිරේට්ස් ෆ්ලයි ඩුබායි ඉටිහාඩ් සහ ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ නියෝජිතයන් පිරිසක්ද ගුවන්තොටුපොළ කළමනාකරණ අංශයේ උසස් නිලධාරීහු පිරිසක්ද මෙම අවස්ථාවට සහභාගි වී සිටියහ.

මෙම පරීක්ෂණාගාරය තුළින් කොරෝනා ආසාදිත බව තහවුරු වූ ගුවන් මගීන් ගුවන්තොටුපොළ වෙනම ප්‍රදේශයකට යොමුකර නිරෝධායන ක්‍රියාවලිය සඳහා යොමු කෙරේ.

ගම්පහට කාබනික පොහොර ව්‍යාපෘති රැසක්

(යක්කල ලාල්සිරි ආරියදාස)

ගම්පහ දිස්ත්‍රික්කය තුළ කාබනික කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘති රැසක්, ප්‍රාදේශීය ගොවිජන මධ්‍යස්ථාන හා කෘෂිකර්ම සංවර්ධන උපදේශක මධ්‍යස්ථාන ආශ්‍රිතව ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මේ වන විට දිස්ත්‍රික්කය තුළ කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘති සිය ගණනක් ගම් මට්ටමින්ද, කොම්පෝස්ට්, කාබනික පොහොර නිෂ්පාදන පුහුණු උපදේශක මධ්‍යස්ථාන කිහිපයක් ද ආරම්භ කර ඇත.

පසුගිය සතිය තුළ ගම්පහ මුදුන්ගොඩ, උඩුපිල, දෙල්ගොඩ දෙම්පෙ, මණ්ඩාවල, මාහේන, හිරිපිටිය, බුත්පිටිය, මාබොදල, දිවුලපිටිය, අත්තනගල්ල, අලවල, වැකේ යන ප්‍රදේශයන්හි කාබනික පොහොර නිෂ්පාදන පුහුණු මධ්‍යස්ථාන පවත්වා ඇත. මේ අතර ගම් මට්ටමින් බුලත් ගොවීන්ද ගිනිසීරියා, වැටමාර, ගොම,කොළ රොඩු, පිදුරු, කැප්පෙට්ටියා යොදා ගනිමින් කුඩා කාබනික පොහොර නිපදවීමට ද උනන්දුවී ඇත.

දුම්රිය සිග්නල්වල වයර් කැපුවැයි 24 තෙක් රිමාන්ඩ්

(ගම්පහ අධිකරණ ටෝනි කරුණානායක)

ගම්පහ ගණේමුල්ල අතර දුම්රිය මාර්ගයේ ඇති විදුලි සංඥ කණුවලට සවිකර ඇති වයර් කපා සොරකම් කළ සැකකරුවකු ලබන 24 වැනිද දක්වා රිමාන්ඩ් බාරයේ තබන ලෙසට ගම්පහ මහේස්ත්‍රාත් මංජුල කරුණාරත්න මහතා ඉකුත් 13 වැනිද නියම කළේය.

බොල්ලත, පොල්ගහවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවකු වන දිනේෂ් චතුරංග නමැති සැකකරු මෙසේ රිමාන්ඩ් බාරයට පත් කෙරුණි.

සැකකරු ගණේමුල්ලේ සිට ගම්පහ දෙසට ගමන් කරන දුම්රිය මාර්ගයේ පිහිටි විදුලි සංඥ කණුවල වයර් කපමින් සිටින අවස්ථාවේ දුම්රිය මාර්ගය අසල පදිංචිකරුවකු සිද්ධිය දැක කපා දමා තිබූ වයර් සමග සැකකරුව ඔහු බාරයට ගෙන ගණේමුල්ල දුම්රිය පොළ නිලධාරීන්ට බාරදී තිබූ බව පැමිණිල්ල මෙහෙයවමින් ගණේමුල්ල පොලිසියේ සැරයන් බාලසූරිය (6247) මහතා අධිකරණය හමුවේ පැවැසීය.

වයර් කැපීම හේතුවෙන් විදුලි සංඥ හරියාකාරව ක්‍රියාත්මක නොවන බවත්, සැකකරු සිදුකර ඇති ක්‍රියාව ඉතා බරපතළ බවත්, පොලිසිය අධිකරණය හමුවේ කීය.

දුම්රිය මාර්ග නඩත්තු අංශයෙන් අලාභය ලබාගත යුතු බවත් පරීක්ෂණ අවසන් නොමැති බවත් පොලිසිය අධිකරණය හමුවේ වැඩිදුරටත් පැවැසීය.

යතුරුපැදි අනතුරකින් රෝහලේ සිටි පොලිස් නිලධාරියා මරුට

(මිරිගම විශේෂ පුෂ්පකුමාර මල්ලවආරච්චි)

මියගිය ජගත් ඒකනායක

මිරිගම දිවුලපිටිය මාර්ගයේ ගුරුල්ලගම දී රිය අනතුරකට ලක්ව පොලිස් රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයකු ඉකුත් 10 වැනිද සවස මියගොස් ඇතැයි මිරිගම පොලිසිය කියයි.

මෙසේ මියගොස් ඇත්තේ කටාන පොලිස් අභ්‍යාස විද්‍යාලයේ සේවය කළ මිරිගම හල්පේ පදිංචිව සිටි ජගත් ඒකනායක මහතාය.

ඉකුත් මාර්තු මස 14 වැනිද ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා පෞද්ගලික අවශ්‍යතාවයකට මිරිගම නගරයට යතුරුපැදියෙන් ගොස් ආපසු නිවස කරා එමින් සිටියදී යතුරුපැදිය අනතුරට ලක්ව බරපතළ තුවාල ලබා රෝහල් ගත කරනු ලැබ සිටියේය.

ඔහු අනතුරට පත්ව තිබුණේ ඔහුගේ නිවෙස පේන මානයේදීමය. ඔහුගේ යතුරුපැදිය අනතුරට ලක්ව තවත් යතුරුපැදියක ගැටුණු බවටද පොලිසියට තොරතුරු ලැබී තිබිණි. මිරිගම මූලික රෝහලින් ජාතික රෝහලට මාරුකර යැවූ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා එහි දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිට පොලිස් රෝහලට මාරු කර යවා එහි වැඩිදුර ප්‍රතිකාර ලබමින් සිටියදී මෙසේ මියගොස් ඇත.

මිරිගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්. ඩී.ආර්. ප්‍රියන්ත මහතාගේ මෙහෙයවීම යටතේ පරීක්ෂණ පැවැත්වේ.

රණිස්වල පවුලකට නව නිවෙසකට මුල්ගල

(වාරණ ආනන්ද ඉ. ජයකොඩි)

වසර ගණනාවක් තිස්සේ කුලී නිවෙසක දිවි ගෙවමින් සිටින පවුලක් වෙනුවෙන් ගම්වාසී සුළු ව්‍යාපාරිකයන් පිරිසක් මැදිහත් වී නව නිවෙසක් තනා දීම සඳහා මුල්ගල් තැබීමේ චාම් උත්සවයක් ඉකුත්ද (12) පෙරවරුවේ රණිස්වල විහාරස්ථානයේ විහාරාධිපති මගලෙගොඩ ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති ශාන්ත අමරනන්ද හිමියන්ගේ ප්‍රධානත්වයෙන් එම ගම්මානයේදී පවත්වනු ලැබීය.

වයස අවුරුදු දෙළහක හා අවුරුදු හතරක දැරියන් දෙදෙනකු සමග වසර ගණනාවක් තිස්සේ වේයන්ගොඩ රණිස්වල ගම්මානයේ අන් අයෙකුට අයත් නිවසක දිවි ගෙවමින් සිටින ලක්මල් දේශප්‍රිය (39) හා නාලිකා සඳරුවන් (38) යන අඹු සැමි යුවළක් වෙනුවෙන් නව නිවෙසක් තනා දීම සඳහා එසේ මුල් ගල් තැබීම සිදු කළ අයුරු එහි ගිය අපට දැක ගන්නට ලැබුණි.

එදිනෙද කුලී වැඩ කරමින් උපයා ගන්නා සොච්චම් මුදලකින් දැරියන් දෙදෙනා නඩත්තු කරමින් වසර දහසයකට වැඩි කාලයක් තවත් පවුල් දෙකක පිරිස් පදිංචි වී සිටින කුඩා නිවෙසක ලක්මල් දේශප්‍රිය හා නාලිකා සඳරුවන් යුවළද දැරියන් දෙදෙනා සමග දැඩි ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ වාසය කරන බවද දැන ගන්නට ලැබුණි.

මොවුහු අන්ත දරිද්‍රතාවයකින් යුතුව දිවි ගෙවමින් සිටියත් සමාජීය සහනාධාරයවත් නොලැබෙන බවද කියති. මොවුන්ට කියා අතු පැලක් හෝ තනා දෙන මෙන් වගකිව යුතු පිරිස් වලින් කාලයක් තිස්සේ ඉල්ලා සිටියත් ඔවුන්ගෙන් පිහිටක් නොලැබුණු බවද දැන ගන්නට ලැබුණි.

මේ හේතුවෙන් එම ගම්මානයේ උපත ලබා මේ වනවිට අත්තනගල්ල ප්‍රදේශයේ පදිංචිව සිටින සුළු ව්‍යාපාරිකයෙකු වන අසංග නැලිගම, එම ගම්මානයේම දැනටත් පදිංචි වී සිටින දේශබන්දු සමන් නිශ්ශංක හා අනුර අලංකාරගේ යන මහත්වරු ප්‍රමුඛ තවත් සුළු ව්‍යාපාරිකයින් පිරිසක් මැදිහත් වී නව නිවෙසක් තැනීම සඳහා අවශ්‍ය සියලුම ගොඩනැගිලි ද්‍රව්‍ය ද ගෙනැවිත් දැමීමෙන් පසුව එහි ග්‍රාම නිලධාරිනී ඉමේෂා හතුරුසිංහ හා එහි සංවර්ධන නිලධාරිනී ආසා දර්ශනී යන මහත්මීන්ගේ සංවිධානයෙන් මුල් ගල් තැබීම සිදු කරනු ලැබීය.

පැය එකහමාරක් ඇතුළත ලණු ඇද අත්තිවාරම් කපා මුල් ගල් තැබීම හා කිසිදු දේශපාලන නියෝජනයක් නොමැති වීමද විශේෂ සිද්ධියක් වේ.

මේ ලංකාදීප තාරුණ්‍යයේ පිටුවයි

නවරැල්ලට ඔබේ නිර්මාණ විද්‍යුත් ලිපිනය හරහාද එවිය හැකිය.
විද්‍යුත් ලිපිනය -
nawarallawnl@gmail.com



විදෙස් නාට්‍ය ආක්‍රමණය කළ අපේ සොඳුරු ටෙලි කතා



ශ්‍රී ලංකාවේ ටෙලිනාට්‍ය කලාවේ උපත දිමුතු මුතු නම් සොඳුරු වූ ටෙලි කතාවකින් සිදුවූ බව අපගේ මතකයේ අදටත් මිහිදන්ව ඇත. අපේ රටට, අපේ සංස්කෘතියට උචිත අපේ පවුල් ඒවලට වඩාත් ගැළපෙන තේමාවන්ගෙන් සජිරි ටෙලි කතා ඒ පසු පස්සේ බිහි විය. අදටත් ඒවායේ සොඳුරු මතක සැමගේ සිත් මත ඉතිරිව ඇතිවා සේම උසස් රසවින්දනයක් ලබා ගැනීමේ හැකියාව ද ප්‍රේක්ෂකයාට නිතැනින්ම හිමි විය.

එහෙත් වර්තමානයේ රූපවාහිනී නාලිකා බිහිවීමේ ප්‍රවණතාවයත්, ඊට සමගාමීව පෙන්වනු ලබන ටෙලිකතා ප්‍රමාණයත් දිනෙන් දිනම වැඩි විය. ඒ අතරතුර ආක්‍රමණශීලී වෙසින් පැමිණි විදෙස් ටෙලි නාට්‍ය අපගේ සෑම සියලු නාලිකාවක්ම ඉතා ඉක්මණින් තම ග්‍රහණයට හසු කරනු ලැබීය. අද විදෙස් ටෙලි නාට්‍යයක් විකාශනය නොවන නාලිකාවක් සොයා ගැනීමට පවා අපහසුය.

ලෝකය එකම පියස්සක් යටට ගෙනා ගෝලීයකරණය ටෙලිනාට්‍යය කලාවට ද එකසේ බලපෑවේය. විදෙස් ටෙලි නාට්‍ය බැලීමට පහසුකම් නොමැති ඒ සඳහා ප්‍රියතාවයක් දැක් වූ ප්‍රේක්ෂකයාට එය මහඟු අවස්ථාවක් විය. භාෂාවේ දැනුම අඩු ප්‍රේක්ෂකයාට පවා අපගේ මවු භාෂාවෙන් හඬ කවන එම ටෙලි නාට්‍ය බැලීමට අවස්ථාව එයින් උදා විණි.

එහෙත් අද පවතින්නේ ඉතාමත් ශෝචනීය තත්ත්වයකි. විදෙස් ටෙලිනාට්‍ය විකාශනය සඳහා තෝරා ගැනීමේ දී අප විසින් භාවිත කරන්නේ කුමන මිනුම් දඬු ද යන්න ගැටලුවකි. සමහර ටෙලිනාට්‍ය තැරඹීමේ දී එහි කොටස් ගණන අප ජීවත්ව සිටිය දී නරඹා අවසන් කළ හැකි ද යන්න පවා ගැටලුවකි. එසේම සමහර පවුල් ඒ සම්බන්ධයෙන් විකාශනය වන ටෙලි නාට්‍ය තැරඹීමේ දී මෙම සිදුවීම් මිහිපිට සිදුවිය හැකිද? යනාදී පවා සිතාගත නොහැකිය. එකම පවුලේ අඹුදරුවන් මවුපියන් සහෝදර සහෝදරියන් නෑයන් අතර සිදුවන කුමන්ත්‍රණ වෛරකාරී සිතුවිලි අනෙකා පරයා නැගී සිටීමට දරන වෑයම ඉතා පිළිකුල් සහගතය. පෙම්වතුන් පෙම්වතියන් අතර සිදුවන්නේ කුමන්ත්‍රණය. ආදරයෙන් එක්වීමක් දැකගත නොහැකිය. සමහර ටෙලි නාට්‍ය අපේ රටට අපේ සංස්කෘතියට ගැළපෙන්නේ දැයි නැවත වරක් සිතා බැලිය යුතු තත්ත්වයක් උද්ගතව ඇත.

පොදුවේ ගත්කළ මේ ටෙලිනාට්‍ය අපේ මනස විකෘති කර දමනු ලබයි. ටෙලි නාට්‍යයක් නැරඹීමෙන් අප බලාපොරොත්තු වන්නෙ යම්කිසි මානසික වින්දනයකි. එහෙත් මේ නාට්‍ය තුළින් ප්‍රේක්ෂකයාට එවන් සත්‍යාපේක්ෂිතයක් ලැබෙනවාදැයි සොයා බැලිය යුතු කරුණකි. තවද උසස් රස වින්දනයක් ලබා ගැනීමට හැකි ටෙලිනාට්‍ය තොරා ගැනීමට හැකියාව තිබියදීත් අප යන්නේ මංමුළා වූවන්සේය. ඒ තුළ උසස් නිර්මාණයක් රසවින්දනය කිරීමට ප්‍රේක්ෂකයාට තිබෙන අයිතිය මගහැරී ඇත.

ශ්‍රී ලාංකික බොහෝ ප්‍රේක්ෂකයන් මෙම ටෙලිනාට්‍ය නරඹන බව නොරහසක් නොවේ. අපේ රට තුළ පවුල් අතර සිදුවන අපරාධ වගේම සමාජීය වශයෙන් සිදුවන විවිධ අපරාධවලට මෙම කතා පාදක නොවනවා සේ සිතිය නොහැකිය. ඒ වගේම තරුණ පරපුර නරක ඇබ්බැහිවීම්වලට යොමුවීමට පවුල් ඉතිරීම්වලට, ළමා හිංසනයන්ට වැනි සමාජ පරිසරයක් තුළ නොසිඳු විය යුතු බොහෝ කරුණුවලට මෙම ටෙලිනාට්‍ය කතා මුල් නොවනවා සේ සිතීමට අපට කරුණු කාරණා නොවේ.

අපට පෞඪවත් ඉතිහාසයක් උරුමව තිබේ. හොඳ සංස්කෘතියකට උරුමකම් කියන අපිට පවුලේ බාල මහලු වැඩිහිටි සියලු දෙනා විසින් එකට නැරඹිය හැකි අපේ රටේ සොඳුරු ටෙලිනාට්‍ය කලාවක් ද දායාදව තිබේ. එහෙත් අද, ඒ සොඳුරු ටෙලිනාට්‍යවලට සිදු වූයේ කුමක්ද? යන්න සිතෙන විටත් හද කම්පා කරයි. ඔබට මට අමතක කරන්න බැරි අපේ රටේ සොඳුරු ටෙලිනාට්‍ය වූ යශෝරාවය, ගම්පෙරළිය, දූ දරුවෝ අසල්වැසියෝ දඬුබස්නාමානය වැනි ටෙලිනාට්‍ය අදටත් අපේ සිත් තුළ මහා දාවැන්තයන් ලෙස අරක් ගෙන සිටී. එහෙත් අද, එවන් උසස් නිර්මාණ රසවිඳීමට ප්‍රේක්ෂකයාට තිබෙන අයිතිය කුමක්දෝ බලවේගයකින් අහිමිවී ඇත.

අද එවන් සොඳුරු උසස් රසවින්දනයක් සහිත කතා විකාශය වීමේ අඩුවක් දක්නට ලැබේ. සමහර ටෙලිනාට්‍ය විදෙස් ආභාෂය ලබා ඇත. අපේ සංස්කෘතියට ගැළපෙන නිර්මාණ බිහිවීමේ අඩුවක් දක්නට ඇත. උසස් රසවින්දනයක් ලැබීමට නම් උසස් ගුණාත්මක බවින් යුත් නිර්මාණ බිහිවිය යුතුය. අද වළපල්ලට යමින් පවතින්නේ අපේ මේ උසස් නිර්මාණයන්ය. එබැවින් එය රැක ගැනීමටත් මනු පරපුර වෙනුවෙන් ආරක්ෂා කරදීමේ වගකීම අප සතුය.

ධවල පත්‍රිකාව...

ශ්‍රීමානි ප්‍රියංගිකා,
විහාරගොඩ, බදුල්ල

මල් කැකුළු පිපෙන්නට ඉඩ දෙන්න

යම් රටක දරුවන් හද වඩා ගන්නා ආකාරයත් අධ්‍යාපනය පෝෂණය, සෞඛ්‍යය සහ රැකවරණය ලබා දෙන ආකාරයත් එරට අනාගත පැවැත්ම තීරණය වේ. වර්තමානයේ කුඩා දරුවා අනාගතයේ රට පිළිබඳව වගකීම් දරන්නෙකි. 'ළමයා වනාහි ඉදිරි කාලයේ බිහි වන මිනිසාය' යනුවෙන් ඇරිස්ටෝටල් පඬිතුමා ළමයාව අර්ථවත් කළේ එබැවිනි. රටේ කොඳුනාරටිය තරුණ පරපුර නම් රටේ ජීවනාලිය ළමා පරපුරයි. රටේ ජීවය බඳු දරුපරපුර විවිධ උවදුරුවලින් ආරක්ෂා කිරීම වර්තමානයේ මවුපියන් සතු අභියෝගයකි.

සමාජය යනු විචාරවූත් අවිචාරවූත් සංකලනයකි. සමාජයේ වෙසෙන මිනිසුන් සුදු කළු යනුවෙන් ඉරි ගසා වෙන්කළ නොහැකිය. සෑම සමාජයකම දක්නට ලැබෙන්නෙ අළු පැහැති චරිත ගත් මිනිස්සුය. යහපත අබිබවා අයහපත ග්‍රහණය කරන සමාජයක ළමයා යනු නොමේරූ තැනැත්තෙකි. ළමයා කිසි විටෙක කුඩා මිනිසෙකු නොවන අතර ඔහු හෝ අැය කායිකව හා මානසිකව යැපෙන්නෙකි. එනම් සම්පූර්ණයෙන් අනුන් මත ජීවත් වන රැකවරණය හා සෞඛ්‍යය අවශ්‍යය විවිධ ජීඩාවනට ගොදුරු වීය හැකි තැනැත්තෙකි. එවැනි ළමයි මල් කැකුළු වැනිය. අවුරුදු 18 ට අඩු සෑම අයෙක්ම 'ළමයා' නම් වන බව ළමා ප්‍රඥප්තියේ සඳහන් වේ. යැයෙන මානසික තත්ත්වයේ සිට ස්වාධීන මානසිකත්වයට යාමට ගතවන කාලය 'ළමාවිය' නම් වේ. මිනිසාගේ ළමාවිය සෙවණැල්ලක් මෙන් ජීවිතය පුරා ක්‍රියාත්මක වෙයි. එහි ඇතැම් සිදුවීම් මිනිස් මනසට තදින් බලපෑම් කරයි. එහි ප්‍රතිඵලය වශයෙන් ඔහුගේ ජීවිතය යහපත් හෝ අයහපත් වීමට පසුකාලීනව බලපෑම් කරයි. 'අපයෝජනය' යනු වරදෙහි යෙදවීමයි. එනම් දරුවන් වෙනුවෙන සිදු කළ යුතු දේ නොකිරීමත, නොකළයුතු දේ සිදු කිරීමත් අපයෝජනය නම් වේ. කායිකව, මානසිකව, ලිංගිකව යනාදී තුන් ආකාරයෙන්ම අපයෝජනයට ළමයා දෛනිකව ගොදුරු වන බැවින් විනාශ වන්නේ මෙරට අනාගත පරපුරයි. මෙයට හොඳම උදාහරණය වන්නේ මෑතකදී අන්තර්ජාලය ඔස්සේ අලෙවි කළ බලා වයස්කාර දැරියට ලිංගික අපයෝජනය සිදු කිරීමේ ආන්දෝලාත්මක සිදුවීමයි.

ළමා අධිකාරියට ලැබෙන පැමිණිලි අනුව බහුල වශයෙන්ම අපයෝජනයට ගොදුරු වන්නේ යොවුන් වියේ පසුවන දරු දාරියන්ය. යොවුන් විය යනු වයස අවුරුදු 11- 18 අතර කාල සීමාව වේ. එය දරුවා වැඩිහිටියෙකු බවට පත්වන සංක්‍රාන්තික කාල සීමාවක් ලෙස සැළකේ. මෙහිදී ශාරීරික වෙනස්කම් සමඟ ඇතිවන මානසික තත්ත්වයන් හමුවේ බොහෝ දරුවෝ හුදකාර අරගලයක යෙදෙති. ඔවුහු කුතූහලය හා විරුද්ධ ලිංගික ආකර්ශනය මත අලුත් දෑ සොයා යාමත්, විවිධාකාර අත්දැකීම් සමාජය තුළින් ලබා ගැනීමටත් වෙහෙසෙති. තමා වැඩිහිටියෙකු ලෙස සිතීමට පෙළඹීම නිසා විවිධාකාර රැවටීම්වලට ගොදුරු වෙති. බොහෝ ළමා අපචාර සිදු වී ඇත්තේ සමීප පුද්ගලයෙන්ගෙන් වීම විශේෂත්වයකි. එනම් දරුවාගේ විශ්වාසය දිනාගත් තාත්තා, සීයා, බාපා, සුළුපියා, මාමා, මස්සිනා, සහෝදරයා යනාදී ඥාතීත්වයක් ඇති අයගෙන් මෙන්ම ඇසුරු කරන පුද්ගලයන් වන අසල්වැසියා, යහළුවා, ගුරුවරයා, විදුහල්පතිවරයා හා පූජ්‍ය පක්ෂය අතින්ද අපයෝජනයටත්, දූෂණයටත් ලක්වේ. එසේම යොවුන් දැරියන් ප්‍රේම සබඳතා පැවැත්වීම හේතුවෙන් තම සෙම්වතා අතින් දූෂණයට ලක් වේ. බොහෝ විට ළමයින් අපයෝජනයට ලක් කර ඇත්තේ රැවටීමෙන් හෝ බිය ගැන්වීමෙනි. වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකුගේ කැමැත්ත ඇතිව හෝ නැතිව කායිකව එක් වීම 'ස්ත්‍රී දූෂණයක්' ලෙස අර්ථ දක්වයි. ස්ත්‍රී දූෂණයක් නොවෙන වෙනත් ආකාරයේ ලිංගික අතවර ලිංගික අපයෝජන නම් වේ.

කුමුදු සංජීවනී පෙරේරා
සිංහල ඩිප්ලෝමාධාර, කොළඹ විශ්වවිද්‍යාලය

යම් අවාසනාවකට තම දරුවා අපයෝජනයට ගොදුරු වී ඇති බව මවුපියන්ට අවබෝධ කර ගත හැක්කේ දරුවාගේ අලුතු හැසිරීම් මතය. එනම් දරුවා එකවර නිහඬවීම, කලපනා බරිත වීම, නිවසේ සමාජිකයන් ඇසුරු කිරීමට අකමැති වීම, යමක් ප්‍රකාශ කිරීමට උත්සාහ කිරීම, හුදකලාවීම යනාදී චරයා ඉඟි තුළින් අවබෝධ කොටගත හැකිය. මෙහිදී ඔබ ඉතාමත් බුද්ධිමත් අයුරින් ප්‍රතිචාර දැක්විය යුතුය. කිසිවිටෙක නීතිය ඔබ අතට ගැනීම සිදු නොකළ යුතුය. ළඟම පොලිස් ස්ථානයට හෝ ළමා ආරක්ෂක අධිකාරියට එම අපයෝජනය වාර්තා කරන්න. එසේම මනෝ වෛද්‍ය උපදේශනද ලබා ගනන.

ළමාවියේ පටන් තම දරුවා බෙහෙවින් ආරක්ෂා කිරීම මවුපියන් සතු යුතුකමක් හා වගකීමක් වන්නේය. බොහෝ වැරදි සිදුවන්නෙ නොදැනුවත්කම හා නොසැලකිලිමත්කම හේතුවෙනි. තම 'අැස දෙකාමෙන්' දරුවා තමා සමීපයේ රඳවා ගනිමින් කල්පනාකාරීව රැක බලා ගත යුතුය. යොවුන් වියේ වෙසෙන දරුවා නුවණින් කල්පනා නොකර හැඟීම්වලට වහල් වී ක්‍රියා කරන බැවින් එම දරුවන් කෙරෙහි පූර්ණ විශ්වාසයක් තොතබා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. එසේම තම දරුවාට අධ්‍යාපනය පමණක් නොව සමාජ අවබෝධයක්ද මවුපියන් විසින් දරුවාට කියා දිය යුතුය. අනවශ්‍ය සංවේදී පුද්ගලයෙකු ලෙස දරුවා හැඩ නොගැස්වීම, දරුවා මුහුණ පෑමට සිදුවන හිංසනවලට එරෙහිව සටන් කිරීමට හුරුකිරීම, දරුවා ඇසුරු කරන පුද්ගලයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම, දරුවා සමඟ එදිනෙදා තොරතුරු හුවමාරු කර ගැනීම, නවීන තාක්ෂණය පිළිබඳ නිසි අවබෝධයකින් පසුවීම, කිසිවිටෙක අහසයන් ඉදිරියේ දරුවා තනි නොකිරීම යනාදී ආරක්ෂිත පියවර ගැනීමෙන් තම දරුවාට අපයෝජනයෙන් තොර සොඳුරු ළමා වියක් උරුම කර දීමට හැකි වනු ඇත. තම දරුවන්ට වඩාත් සුන්දර ළමාවියක් නිර්මාණය කරමින් ඔබ ලබන සතුට මෙලොව උත්තරීතරම සතුටයි.

මෙම වැරදිවලට බරපතළ වැඩ ඇතිව අඩුරුදු 20 දක්වා සිරගත කළ හැකිය. ලැජ්ජාව, බිය සහ ගෞරවය හේතුවෙන් ඇතැම් ළමා අපචාර නීතිය ඉදිරියට නොගොස් නිහඬව විඳ දරා ගැනීම කිසිසේත්ම යහපත් තත්ත්වයක් නොවේ. එය අපයෝජකයාට තව තවත් අපරාධ කිරීමට රුකුලක් වනු ඇත.

ඉඩ දෙන්න

මල් ඔසරි

නීල ගුවන් ගැබ
තරු මල් පිපුණු
මැදියම සීතල පින්නෙ
කන්දෙන් එබුණු පුර සඳ
මතක සිහින පොදි බැඳ
අතීතය ගොලු කර
උපන් කවි සිත මරා
ඉවුරු තරණය කළ
අකුරු කළ කුමරිය
සැඟව ඇති කෙම් බිමේ
මල් ඔසරි ඇඳ
සිඟිති මල් කැකුළු මැද
සරත් රූසිරි දසුන්
දකින්ට පිං නැති ද
වැසෙන්නට පෙර නෙත් පියන්

ලක්ෂ්මන් වසන්ත රුක්මාල්,
පිළියන්දල.

පන්සිල්

රට තුළ සැම වැඩ ඇරඹීමට පෙර
සැමදෙන පන්සිල් ගන්නවා නොපැකිල
එනමුදු පන්සිල් රැක්මන් නම් නැත
නිති රැක්මයි යුතු ගන්නා සිල්පද

සිරිතක් විලසින් වදනින් මුහුණා
ගත්ත සැණින් සිල් කඩනවා මිනිසා
එලෙසින් පන්සිල් ගත්තට සැමද
පව් මිස නැත පින් නිති දිවි උදෙසා

එබැවින් අපි නිසිලෙස පන්සිල් ගමු
එලෙසම පන්සිල් දිවි මෙන් සුරකිමු
බුදු සමිඳුන් පෙන්වූ දම් මගෙ යමු
මිණිකැටෙ මෙන් අපෙ දිවි බබළවා ගමු

කේ. ඩබ්ලිව්. සිරිසේන,
මාලබේ.

ආශිර්වාදය

වැටෙන පිණිබිඳු පිරිත් පැන් වී
දෙරණ මතුපිට පතිත වේවා
හමන මද නල සෙත් කව්ය වී
දස දිසාවට විසින් යේවා
සවස පායන සඳ කිරණ බෝ
හිමිගෙ සිසිලස රැගෙන යේවා
පැතිර ඇති රුදු වසංගතය බිය
තුණුරුවන් සරණින් නැසේවා
දිවි රෑ නොබලා වෙසෙන සුව
විරුවන්
මනුසත් දනගෙ පණ නළ

සුරසන දෙවියන්
පිං වත් දෑත් එක්කර
කරනා උවටැන්
දෙවිරුක වරණ දෙයි
සලමින් විජිනි පතින්
සමුදුර ගහන මිහිමත
විකුමන් පාමින්
සුවහස් දනන් ගේ දුක්
කඳුළැලි පිසිමින්
උරදෙන සැම දෙයට
එක්කර ගති පාමින්
දැල්වෙයි දේවතා
එළි තුන්යම
රකිමින්
නොයනා ගමන් යන
ලක් මවගේ දරුවන්
අවනත වෙන්න වෙයි
ලෝ දහමට නිතැතින්
දැවෙන හදින් පතනා
අවසන් පැතුමන්
ඔබ සැම සැනසෙන්න
අජරාමර නිවනින්

ආර්.පී.ජේ. ධර්මා
ගල්කිස්ස.

වියපත්වූදා...

වැහිබිඳු පෝළිමෙ ගලා විත්
තෙමයි මිහිකත සනසවා
කඳුළු බිඳු නෙත යටින් ගලාවිත්
වැළ පෙයි හදවත ඉකිගසා
සෙනෙහෙදුන් ඇය මටත්
නොකියා මනෝ පෙනෙන
ලොවකට පියඹලා
ගෙවුණු මං පෙත් සිහිකරන්නෙමි
නුඹෙන් පණිවුඩේ එනතුරා

සිතත් ගොළු වූ පාළු පැල තුළ
අසම් බණ පද ගොම්මනේ
වෙහෙස වූ ගත සන
සවන්නට බුදු හිමි දෙසු
දම් සවනේ රැඳේ
සවිය ඇති ගත සිතත්
ඇති විට මිරිකුණු ජීවන
අම්ඹරේ
සිහි කරමින් අද නිවන
සොයනු හැර කුමක් කරමිද
වියපත් වූ දිනේ

පුතා ඉදුණු එද පැල්පත
සතුටකින් බර ඉතිරුණා
නුඹත් අම්මා කෙනෙක්
විලසින් ලොවේ උත්තම
පදවි දැරුවා
මගේ දුක සැප බලා සෙනෙහෙන්
පතිනිදැහමත් සුරෙකුවා
ලොවේ උත්තම බිරිඳ වූ නුඹ
දෙවිලොවේ ඇත මා එනතුරා

හේනෙපැල්පත සීත මැදියම
හදේ උන්නෙත් නුඹයි පැටියයි
කුරක්කන්මල් පොකුරු පිපුනෙත්
පැලේ ගින්දර දැනී වාගෙයි
නුඹට හිමි ලෙස පුතුට පිය ලෙස
සීලෙ රැක්කා සත්තකයි
ලොවේ දහමත් ඇත්ත වේනම්
මටත් දෙවිලොව අසුන්වෙන්
වෙයි

ටී.ජී. රන්තරු ජයමාල්,
කැලණිය විශ්වවිද්‍යාලය.

දිසාපාමොක්

දිසාපාමොක් පරපුරින් ආ
උතුම් ගුරුවරු කොයි ගියාදෝ
සිය කුසින් වැදූ දරුවනට මෙන්
සිල්ප කිරි දුන් මවු කොහේදෝ

සුව පහසුකම් නැත ද කිසිවක්
සිල්ප ඥනය නොදුනි දෝ
වැටුප් නැතිවත් උගන්වපු හැටි
නුඹට අද අමතක වුණා දෝ

පොරණ ඇදුරන් සුර ගුරුන් වැනි
මෙලොව අත හැර ගියා දෝ
සෙනහසින් ඇකයෙහි තබාගෙන
අකුරු කළ හැටි මතක දෝ

මාවතේ මැද සිහි විකල් වී
වද විඳින්නේ කුමට දෝ
අපේ දරු පරපුර නසන්න ද
උනගෙ සිප් උරුමය නොදී

සඳුට දෙවැනිව රැය එළිය දුන්
ගුරු තරුව අද කොයිබ දෝ
කළු වලාවක පැටලිලා ගොස්
රුදුරු අඳුරට හසු වුණා දෝ

රටට වැඩ ඇති දැයට හිත ඇති
දූ පුතුන් සැදුමට නොබා
තනතුරේ ඇති ගරු සරුව නිති
රැකිය යුතු සිහියෙහි තබා

පී. කරුණා පෙරේරා,
කොළඹ.

කොරෝනා පාලනයට පුරවැසි වගකීම ඉටුකරමු

මිනිස් ජීවිත විශාල වශයෙන් අහිමි වූ කාල වකවානුවක් ලෙස දෙවැනි ලෝක යුද සමය නම් කල හැකියි. මේ කාල වකවානුවෙන් පසු රටවල් තුළ යුද්මය තත්ත්වය පැවතුණ දෙවන ලෝක යුද්ධයට සාපේක්ෂව මිනිස් ජීවිත අහිමි වීම සිදු වූයේ නැත. එහෙත් දෙවසරක් පමණ ලෝකය ම වෙළා පැතිරෙන වසංගතයක් ලෙස කොරෝනා හැඳින්විය හැකි අතර දෙවැනි ලෝක යුද සමයේ අහිමි වූ මිනිස් ජීවිතවලට සමානව මෙම වසංගතයට වී ගොදුරුව නිහඬවම ජීවිත බිලිගෙන ඇත.

ගසක වැඩෙන පිළිලයකට නිසි ප්‍රතිකාර නොකළහොත් මුළු ගස පුරාම එය වර්ධනය වීයයි. එයින් තවත් ගස්වලටත් බෝ වීම සිදු වේ. කොරෝනා වසංගයත් පැමිණි මුල් කාලයේ නිසි පාලනයක් සිදු කළක් එය දිගටම පවත්වා ගෙන නොයාම නිසා මේ වන විට එහි බිහිසුණුකම වැඩි වෙමින් දරුණු ප්‍රතිඵල අත්කර දෙමින් පවති.

ලංකාව ගත් කල කොරෝනා මුල් රැලි සාර්ථක ලෙස පාලනය කර රටවල් අතරින් ඉදිරියෙහම සිටි රටකි. එයට ප්‍රධාන හේතුවක් ලෙස මෙරට පවතින සෞඛ්‍ය දේශගුණය ආහාර රටා බලපෑවේය. මිනිසා යන සත්ත්වයාට සියල්ල ඉක්මනින් අමතක වන සුළුය. මුල් රැලි යහපත්ව පාලනය කල නිසා ඉතා ඉක්මනින් සෞඛ්‍ය පිළිවෙත් අමතක වී තම තමන්ට රිසි සේ කටයුතු කරන්නට වුයෙන් එහි ප්‍රතිඵල මේ වන විට භුක්ති විඳිමින් සිටිති. පළමු කොරෝනා සමයේ මිනිස් ජීවිත 5- 6 ක් දවසකට අහිමි වුවද මේ වන විට එය 200 සීමාව ආසන්නයට පැමිණ තිබේ.

මධුෂාණී ජයසූරිය
කැලණිය විශ්ව විද්‍යාලය

මෙම වසංගතය සමඟ සටන් කිරීමට රටේ ජනපති මැති ඇමතිවරු, ආරක්ෂක අංශ, සෞඛ්‍ය අංශ යනාදීන්ට පමණක් කනිව කළ හැකි කාර්යයක් නොවේ. රටක සංවර්ධනයට 80% කම දායකත්වය ජනතාවගෙන් ලැබිය යුතු සේම මෙම මාරයා විනාශ කිරීමටත් ජනතා සහාය ඉතාම වැදගත්ය.

මේ දින වන පැතිර යන දරුණුම කොරෝනා ප්‍රභේදයේ තතු එයින් වන හානිය එයින් ආරක්ෂා වන ආකාරය සෞඛ්‍ය අංශ මාධ්‍ය හරහා කොතරම් දැනුම්වත් කළද තවමත මෙහි දරුණුබව අවබෝධ කර නොගත් මිනිස්සු සිටිති. පළමුව ඔබ ඔබ ගැන සිතන්න ඔබට මෙම රෝගය වැළඳුණ හොත් එයින් ඔබගේ මවුපියන් දරුවන් අසල්වාසීන් යනාදි සියල්ලටම බෝ වනවා නොවේද? සෑම විටම ඔබ රෝග වාහකයෙක් නොවීමට වගා බලා ගන්න. නිවැරැදි සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් අනුගමනය කරන්න. වෛද්‍යවරයා හෙදිය, ආරක්ෂක අංශ ඔවුන්ගේ ජීවිත ගැනවත් නොසිතා ඔබ අප වෙනුවෙන් කරන කැපකිරීමට අප අපගේ උපරිම සහයෝගය ලබා දිය යුතු නොවන්නේද?.



අපගේ අසල්වැසි රට වන ඉන්දියාව එකම කඳුළු ගංගාවක් වී අමු සොහොනක බවට පත් වී හමාරය. එවන් බේදනීය තත්ත්වයකට මෙරටත් පත් වීමට ඉඩ නොදෙමු.

කොරෝනා මාරයා මෙරටින් තුරන් කිරීමට නිවැරැදි සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කර තමන්ගෙ වගකීමට එහා ගිය වගවීමක් ඉටු කරමු.

පානදුරේ ව්‍යාපාරිකයකුගෙන් සද් ක්‍රියාවක්

තමන්ගේම ජීප්රිය සුවසැරියක් කරගෙන

(පානදුර සමන් කාරියවසම්)

කොවිඩ් ආසාදිත රෝගීන් නොමිලේම තම ජීප් රථයෙන් රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථාන වෙත ප්‍රවාහනය කර උදරතර කටයුත්තක නිරත වන පුද්ගලයකු පිළිබඳව පුවතක් පානදුර ගොරකාන ප්‍රදේශයෙන් වාර්තා වේ.

සහස්‍ර විජිත නමැති 60 හැවිරිදි ව්‍යාපාරිකයා දැනට දින හතරක් තිස්සේ මෙම කටයුත්තට උරදෙමින් දිවි පරදුවට තබා තම සේවාව කොවිඩ් රෝගීන් වෙත ලබාදෙයි.

දිනයක්, වේලාවක් නොමැතිව දිවා රාත්‍රී ලැබෙන දුරකතන ඇමතුම්වලට පැය 24 පුරා සිය සේවාවන් සැපැයීමට ඔහු සූදානමින් සිටී.

ඔහුගේ බිරිය වන කුමාරි විජිතා මහත්මිය ද ඔහුට ලබාදෙන දයකත්වය අතිමහත්ය.

කොවිඩ් වසංගතය හමුවේ බියෙන් තම නිවෙස්වලට වී ආරක්ෂා වීමට බොහොමයක් පිරිස වෙර දරන යුගයක සහස්‍ර විජිත මහතා ලබාදෙන සේවය රටටම ආදර්ශයකි.

බෙල්ලන්විල ඇසළ පෙරහර චාරිත්‍රවලට සීමාවෙයි

(දෙහිවල එච්.එම්. ධර්මපාල)

සෞඛ්‍ය උපදෙස් මත මෙවරත් බෙල්ලන්විල රාජමහා විහාරස්ථානයේ ඇසළ පුණ්‍යාත්සවය හා පෙරහර මංගල්‍යය චාරිත්‍ර විධිවලට පමණක් සීමා කරමින් නර්තන අංග රාශියක් සමග අත්‍යලංකාරයෙන් සිදු කරන අතර, ඒ සඳහා සුබ නැකතට අද (18 වැනිද) කප් සිටුවීමේ මංගල්‍යය චාරිත්‍ර සිදු කිරීමට ද තීරණය කර ඇතැයි සිංගප්පූරුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක බෙල්ලන්විල රාජමහා විහාරාධිපති ආචාර්ය බෙල්ලන්විල ධම්මරතන නාහිමියෝ පැවැසූහ.

බෙල්ලන්විල රාජමහා විහාරාධිපති ආචාර්ය බෙල්ලන්විල ධම්මරතන නායක හිමියන් අනුශාසනාව සිදුකළ අයුරු.

71 වැනි වරටත් සංවිධානය කරනු ලබන බෙල්ලන්විල ඇසළ පෙරහර පුණ්‍යාත්සවය පිළිබඳව මාධ්‍ය ආයතන දැනුවත් කිරීම සඳහා විහාරස්ථානයේ පැවැති මාධ්‍ය හමුවේ මුලසුන අනුශාසනාව සිදුකරමින් උන්වහන්සේ මෙසේ ද කීහ.

"මේ අනුව මෙම මස 23 වැනිද බෙල්ලන්විල පෙරහර නිර්මාතෘ අපවත්වී වදුල ශ්‍රී සෝමරතන නාහිමි සහ මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනුනාහිමි ගුණානුස්මරණ ධර්මදේශනාව සිදු කිරීමටත්, 25 වැනිද සර්වරාත්‍රික පිරිත් දේශනාව සිදු කිරීමටත්, 27 වැනි සිකුරාද මල් පෙරහර විහාරස්ථාන පරිශ්‍රයේදී දයක මහතුන්ගේ සහභාගිත්වයෙන් සිදු කිරීමටත්, 28 වැනිද සර්වඥ ධාතුන් වහන්සේ රැගත් සධාතුක කරඬුව දයක මහතුන්ගේ හිස මතින් විහාරස්ථාන පරිශ්‍රයෙන් පිටතට පළමු වරට වඩම්මන පාවාඩ පෙරහර හා 29 වැනිද පෙරහර මංගල්‍යය නිමා කරමින් දේවාශිර්වාද පතා බොරලැස්ගමුව තොටුපළදී චාරිත්‍රානුකූලව දිය කැපීම සිදුකර දේව දානය ලබාදීමෙන් මෙවර පෙරහර පුණ්‍යාත්සවය නිමාකරනු ලබනවා."

එම අවස්ථාවට බෙල්ලන්විල රාජමහා විහාරාධිකාරී බොරලැස්ගමුව පේමරතන හිමි, ඇසළ පෙරහර කමිටුවේ සභාපති එච්. ඩී. ප්‍රේමසිරි, ලේකම් කේසරලාල් ගුණසේකර, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම් ආරිය රූබසිංහ, විහාරස්ථාන ලේකම් ලසන්ත රත්නායක යන මහතුන් ඇතුළු ජනමාධ්‍යවේදීහු සීමිත පිරිසක් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමයට අනුව සහභාගි වී සිටියහ.

ගෙවල් කඩා සොරාගත් ලක්ෂ 25ක බඩු එක්ක සැකකරු මාට්ටු

(දෙහිවල එච්.එම්. ධර්මපාල)

දෙහිවල පොලිස් වසමේ නිවාස බිඳුම් ගණනාවක් සිදුකර රුපියල් ලක්ෂ 25කට අධික වටිනා රන් භාණ්ඩ, විදේශ මුදල් ඇතුළු දේපළ සොරා ගන්නා ලද අපරාධකරුවකු ඉකුත් 14 වැනිද කවුඩාන ප්‍රදේශයේදී හෙරොයින් මිලිග්‍රෑම් 4,100ක් සමග දෙහිවල පොලිස් අපරාධ අංශය අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් දේපළ දෙහිවල පොලිස් ස්ථානයේදී අපරාධ අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක මහේෂ් මලවීර මහතා ඇතුළු නිලධාරීන් පරීක්ෂාවට ලක්කරන අයුරු.

කවුඩාන ප්‍රදේශයේම පදිංචි වයස අවුරුදු 42ක් වන සැකකරු අධික ලෙස හෙරොයින් පානයට ඇබ්බැහි වී සිටින අතර, ඒ සඳහා මුදල් සොයා ගැනීමට මෙලෙස නිවාස බිඳුම්වල නිරත වන බව හෙළි වී ඇතැයි පොලිසිය කියයි. සැකකරු මීට පෙර ද නිවාස බිඳුම්, කොල්ලකෑම් ඇතුළු වැරැදි ගනණාවකට බන්ධනාගාරගතව ඇප මත පැමිණ සිටි අයකු ද වේ.

අපරාධ අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක මහේෂ් මලවීර මහතා වෙත පෞද්ගලික ඔත්තුකරුවකුගෙන් ලද තොරතුරකට අනුව කවුඩාන ප්‍රදේශයේදී සැකකරු අත්අඩංගුවට ගෙන පරීක්ෂාවට ලක්කිරීමේදී සැකකරුගේ කොට කලිසමේ සාක්කුවේ රහසිගතව සඟවාගෙන සිටි හෙරොයින් මිලිග්‍රෑම් 4,100ක් සොයාගෙන ඇත.

සැකරුගෙන් වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේදී මෙම නිවාස බිඳුම්වල තොරතුරු අනාවරණය වූ බවත්, සොරාගත් දේපළ අතරින් රුපියල් ලක්ෂ දහයකට ආසන්න වටිනා රන් දම්වැල් 2ක්, පෙන්ඩන්ට් 3ක්, වළලු 2ක්, මුදු 1ක්, විදේශ මුදල් යූරෝ 400ක්, විශාල අවන් 1ක්, රයිස් කුකර් 2ක්, ප්ලාස්ටික් පුටු 5ක්, රුපියල් 50,000ක් වටිනා



ඉලෙක්ට්‍රොනික් කාර් 1ක්, කුෂන් සහිත ලී පුටු 6ක්, වටිනා මෙට්ට 5ක්, වීදුරු පිඟන් දුසිම් 1ක්, කෝප්ප 10ක්, රුපියල් 70,000ක් වටිනා සුවඳ විලවුන් කුප්පි 2ක්, ඇලුමිනියම් ඉනිමගක්, ජංගම දුරකතන 3ක් ඇතුළු දේපළ සොයා ගැනීමට හැකි වී ඇත.

වැඩිදුර පරීක්ෂණ කටයුතු දෙහිවල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.එල්. දුෂ්මන්ත ලියනගේ මහතාගේ අධීක්ෂණයෙන් අපරාධ අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක මහේෂ් මලවීර මහතාගේ උපදෙස් මත උපපොලිස් පරීක්ෂක දිසානායක, පොලිස් කොස්තාපල්වරුන් වන (68425) නිහාල්, (91460) චාමර යන නිලධාරීහු සිදු කරති.

ගිනි අවියක් එක්ක සැකකරු දැලේ

(මීගහතැන්න ප්‍රේමතිලක පෙරමුණ)

බෙල්ජියම රටේ නිෂ්පාදිත බෝර 12 වර්ගයේ නීති විරෝධී ගිනි අවියක් සමග සැකකරුවකු ඉකුත් 12 වැනිද අත්අඩංගුවට ගත් බව මීගහතැන්න පොලිසිය පවසයි.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ, මීගහතැන්න පොලිස් වසමේ පාවරගොඩැල්ල ප්‍රදේශයේ පදිංචි 43 හැවිරිදි පුද්ගලයකු බව පොලිසිය පවසයි.

මෙම ගිනි අවියේ අංක අපැහැදිලි බව ද දීර්ඝ කාලයක් මෙය සැකකරු සන්තකයේ තිබුණු බවට කරුණු අනාවරණය වී යැයි ද සැකකරු මෙම අවිය සතුන් දඩයම් කිරීම සඳහා භාවිත කරන්නට ඇතැයි විශ්වාස කරන බව ද පොලිසිය සඳහන් කරයි.

පොලිසිය වෙත ලද තොරතුරක් මත පොලිස් සැරයන් (36624) රුදිගෝ, පොලිස් කොස්තාපල්වරුන් වන (48116) ස්ටැන්ලි, (45299) පුෂ්පකුමාර යන මහත්වරුන් විසින් වැටලීම සිදුකර සැකකරු අත්අඩංගුට ගෙන ඇති අතර, සැකකරු ඉකුත් 13 වැනිද උසාවියට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

කළුතර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කපිල ප්‍රේමදස මහතාගේ උපදෙස් මත මීගහතැන්න පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්. එම්.ජේ. ආරියවංශ මහතා වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

බුලත්සිංහල 5600 කට එන්නත

(බුලත්සිංහල ලක්ම් කුඩලිගම)

බුලත්සිංහල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල බලප්‍රදේශයේ එක් දිනක් තුළ අඩුම කාර්ය මණ්ඩලයකින් වැඩිම කොවිඩ් එන්නත් මාත්‍රා ගණනක් ලබාදීමට ඉකුත් 14 වැනිද හැකි වූ බව බුලත්සිංහල පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක මංජුල මුදලිගේ මහතා පැවැසීය.

බුලත්සිංහල ජාතික පාසලේ එන්නත් ලබාදුන් අයුරු.

බුලත්සිංහල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, වෛද්‍ය එස්.බී.වී.කේ. රණවීර මහතාගේ මෙහෙයවීමෙන් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක මංජුල මුදලිගේ මහතා අතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩලය හා ග්‍රාම නිලධාරීන් දැඩි කැපවීමෙන් කටයුතු කර එක් දිනක් තුළ පුද්ගලයන් 5,600 දෙනකුට එන්නත ලබා දී සිය බලප්‍රදේශය තුළ අඩු කාර්ය මණ්ඩලයකින් වැඩිම එන්නත් ප්‍රමාණයක් ලබා දී මෙම වාර්තාගත ඉලක්කය සපුරාගෙන තිබේ.

ඒ අනුව බුලත්සිංහල යටගම්පිටිය විද්‍යාලය, බුලත්සිංහල ජාතික පාසල සහ පහළ වෙල්ගම විද්‍යාලය යන ස්ථානවලදී පැවැති සයිනොෆාම් එන්නත් දෙවැනි මාත්‍රාව ලබාදීමේ වැඩසටහන යටතේ බුලත්සිංහල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ කාර්ය මණ්ඩලය සමග මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීහු මේ අයුරින් කටයුතු කළහ.

ශ්‍රී ලංකා යුද හමුද වෛද්‍ය බළකාය මැදිහත්ව ඉහත සඳහන් ස්ථාන තුනේදී ජනතාවට සයිනොෆාම් එන්නත් දෙවැනි මාත්‍රාව දෙන බවට කල් ඇතිව දැනුම් දී ජනතාව දැනුම්වත් වී තිබියදී හදිසියේ යුද හමුද වෛද්‍ය ඒකකය නොපැමිණීම නිසා ජනතාව අපහසුතාවට පත්වීමට ඉඩ නොදී හැකි අයුරින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්ය මණ්ඩල එම ස්ථානවලට ගොස් එන්නත් ලබාදීමට කටයුතු කර තිබේ.

හෙට්ටිමුල්ලේ මරුකට වසයි

ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ හෙට්ටිමුල්ල මංසන්ධියේ ජල සම්පාදන ව්‍යාපෘතියකට අනාරක්ෂිතව හාරා තිබූ අනතුරුදායක වළ මාධ්‍ය මගින් අනාවරණය කිරීමෙන් පසු වසා තිබෙන බව ප්‍රදේශවාසීහු කියති.

අනතුරුදායක ස්ථානය පිළිසකර කර තිබෙන අයුරු
(අලුත්ගම තුසිත කුමාර ද සිල්වා)

මේ සම්බන්ධයෙන් රියැදුරන් විශාල පිරිසක් ද බේරුවල පොලිසියට ගාලු පාරේ මෙම අනතුරුදායක වළ සම්බන්ධයෙන් පැමිණිලි කර තිබූ අතර කඩිනමින් එම ස්ථානය යථා තත්ත්වයට පත්කර තිබේ.

අලුත්ගම වේල්ල ළඟ අලුත් විදුලි කණු ඇවිදලා

(අලුත්ගම තුසිත කුමාර ද සිල්වා)

අලුත්ගම මීගම බස් මාර්ගයේ පැරැණි විදුලි කණු වෙනුවට කරිජ්ජ වේල්ල ආසන්නයේ නව විදුලි කණු සිටුවා ඇත්තේ පැරැණි විදුලි කණු සිටුවා තිබෙන සීමාවට වඩා අඩි හයක් පමණ මාර්ගය ආසන්නයේ බව ප්‍රදේශවාසීහු පෙන්වා දෙති.

මෙලෙස රජයේ මුදල් අවිධිමත්ව වැය කරමින් සිදුකර ඇති මෙම ඉදිරි විදුලි කණු සිටුවීම පිළිබඳ අදාළ විෂය භාර අංශ වෙත ප්‍රදේශවාසීන් පැමිණිලි කර ඇතැයි ද ඔවුහු කියති.

මෙලෙස විදුලි කණු සිටුවීමෙන් ඉදිරි කාලයකදී මාර්ගය පුළුල් වීමක් සිදුකළහොත් නැවතත් රජයේ මුදල් ප්‍රතිපාදන වැයවන බැවින් මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු කරන ලෙස අවට ජනතාව කියති.

නව විදුලි කණු සිටුවා ඇති අයුරු.

උතුරු කළුතර හරක් පාරේ

උතුරු කළුතර ප්‍රදේශයේ ගාලු පාරේ නිදැල්ලේ යන ගවයින් ගැවැසීම වැඩි වී රථවාහනවල ගැටීමෙන් රියැදුරෝ අසීරුවට පත්ව සිටිති.

උතුරු කළුතර ප්‍රදේශයේ ගාලු පාරේ මහ දවල් ගව රංචුවක් සිටි අයුරු.

(කළුතර සුනිල් එස්. තන්ත්‍රිආරච්චි)



හිඟන්නියක්

වැරහැලි රෙදි කැබැල්ලෙන් විලි වසා ගෙන
හැඩ පලු ගෙතුණු කෙස් පිට මැද හෙලා ගෙන
දුක් වේදනා මැද හද තුළ ගලා යන
අසරණ ගැහැනියක් මහමග හිඟා කන

උකුළෙහි දරුවෙක්ය නැහැයෙන් හොටු බේරේ
තවෙකෙක් අතේ එල්ලී යයි මහ පාරේ
දෙදෙනගෙ හැඬීමෙන් ඇගෙ හදවත පෑරේ
බැම රැලි ගැසී යයි මුහුණින් එය තේරේ

ඇගෙ වැහැරුණු සිරුර හැමටම පිළි කුලකී
ඈ ගැන අසතුටක් පෙන්වන කොලු රැලකී
විමසුම් ඇසින් බැලුවොත් වෛරෙන් වැළකී
ඇය අකලට මළානික වී ගිය මලකී

බඩගිනි දැනීදෝ උකුලෙහි උන් දරුවා
උඩුකය වසා සිටි ඇගෙ හැට්ටය ඉරුවා
එල්ලී අතේ පියමන් කළ ලොකු දරුවා
ඇඬමින් ඇඟිල්ලක් මුව තබමින් ඉරුවා

මේ පොඩි දරු පැටව් දෙන්නා හඬන විට
මොනවා හිතේවිද ඒ අසරණිය හට
ඒ බව කියන්නට වැඟිරුණු කඳුළු කැට
නොදැනිම හැරවුණා මෙනි මහ නදිය කට

ඇය මේ වගේ ඉරණමකට ගොදුරු වුණේ
මොන වරදින්ද විමසා බැලුවිටදී පෙනේ
දරු දෙදෙනා නිසා ඇය මහමගම වැනේ
මේ මුළු සමාජෙම පිළිකුල් කරනු පෙනේ

තිලක් දසනායක
පන්නිපිටිය

ඔබේ නිර්මාණ කොළොම්පුර කවි මඩුව "ලංකාදීප" කර්තෘ මණ්ඩලය, අංක 8, හුණුපිටිය හරස් පාර, කොළඹ 02. ලිපිනයට යොමු කරන්න.

මේ ලංකාදීප තාරුණ්‍යයේ පිටුවයි

නවරැල්ලට ඔබේ නිර්මාණ විද්‍යුත් ලිපිනය හරහාද එවිය හැකිය.
විද්‍යුත් ලිපිනය -
nawarallawnl@gmail.com



විදෙස් නාට්‍ය ආක්‍රමණය කළ අපේ සොඳුරු ටෙලි කතා



ශ්‍රී ලංකාවේ ටෙලිනාට්‍ය කලාවේ උපත දිමුතු මුතු නම් සොඳුරු වූ ටෙලි කතාවකින් සිදුවූ බව අපගේ මතකයේ අදටත් මිහිදන්ව ඇත. අපේ රටට, අපේ සංස්කෘතියට උචිත අපේ පවුල් ඒවලට වඩාත් ගැළපෙන තේමාවන්ගෙන් සජිරි ටෙලි කතා ඒ පසු පස්සේ බිහි විය. අදටත් ඒවායේ සොඳුරු මතක සැමගේ සිත් මත ඉතිරිව ඇතිවා සේම උසස් රසවින්දනයක් ලබා ගැනීමේ හැකියාව ද ප්‍රේක්ෂකයාට නිතැනින්ම හිමි විය.

එහෙත් වර්තමානයේ රූපවාහිනී නාලිකා බිහිවීමේ ප්‍රවණතාවයත්, ඊට සමගාමීව පෙන්වනු ලබන ටෙලිකතා ප්‍රමාණයත් දිනෙන් දිනම වැඩි විය. ඒ අතරතුර ආක්‍රමණශීලී වෙසින් පැමිණි විදෙස් ටෙලි නාට්‍ය අපගේ සෑම සියලු නාලිකාවක්ම ඉතා ඉක්මණින් තම ග්‍රහණයට හසු කරනු ලැබීය. අද විදෙස් ටෙලි නාට්‍යයක් විකාශනය නොවන නාලිකාවක් සොයා ගැනීමට පවා අපහසුය.

ලෝකය එකම පියස්සක් යටට ගෙනා ගෝලීයකරණය ටෙලිනාට්‍යය කලාවට ද එකසේ බලපෑවේය. විදෙස් ටෙලි නාට්‍ය බැලීමට පහසුකම් නොමැති ඒ සඳහා ප්‍රියතාවයක් දැක් වූ ප්‍රේක්ෂකයාට එය මහඟු අවස්ථාවක් විය. භාෂාවේ දැනුම අඩු ප්‍රේක්ෂකයාට පවා අපගේ මවු භාෂාවෙන් හඬ කවන එම ටෙලි නාට්‍ය බැලීමට අවස්ථාව එයින් උදා විණි.

එහෙත් අද පවතින්නේ ඉතාමත් ශෝචනීය තත්ත්වයකි. විදෙස් ටෙලිනාට්‍ය විකාශනය සඳහා තෝරා ගැනීමේ දී අප විසින් භාවිත කරන්නේ කුමන මිනුම් දඬු ද යන්න ගැටලුවකි. සමහර ටෙලිනාට්‍ය තැරඹීමේ දී එහි කොටස් ගණන අප ජීවත්ව සිටිය දී නරඹා අවසන් කළ හැකි ද යන්න පවා ගැටලුවකි. එසේම සමහර පවුල් ඒ සම්බන්ධයෙන් විකාශනය වන ටෙලි නාට්‍ය තැරඹීමේ දී මෙම සිදුවීම් මිහිපිට සිදුවිය හැකිද? යනාදී පවා සිතාගත නොහැකිය. එකම පවුලේ අඹුදරුවන් මවුපියන් සහෝදර සහෝදරියන් නෑයන් අතර සිදුවන කුමන්ත්‍රණ වෛරකාරී සිතුවිලි අනෙකා පරයා නැගී සිටීමට දරන වෑයම ඉතා පිළිකුල් සහගතය. පෙම්වතුන් පෙම්වතියන් අතර සිදුවන්නේ කුමන්ත්‍රණය. ආදරයෙන් එක්වීමක් දැකගත නොහැකිය. සමහර ටෙලි නාට්‍ය අපේ රටට අපේ සංස්කෘතියට ගැළපෙන්නේ දැයි නැවත වරක් සිතා බැලිය යුතු තත්ත්වයක් උද්ගතව ඇත.

පොදුවේ ගත්කළ මේ ටෙලිනාට්‍ය අපේ මනස විකෘති කර දමනු ලබයි. ටෙලි නාට්‍යයක් නැරඹීමෙන් අප බලාපොරොත්තු වන්නෙ යම්කිසි මානසික වින්දනයකි. එහෙත් මේ නාට්‍ය තුළින් ප්‍රේක්ෂකයාට එවන් සත්‍යාපේක්ෂිතයක් ලැබෙනවාදැයි සොයා බැලිය යුතු කරුණකි. තවද උසස් රස වින්දනයක් ලබා ගැනීමට හැකි ටෙලිනාට්‍ය තොරා ගැනීමට හැකියාව තිබියදීත් අප යන්නේ මංමුළා වූවන්සේය. ඒ තුළ උසස් නිර්මාණයක් රසවින්දනය කිරීමට ප්‍රේක්ෂකයාට තිබෙන අයිතිය මගහැරී ඇත.

ශ්‍රී ලාංකික බොහෝ ප්‍රේක්ෂකයන් මෙම ටෙලිනාට්‍ය නරඹන බව නොරහසක් නොවේ. අපේ රට තුළ පවුල් අතර සිදුවන අපරාධ වගේම සමාජීය වශයෙන් සිදුවන විවිධ අපරාධවලට මෙම කතා පාදක නොවනවා සේ සිතිය නොහැකිය. ඒ වගේම තරුණ පරපුර නරක ඇබ්බැහිවීම්වලට යොමුවීමට පවුල් ඉතිරීම්වලට, ළමා හිංසනයන්ට වැනි සමාජ පරිසරයක් තුළ නොසිඳු විය යුතු බොහෝ කරුණුවලට මෙම ටෙලිනාට්‍ය කතා මුල් නොවනවා සේ සිතීමට අපට කරුණු කාරණා නොවේ.

අපට පෞඪවත් ඉතිහාසයක් උරුමව තිබේ. හොඳ සංස්කෘතියකට උරුමකම් කියන අපිට පවුලේ බාල මහලු වැඩිහිටි සියලු දෙනා විසින් එකට නැරඹිය හැකි අපේ රටේ සොඳුරු ටෙලිනාට්‍ය කලාවක් ද දායාදව තිබේ. එහෙත් අද, ඒ සොඳුරු ටෙලිනාට්‍යවලට සිදු වූයේ කුමක්ද? යන්න සිතෙන විටත් හද කම්පා කරයි. ඔබට මට අමතක කරන්න බැරි අපේ රටේ සොඳුරු ටෙලිනාට්‍ය වූ යශෝරාවය, ගම්පෙරළිය, දූ දරුවෝ අසල්වැසියෝ දඬුබස්නාමානය වැනි ටෙලිනාට්‍ය අදටත් අපේ සිත් තුළ මහා දාවැන්තයන් ලෙස අරක් ගෙන සිටී. එහෙත් අද, එවන් උසස් නිර්මාණ රසවිඳීමට ප්‍රේක්ෂකයාට තිබෙන අයිතිය කුමක්දෝ බලවේගයකින් අහිමිවී ඇත.

අද එවන් සොඳුරු උසස් රසවින්දනයක් සහිත කතා විකාශය වීමේ අඩුවක් දක්නට ලැබේ. සමහර ටෙලිනාට්‍ය විදෙස් ආභාෂය ලබා ඇත. අපේ සංස්කෘතියට ගැළපෙන නිර්මාණ බිහිවීමේ අඩුවක් දක්නට ඇත. උසස් රසවින්දනයක් ලැබීමට නම් උසස් ගුණාත්මක බවින් යුත් නිර්මාණ බිහිවිය යුතුය. අද වළපල්ලට යමින් පවතින්නේ අපේ මේ උසස් නිර්මාණයන්ය. එබැවින් එය රැක ගැනීමටත් මනු පරපුර වෙනුවෙන් ආරක්ෂා කරදීමේ වගකීම අප සතුය.

ධවල පත්‍රිකාව...

ශ්‍රීමානි ප්‍රියංගිකා,
විහාරගොඩ, බදුල්ල

මල් කැකුළු පිපෙන්නට ඉඩ දෙන්න

යම් රටක දරුවන් හද වඩා ගන්නා ආකාරයත් අධ්‍යාපනය පෝෂණය, සෞඛ්‍යය සහ රැකවරණය ලබා දෙන ආකාරයත් එරට අනාගත පැවැත්ම තීරණය වේ. වර්තමානයේ කුඩා දරුවා අනාගතයේ රට පිළිබඳව වගකීම් දරන්නෙකි. 'ළමයා වනාහි ඉදිරි කාලයේ බිහි වන මිනිසාය' යනුවෙන් ඇරිස්ටෝටල් පඬිතුමා ළමයාව අර්ථවත් කළේ එබැවිනි. රටේ කොඳුනාරටිය තරුණ පරපුර නම් රටේ ජීවනාලිය ළමා පරපුරයි. රටේ ජීවය බඳු දරුපරපුර විවිධ උවදුරුවලින් ආරක්ෂා කිරීම වර්තමානයේ මවුපියන් සතු අභියෝගයකි.

සමාජය යනු විචාරවූත් අවිචාරවූත් සංකලනයකි. සමාජයේ වෙසෙන මිනිසුන් සුදු කළු යනුවෙන් ඉරි ගසා වෙන්කළ නොහැකිය. සෑම සමාජයකම දක්නට ලැබෙන්නෙ අළු පැහැති චරිත ගත් මිනිස්සුය. යහපත අබිබවා අයහපත ග්‍රහණය කරන සමාජයක ළමයා යනු නොමේරූ තැනැත්තෙකි. ළමයා කිසි විටෙක කුඩා මිනිසෙකු නොවන අතර ඔහු හෝ අැය කායිකව හා මානසිකව යැපෙන්නෙකි. එනම් සම්පූර්ණයෙන් අනුන් මත ජීවත් වන රැකවරණය හා සෞඛ්‍යය අවශ්‍යය විවිධ ජීඩාවනට ගොදුරු වීය හැකි තැනැත්තෙකි. එවැනි ළමයි මල් කැකුළු වැනිය. අවුරුදු 18 ට අඩු සෑම අයෙක්ම 'ළමයා' නම් වන බව ළමා ප්‍රඥප්තියේ සඳහන් වේ. යැයෙන මානසික තත්ත්වයේ සිට ස්වාධීන මානසිකත්වයට යාමට ගතවන කාලය 'ළමාවිය' නම් වේ. මිනිසාගේ ළමාවිය සෙවණැල්ලක් මෙන් ජීවිතය පුරා ක්‍රියාත්මක වෙයි. එහි ඇතැම් සිදුවීම් මිනිස් මනසට තදින් බලපෑම් කරයි. එහි ප්‍රතිඵලය වශයෙන් ඔහුගේ ජීවිතය යහපත් හෝ අයහපත් වීමට පසුකාලීනව බලපෑම් කරයි. 'අපයෝජනය' යනු වරදෙහි යෙදවීමයි. එනම් දරුවන් වෙනුවෙන සිදු කළ යුතු දේ නොකිරීමත, නොකළයුතු දේ සිදු කිරීමත් අපයෝජනය නම් වේ. කායිකව, මානසිකව, ලිංගිකව යනාදී තුන් ආකාරයෙන්ම අපයෝජනයට ළමයා දෛනිකව ගොදුරු වන බැවින් විනාශ වන්නේ මෙරට අනාගත පරපුරයි. මෙයට හොඳම උදාහරණය වන්නේ මෑතකදී අන්තර්ජාලය ඔස්සේ අලෙවි කළ බලා වයස්කාර දැරියට ලිංගික අපයෝජනය සිදු කිරීමේ ආන්දෝලාත්මක සිදුවීමයි.

ළමා අධිකාරියට ලැබෙන පැමිණිලි අනුව බහුල වශයෙන්ම අපයෝජනයට ගොදුරු වන්නේ යොවුන් වියේ පසුවන දරු දාරියන්ය. යොවුන් විය යනු වයස අවුරුදු 11- 18 අතර කාල සීමාව වේ. එය දරුවා වැඩිහිටියෙකු බවට පත්වන සංක්‍රාන්තික කාල සීමාවක් ලෙස සැළකේ. මෙහිදී ශාරීරික වෙනස්කම් සමඟ ඇතිවන මානසික තත්ත්වයන් හමුවේ බොහෝ දරුවෝ හුදකාර අරගලයක යෙදෙති. ඔවුහු කුතූහලය හා විරුද්ධ ලිංගික ආකර්ශනය මත අලුත් දෑ සොයා යාමත්, විවිධාකාර අත්දැකීම් සමාජය තුළින් ලබා ගැනීමටත් වෙහෙසෙති. තමා වැඩිහිටියෙකු ලෙස සිතීමට පෙළඹීම නිසා විවිධාකාර රැවටීම්වලට ගොදුරු වෙති. බොහෝ ළමා අපචාර සිදු වී ඇත්තේ සමීප පුද්ගලයෙන්ගෙන් වීම විශේෂත්වයකි. එනම් දරුවාගේ විශ්වාසය දිනාගත් තාත්තා, සීයා, බාපා, සුළුපියා, මාමා, මස්සිනා, සහෝදරයා යනාදී ඥාතීත්වයක් ඇති අයගෙන් මෙන්ම ඇසුරු කරන පුද්ගලයන් වන අසල්වැසියා, යහළුවා, ගුරුවරයා, විදුහල්පතිවරයා හා පූජ්‍ය පක්ෂය අතින්ද අපයෝජනයටත්, දූෂණයටත් ලක්වේ. එසේම යොවුන් දැරියන් ප්‍රේම සබඳතා පැවැත්වීම හේතුවෙන් තම සෙම්වතා අතින් දූෂණයට ලක් වේ. බොහෝ විට ළමයින් අපයෝජනයට ලක් කර ඇත්තේ රැවටීමෙන් හෝ බිය ගැන්වීමෙනි. වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකුගේ කැමැත්ත ඇතිව හෝ නැතිව කායිකව එක් වීම 'ස්ත්‍රී දූෂණයක්' ලෙස අර්ථ දක්වයි. ස්ත්‍රී දූෂණයක් නොවෙන වෙනත් ආකාරයේ ලිංගික අතවර ලිංගික අපයෝජන නම් වේ.

කුමුදු සංජීවනී පෙරේරා
සිංහල ඩිප්ලෝමාධාර, කොළඹ විශ්වවිද්‍යාලය

යම් අවාසනාවකට තම දරුවා අපයෝජනයට ගොදුරු වී ඇති බව මවුපියන්ට අවබෝධ කර ගත හැක්කේ දරුවාගේ අලුතු හැසිරීම් මතය. එනම් දරුවා එකවර නිහඬවීම, කලපනා බරිත වීම, නිවසේ සමාජිකයන් ඇසුරු කිරීමට අකමැති වීම, යමක් ප්‍රකාශ කිරීමට උත්සාහ කිරීම, හුදකලාවීම යනාදී චරයා ඉඟි තුළින් අවබෝධ කොටගත හැකිය. මෙහිදී ඔබ ඉතාමත් බුද්ධිමත් අයුරින් ප්‍රතිචාර දැක්විය යුතුය. කිසිවිටෙක නීතිය ඔබ අතට ගැනීම සිදු නොකළ යුතුය. ළඟම පොලිස් ස්ථානයට හෝ ළමා ආරක්ෂක අධිකාරියට එම අපයෝජනය වාර්තා කරන්න. එසේම මනෝ වෛද්‍ය උපදේශනද ලබා ගනන.

ළමාවියේ පටන් තම දරුවා බෙහෙවින් ආරක්ෂා කිරීම මවුපියන් සතු යුතුකමක් හා වගකීමක් වන්නේය. බොහෝ වැරදි සිදුවන්නෙ නොදැනුවත්කම හා නොසැලකිලිමත්කම හේතුවෙනි. තම 'අැස දෙකාමෙන්' දරුවා තමා සමීපයේ රඳවා ගනිමින් කල්පනාකාරීව රැක බලා ගත යුතුය. යොවුන් වියේ වෙසෙන දරුවා නුවණින් කල්පනා නොකර හැඟීම්වලට වහල් වී ක්‍රියා කරන බැවින් එම දරුවන් කෙරෙහි පූර්ණ විශ්වාසයක් තොතබා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. එසේම තම දරුවාට අධ්‍යාපනය පමණක් නොව සමාජ අවබෝධයක්ද මවුපියන් විසින් දරුවාට කියා දිය යුතුය. අනවශ්‍ය සංවේදී පුද්ගලයෙකු ලෙස දරුවා හැඩ නොගැස්වීම, දරුවා මුහුණ පෑමට සිදුවන හිංසනවලට එරෙහිව සටන් කිරීමට හුරුකිරීම, දරුවා ඇසුරු කරන පුද්ගලයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම, දරුවා සමඟ එදිනෙදා තොරතුරු හුවමාරු කර ගැනීම, නවීන තාක්ෂණය පිළිබඳ නිසි අවබෝධයකින් පසුවීම, කිසිවිටෙක අහසයන් ඉදිරියේ දරුවා තනි නොකිරීම යනාදී ආරක්ෂිත පියවර ගැනීමෙන් තම දරුවාට අපයෝජනයෙන් තොර සොඳුරු ළමා වියක් උරුම කර දීමට හැකි වනු ඇත. තම දරුවන්ට වඩාත් සුන්දර ළමාවියක් නිර්මාණය කරමින් ඔබ ලබන සතුට මෙලොව උත්තරීතරම සතුටයි.

මෙම වැරදිවලට බරපතළ වැඩ ඇතිව අඩුරුදු 20 දක්වා සිරගත කළ හැකිය. ලැජ්ජාව, බිය සහ ගෞරවය හේතුවෙන් ඇතැම් ළමා අපචාර නීතිය ඉදිරියට නොගොස් නිහඬව විඳ දරා ගැනීම කිසිසේත්ම යහපත් තත්ත්වයක් නොවේ. එය අපයෝජකයාට තව තවත් අපරාධ කිරීමට රුකුලක් වනු ඇත.

ඉඩ දෙන්න

මල් ඔසරි

නීල ගුවන් ගැබ
තරු මල් පිපුණු
මැදියම සීතල පින්නෙ
කන්දෙන් එබුණු පුර සඳ
මතක සිහින පොදි බැඳ
අතීතය ගොලු කර
උපන් කවි සිත මරා
ඉවුරු තරණය කළ
අකුරු කළ කුමරිය
සැඟව ඇති කෙම් බිමේ
මල් ඔසරි ඇඳ
සිඟිති මල් කැකුළු මැද
සරත් රූසිරි දසුන්
දකින්ට පිං නැති ද
වැසෙන්නට පෙර නෙත් පියන්

ලක්ෂ්මන් වසන්ත රුක්මාල්,
පිළියන්දල.

පන්සිල්

රට තුළ සැම වැඩ ඇරඹීමට පෙර
සැමදෙන පන්සිල් ගන්නවා නොපැකිල
එනමුදු පන්සිල් රැක්මන් නම් නැත
නිති රැක්මයි යුතු ගන්නා සිල්පද

සිරිතක් විලසින් වදනින් මුහුණා
ගත්ත සැණින් සිල් කඩනවා මිනිසා
එලෙසින් පන්සිල් ගත්තට සැමද
පව් මිස නැත පින් නිති දිවි උදෙසා

එබැවින් අපි නිසිලෙස පන්සිල් ගමු
එලෙසම පන්සිල් දිවි මෙන් සුරකිමු
බුදු සමිඳුන් පෙන්වූ දම් මගෙ යමු
මිණිකැටෙ මෙන් අපෙ දිවි බබළවා ගමු

කේ. ඩබ්ලිව්. සිරිසේන,
මාලබේ.

ආශිර්වාදය

වැටෙන පිණිබිඳු පිරිත් පැන් වී
දෙරණ මතුපිට පතිත වේවා
හමන මද නල සෙත් කව්ය වී
දස දිසාවට විසින් යේවා
සවස පායන සඳ කිරණ බෝ
හිමිගෙ සිසිලස රැගෙන යේවා
පැතිර ඇති රුදු වසංගතය බිය
තුණුරුවන් සරණින් නැසේවා
දිවි රෑ නොබලා වෙසෙන සුව
විරුවන්
මනුසත් දනගෙ පණ නළ

සුරසන දෙවියන්
පිං වත් දෑත් එක්කර
කරනා උවටැන්
දෙවිරුක වරණ දෙයි
සලමින් විජිනි පතින්
සමුදුර ගහන මිහිමත
විකුමන් පාමින්
සුවහස් දනන් ගේ දුක්
කඳුළැලි පිසිමින්
උරදෙන සැම දෙයට
එක්කර ගති පාමින්
දැල්වෙයි දේවතා
එළි තුන්යම
රකිමින්
නොයනා ගමන් යන
ලක් මවගේ දරුවන්
අවනත වෙන්න වෙයි
ලෝ දහමට නිතැතින්
දැවෙන හදින් පතනා
අවසන් පැතුමන්
ඔබ සැම සැනසෙන්න
අජරාමර නිවනින්

ආර්.පී.ජේ. ධර්මා
ගල්කිස්ස.

වියපත්වූදා...

වැහිබිඳු පෝළිමෙ ගලා විත්
තෙමයි මිහිකත සනසවා
කඳුළු බිඳු නෙත යටින් ගලාවිත්
වැළ පෙයි හදවත ඉකිගසා
සෙනෙහෙදුන් ඇය මටත්
නොකියා මනෝ පෙනෙන
ලොවකට පියඹලා
ගෙවුණු මං පෙත් සිහිකරන්නෙමි
නුඹෙන් පණිවුඩේ එනතුරා

සිතත් ගොළු වූ පාළු පැල තුළ
අසම් බණ පද ගොම්මනේ
වෙහෙස වූ ගත සන
සවන්නට බුදු හිමි දෙසු
දම් සවනේ රැඳේ
සවිය ඇති ගත සිතත්
ඇති විට මිරිකුණු ජීවන
අම්ඹරේ
සිහි කරමින් අද නිවන
සොයනු හැර කුමක් කරමිද
වියපත් වූ දිනේ

පුතා ඉදුණු එද පැල්පත
සතුටකින් බර ඉතිරුණා
නුඹත් අම්මා කෙනෙක්
විලසින් ලොවේ උත්තම
පදවි දැරුවා
මගේ දුක සැප බලා සෙනෙහෙන්
පතිනිදැහමත් සුරෙකුවා
ලොවේ උත්තම බිරිඳ වූ නුඹ
දෙවිලොවේ ඇත මා එනතුරා

හේනෙපැල්පත සීත මැදියම
හදේ උන්නෙත් නුඹයි පැටියයි
කුරක්කන්මල් පොකුරු පිපුනෙත්
පැලේ ගින්දර දැනී වාගෙයි
නුඹට හිමි ලෙස පුතුට පිය ලෙස
සීලෙ රැක්කා සත්තකයි
ලොවේ දහමත් ඇත්ත වේනම්
මටත් දෙවිලොව අසුන්වෙන්
වෙයි

ටී.ජී. රන්තරු ජයමාල්,
කැලණිය විශ්වවිද්‍යාලය.

දිසාපාමොක්

දිසාපාමොක් පරපුරින් ආ
උතුම් ගුරුවරු කොයි ගියාදෝ
සිය කුසින් වැදූ දරුවනට මෙන්
සිල්ප කිරි දුන් මවු කොහේදෝ

සුව පහසුකම් නැත ද කිසිවක්
සිල්ප ඥනය නොදුනි දෝ
වැටුප් නැතිවත් උගන්වපු හැටි
නුඹට අද අමතක වුණා දෝ

පොරණ ඇදුරන් සුර ගුරුන් වැනි
මෙලොව අත හැර ගියා දෝ
සෙනහසින් ඇකයෙහි තබාගෙන
අකුරු කළ හැටි මතක දෝ

මාවතේ මැද සිහි විකල් වී
වද විඳින්නේ කුමට දෝ
අපේ දරු පරපුර නසන්න ද
උනගෙ සිප් උරුමය නොදී

සඳුට දෙවැනිව රැය එළිය දුන්
ගුරු තරුව අද කොයිබ දෝ
කළු වලාවක පැටලිලා ගොස්
රුදුරු අඳුරට හසු වුණා දෝ

රටට වැඩ ඇති දැයට හිත ඇති
දූ පුතුන් සැදුමට නොබා
තනතුරේ ඇති ගරු සරුව නිති
රැකිය යුතු සිහියෙහි තබා

පී. කරුණා පෙරේරා,
කොළඹ.

කොරෝනා පාලනයට පුරවැසි වගකීම ඉටුකරමු

මිනිස් ජීවිත විශාල වශයෙන් අහිමි වූ කාල වකවානුවක් ලෙස දෙවැනි ලෝක යුද සමය නම් කල හැකියි. මේ කාල වකවානුවෙන් පසු රටවල් තුළ යුද්මය තත්ත්වය පැවතුණ දෙවන ලෝක යුද්ධයට සාපේක්ෂව මිනිස් ජීවිත අහිමි වීම සිදු වූයේ නැත. එහෙත් දෙවසරක් පමණ ලෝකය ම වෙළා පැතිරෙන වසංගතයක් ලෙස කොරෝනා හැඳින්විය හැකි අතර දෙවැනි ලෝක යුද සමයේ අහිමි වූ මිනිස් ජීවිතවලට සමානව මෙම වසංගතයට වී ගොදුරුව නිහඬවම ජීවිත බිලිගෙන ඇත.

ගසක වැඩෙන පිළිලයකට නිසි ප්‍රතිකාර නොකළහොත් මුළු ගස පුරාම එය වර්ධනය වීයයි. එයින් තවත් ගස්වලටත් බෝ වීම සිදු වේ. කොරෝනා වසංගයත් පැමිණි මුල් කාලයේ නිසි පාලනයක් සිදු කළක් එය දිගටම පවත්වා ගෙන නොයාම නිසා මේ වන විට එහි බිහිසුණුකම වැඩි වෙමින් දරුණු ප්‍රතිඵල අත්කර දෙමින් පවති.

ලංකාව ගත් කල කොරෝනා මුල් රැලි සාර්ථක ලෙස පාලනය කර රටවල් අතරින් ඉදිරියෙහම සිටි රටකි. එයට ප්‍රධාන හේතුවක් ලෙස මෙරට පවතින සෞඛ්‍ය දේශගුණය ආහාර රටා බලපෑවේය. මිනිසා යන සත්ත්වයාට සියල්ල ඉක්මනින් අමතක වන සුළුය. මුල් රැලි යහපත්ව පාලනය කල නිසා ඉතා ඉක්මනින් සෞඛ්‍ය පිළිවෙත් අමතක වී තම තමන්ට රිසි සේ කටයුතු කරන්නට වුයෙන් එහි ප්‍රතිඵල මේ වන විට භුක්ති විඳිමින් සිටිති. පළමු කොරෝනා සමයේ මිනිස් ජීවිත 5- 6 ක් දවසකට අහිමි වුවද මේ වන විට එය 200 සීමාව ආසන්නයට පැමිණ තිබේ.

මධුෂාණී ජයසූරිය
කැලණිය විශ්ව විද්‍යාලය

මෙම වසංගතය සමඟ සටන් කිරීමට රටේ ජනපති මැති ඇමතිවරු, ආරක්ෂක අංශ, සෞඛ්‍ය අංශ යනාදීන්ට පමණක් කනිව කළ හැකි කාර්යයක් නොවේ. රටක සංවර්ධනයට 80% කම දායකත්වය ජනතාවගෙන් ලැබිය යුතු සේම මෙම මාරයා විනාශ කිරීමටත් ජනතා සහාය ඉතාම වැදගත්ය.

මේ දින වන පැතිර යන දරුණුම කොරෝනා ප්‍රභේදයේ තතු එයින් වන හානිය එයින් ආරක්ෂා වන ආකාරය සෞඛ්‍ය අංශ මාධ්‍ය හරහා කොතරම් දැනුම්වත් කළද තවමත මෙහි දරුණුබව අවබෝධ කර නොගත් මිනිස්සු සිටිති. පළමුව ඔබ ඔබ ගැන සිතන්න ඔබට මෙම රෝගය වැළඳුණ හොත් එයින් ඔබගේ මවුපියන් දරුවන් අසල්වාසීන් යනාදි සියල්ලටම බෝ වනවා නොවේද? සෑම විටම ඔබ රෝග වාහකයෙක් නොවීමට වගා බලා ගන්න. නිවැරැදි සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් අනුගමනය කරන්න. වෛද්‍යවරයා හෙදිය, ආරක්ෂක අංශ ඔවුන්ගේ ජීවිත ගැනවත් නොසිතා ඔබ අප වෙනුවෙන් කරන කැපකිරීමට අප අපගේ උපරිම සහයෝගය ලබා දිය යුතු නොවන්නේද?.



අපගේ අසල්වැසි රට වන ඉන්දියාව එකම කඳුළු ගංගාවක් වී අමු සොහොනක බවට පත් වී හමාරය. එවන් බේදනීය තත්ත්වයකට මෙරටත් පත් වීමට ඉඩ නොදෙමු.

කොරෝනා මාරයා මෙරටින් තුරන් කිරීමට නිවැරැදි සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කර තමන්ගෙ වගකීමට එහා ගිය වගවීමක් ඉටු කරමු.